# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

(2018 සිට ක්‍රියාත්මක වේ)

# 9 ශ්‍රේණිය




සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.lk

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

## 9 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ)

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

9 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : .........................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| වාර නියමය | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxxiv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-95 |

## අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි. නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද සුභාවිතයන් මගින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මගින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළපොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළපොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළපොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :**
ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය :**
පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි,
කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය විශේෂඥ උපදෙස් :**
මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**අධීක්ෂණය :**
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම,
අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය :**
පූජ්‍ය කුකුරම්පොල ඥාණවිමල හිමි,
කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

එම්. ජී. මුණසිංහ,
කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

මංගල ගුණරත්න,
කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**බාහිර ලේඛක මණ්ඩලය :**
එස්. ඕ. ප්‍රනාන්දු,
විශ්‍රාමික අධ්‍යක්ෂ, ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම,
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය.

ඩබ්ලිව්. කරුණාරත්න,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරු, ගිරාගම.

වයි. පී. ලක්මිණි, විදුහල්පති සේවය,
බප/හෝ/සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලය, පාදුක්ක.

යූ. ජී. ආනන්ද අබේවික්‍රම, ගුරු සේවය,
මා/ලැලි අඹේ මහා විද්‍යාලය, මාතලේ.

**භාෂා සංස්කරණය :**
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම්වලට අනුව පාඩම් සැලසුම් සකස් කර ගැනීම ඵලදායී වේ යැයි අපේක්ෂා කෙරේ.

දැනට පාසල් පද්ධතිය තුළ නිපුණතා පාදක විෂයමාලාවක් ක්‍රියාත්මක වේ. මෙහි ඇතුළත් සියලු පාඩම් සැලසුම් ඉදිරිපත් කර ඇත්තේ ඊට අනුරූප වන පරිදි ය. නිපුණතාව, නිපුණතා මට්ටම හා විෂය අන්තර්ගතයට අදාළ කාලච්ඡේද සංඛ්‍යාව හා ඉගෙනුම් පල ද ඒ අනුව ඇතුළත් කර තිබේ. පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ද, භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් ද, ඇගයීම හා තක්සේරුකරණය සඳහා වන උපදෙස් ද ඉදිරිපත් කර ඇත්තේ නිපුණතා සංවර්ධනය සඳහා ඉවහල් වන පරිද්දෙනි. ශ්‍රේණියට අදාළ විෂය අන්තර්ගතය ඒ ඒ වාරවලට අනුව බෙදා දක්වන ලද සටහනක් ද මේ සමග ඉදිරිපත් කර ඇත්තේ ගුරු භවතාගේ පහසුව පිණිස ය.

ගුරු මාර්ගෝපදේශයෙහි උපදෙස් අනුව එදිනෙදා ඉගැන්වීම් කාර්යය සඳහා උචිත පාඩම් සැලසුම් ගුරුභවතාගේ අභිමතය පරිදි සකස් කර ගත යුතු ය. මෙහි දී ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය වන පරිදි හා නිපුණතා සාක්ෂාත් වන පරිදි නිර්මාණශීලී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථ සම්පන්න බවට පත් කිරීම ඔබගේ යුතුකම වන්නේ ය. ගුණාත්මක යෙදවුම් යටතේ ගුරුවරයාට පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇති පොතපත ඉවහල් කර ගෙන ශිෂ්‍ය ඉගෙනුම් අත්දැකීම් තව දුරටත් පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම ද වැදගත් වනු ඇත. ඔබට විවිධ ගුරු භූමිකා හෝ විවිධ ක්‍රමවේද හෝ භාවිත කළ හැකි ය. එහෙත් අර්ථසම්පන්න ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය තුළ නිර්මාණය කිරීම ඔබගේ කාර්යයයි.

මෙම ගුරු මාර්ගෝපදේශයෙහි එක ම නිපුණතා මට්ටම් පාඩම් කිහිපයකට සම්බන්ධ වන අවස්ථා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී ඔබ ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් එම නිපුණතා මට්ටම් ශිෂ්‍යයන්ට අත්පත් කර දීමට යොමු විය යුතු ය. මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පාසල් පාදක ඇගයීම කෙරෙහි ඔබගේ අවධානය යොමු විය යුතු ය. පාසල් පාදක ඇගයීම ක්‍රියාත්මක කිරීම සඳහා 2013 වර්ෂයේ දී මුද්‍රණය කර බෙදා හරින ලද පාසල පදනම් කරගත් ඇගයීම් සඳහා නිදර්ශක ඇගයීම් උපකරණ සංග්‍රහ (6 - 9 ශ්‍රේණි) යොදා ගත හැකි ය.

ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී කුසලතා වර්ධනය සඳහා කටයුතු කිරීමේ දී මෙහි සඳහන් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ නිර්දේශ කර ඇති දේශන, වාද විවාද, සාකච්ඡා ආදිය ද අවස්ථානුකූල ව යොදා ගත හැකි ය. ඉගෙනුම් ක්‍රියාවලිය තාක්ෂණය හා බද්ධ කර ගැනීම කාලෝචිත වනු ඇත. එනිසා හැකි සෑම අවස්ථාවක දී ම එවැනි තාක්ෂණික ඉගෙනුම් ආධාරක හෝ මෙවලම් හෝ භාවිත කිරීම මගින් ඔබගේ ඉගැන්වීම් කාර්යයෙහි ගුණාත්මක බව වර්ධනය කර ගත හැකි ය. සෑම පාඩම් සැලසුමක් අවසානයේ දී ම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් ඉදිරිපත් කර ඇත. එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් ඉගෙනුම් කාර්යය සඵල කර ගැනීමට මෙන් ම ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට ද හැකි වනු ඇත. භාෂා විෂයයේ වැදගත් ක්ෂේත්‍ර වන ශ්‍රවණ හා කථන කුසලතා මැනෙන පරිදි වාචික පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ද භාෂා අධ්‍යයනය වඩාත් ඵලදායි වීමට හේතු වනු ඇත.

මෙම මාර්ගෝපදේශයෙහි අන්තර්ගත උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයන්ට උචිත පරිදි නිර්මාණශීලී ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට අවකාශ සලසා ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමෙන් ඔබගේ ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යනු අපගේ ප්‍රාර්ථනයයි.

**ව්‍යාපෘති නායක**

# වාර නියමය

| වාරය | පෙළ පොතේ පා. අං. | ගුරු මා. ක්‍රි. අං. | නි. ම. | විෂය අන්තර්ගතය පෙළපොත සඳහා මාර්ගෝපදේශය<br>පෙළ (පාඩම්) | ක්‍රියාකාරකම් | ඡේද |
|---|---|---|---|---|---|---|
| 1 | 01 | 01 | 1.1 | ශ්‍රී පාදය වැන්ද වූ හැටි | | 03 |
| | | 02 | 5.2 | | ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ, රූඪී | 02 |
| | 02 | 03 | 1.3 | වෙස්සන්තර ජාතක කාව්‍යය | | 04 |
| | | 04 | 5.1 | | සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද | 03 |
| | 03 | 05 | 1.5 | පණීහාරත | | 03 |
| | | 06 | 5.2 | | යුගල පද | 02 |
| | | 07 | 1.7 | | බහුවිධ මාධ්‍ය | 03 |
| | 04 | 08 | 2.3 | ස්ටෆන් හෝව්කින්ග් (Stephen Hawking) | | 03 |
| | | 09 | 3.1 | | ව්‍යංජනාක්ෂර වර්ග කිරීම | 03 |
| | 05 | 10 | 2.1 | නිවැරදි ශබ්දෝච්චාරණය | | 03 |
| | | 11 | 4.1 | | විරාම ලකුණු භාවිතය | 03 |
| | 06 | 12 | 9.3 | දේශාභිමානී සාහිත්‍ය නිර්මාණ | | 04 |
| | | 13 | 8.1 | | මාතෘකානුකූල රචනා | 04 |
| | 07 | 14 | 11.2 | දැසේ නිල් පැහැය (පද්‍ය) | | 04 |
| | | 15 | 5.1 | | විශේෂණ පද | 02 |
| | | 16 | 12.1 | | පද්‍ය නිර්මාණය කිරීම | 04 |
| 2 | 08 | 17 | 2.1 | නිවැරදි ශබ්දෝච්චාරණය (ගද්‍ය) | | 02 |
| | | 18 | 3.3 | | ණ,න,ල,ළ,ශ,ෂ,ස අක්ෂර වින්‍යාසය | 03 |
| | 09 | 19 | 2.2 | පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ | ස්වභාවෝක්ති අතිශයෝක්ති | 03 |
| | | 20 | 3.2 | | අකාරාදි පිළිවෙළ (ශබ්දකෝෂ භාවිතය) | 03 |
| | 10 | 21 | 7.1 | ප්‍රායෝගික ලේඛන (ව්‍යාපාරික ලිපි) | | 03 |
| | | 22 | 7.2 | | ආරාධනා පත්‍ර හා ආකෘති පත්‍ර | 03 |
| | 11 | 23 | 5.3 | ධීවර භාෂාව | | 03 |
| | | 24 | 6.1 | | උක්ත අනුක්ත රූප | 04 |
| | | 25 | 1.2 | | සංවාද (විවිධ ආයතන නිලධාරීන් සමග) | 02 |
| | 12 | 26 | 10.1 | කුමාරතුංග මුනිදාස | | 03 |
| | | 27 | 6.4 | | වාක්‍ය රීති | 04 |
| | 13 | 28 | 9.5 | ආනන්ද කුමාරස්වාමි | | 03 |
| | | 29 | 1.6 | | මාතෘකානුකූල කතා | 03 |
| | | 30 | 6.4 | | කර්තෘ කාරක කර්ම කාරක වාක්‍ය | 03 |
| | 14 | 31 | 10.3 | ළමා සාහිත්‍ය නිර්මාණ | | 04 |
| | | 32 | 5.1 | | තනි පද, බහු අර්ථ | 04 |
| | | 33 | 1.4 | | සවන්දීම | 02 |
| 3 | 15 | 34 | 9.1 | කඨින පූජෝත්සවය | | 03 |
| | | 35 | 6.2 | | ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා | 03 |
| | 16 | 36 | 9.4 | 'සිරම්බි අඩිය' ජනයා | | 04 |
| | | 37 | 8.3 | | සාරාංශකරණය | 03 |
| | 17 | 38 | 11.1 | දිවිහ දාන (කෙටිකතාව) | | 04 |
| | | 39 | 12.2 | | කෙටිකතා ප්‍රබන්ධ කිරීම | 04 |
| | 18 | 40 | 10.2 | අභ්‍යවකාශ ගවේෂණය | | 03 |
| | | 41 | 8.2 | | බිත්ති පුවත්පත් හා සඟරා ලිපි ලිවීම | 03 |
| | 19 | 42 | 9.2 | සාරධර්ම, සාහිත්‍යය පිළිබඳ ලිපියක් | | 04 |
| | | 43 | 6.3 | | අව්‍යපද (නිපාත) | 03 |
| | | 44 | 4.2 | | වචන වෙන් කිරීම | 03 |
| | 20 | 45 | 11.3 | සාහිත්‍ය විචාරය පිළිබඳ ලිපියක් | | 04 |
| | 21 | 46 | 11.1 | මහාසාර නාට්‍ය පිටපත (කොටසක්) | | 03 |
| | | 47 | 12.3 | | කෙටි නාට්‍ය රචනය | 04 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 9 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk

**විෂය නිර්දේශ කමිටුව**

**විෂය විශේෂඥ සහාය**

මහාචාර්ය තිස්ස ජයවර්ධන කොළඹ විශ්වවිද්‍යාලය (විශ්‍රාමික)
මහාචාර්ය රත්නසිරි අරංගල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

මංගල ගුණරත්න, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එස්. ඕ. ප්‍රනාන්දු මහතා, අධ්‍යක්ෂ (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

පතිරාජ රත්නායක, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල

ගයා වැයිහේන, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම

සුනිල් බියන්විල, ගුරුසේවය, ගිරි/වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල.

වාසනා පයාගල, ගුරු සේවය, කො/ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ 08.

# පටුන


| | පිටු අංක |
|---|---|
| හැඳින්වීම | i |
| ජාතික පොදු අරමුණු | ii |
| මූලික නිපුණතා | iii - iv |
| විෂය අරමුණු | v |
| ජාතික පොදු අරමුණු හා විෂය අරමුණු අතර සම්බන්ධතාව | iv |
| විෂය නිර්දේශය | 1-15 |
| පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය | 16 |
| තක්සේරුකරණය | 17 |

## හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්යභාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තුළ වැඩෙමින් විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂයය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයකි.



නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කර ගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

මීට ප්‍රථම ක්‍රියාත්මක වූ විෂය නිර්දේශයෙහි ශ්‍රවණය සහ කථනය සඳහා නිපුණතා දෙකක් ගොඩනගා තිබුණ ද මෙම විෂය නිර්දේශයෙහි එම නිපුණතා දෙක එක් නිපුණතාවක් වශයෙන් ගොඩ නගා ඇත. 9 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා බහුවිධ මාධ්‍ය භාවිතය (Multi model texts) ඇසුරෙන් පරිගණක තාක්ෂණය ආදි විවිධ ක්‍රම උපයෝගී කර ගෙන අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දී තිබේ. භාෂාව භාවිත කරමින් ප්‍රායෝගික ව්‍යවහාරයට යොමු කර ඇති අතර ඒ සඳහා උගත් දේ නැවත නැවත මතක් කර ගනිමින් භාෂාව භාවිතයට යොමු කිරීම සඳහා විෂය නිර්දේශය තුළ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත.

**ජාතික පොදු අරමුණු**

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහ හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

**මූලික නිපුණතා**

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම



තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| ජෛව පරිසරය | : | සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව |

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

**විෂය අරමුණු**

1. චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

2. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම.

3. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.

4. විශ්වවිශ්‍රැත සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

5. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම.



6. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කරගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.

07. සාහිත්‍යයේ පදනම වන භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

## ජාතික පොදු නිපුණතා හා විෂය අරමුණු අතර සම්බන්ධතාව

| | විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 1. | චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම. | ✓ | | | | | ✓ | ✓ | |
| 2. | නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම. | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | |
| 3. | සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලි හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම. | | | ✓ | ✓ | ✓ | ✓ | | |
| 4. | විශ්වවිශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම. | | | | ✓ | ✓ | | ✓ | ✓ |
| 5. | සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම. | | | | | ✓ | ✓ | ✓ | ✓ |
| 6. | සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 7. | සාහිත්‍යයේ පදනම වන භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම. | | | | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.1 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | • සවන් දී ප්‍රතිචාර දැක්වීම.<br>ජන කතාවක්<br>ශ්‍රී පාදය වැන්ද වූ හැටි<br>(මග දිගට ජනකතා<br>ඩී. පී. වික්‍රමසිංහ) | • ජන කතාවලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>• අවධානයෙන් යුතු ව සවන් දී රසාස්වාදයේ යෙදෙයි.<br>• ජන කතාව සඳහා යොදා ගත් භාෂාව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• සිද්ධි හා අවස්ථා වටහා ගනිමින් ජන කතා අගය කරයි. | 3 |
| | 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි. | • විවිධ ආයතන නිලධාරීන් සමග කෙරෙන කතාබහ<br>- සේවා සපයන ආයතන<br>(දූරකථන සේවා,<br>කෘෂි උපදේශන සේවා) | • සන්නිවේදනයේ දී සංයමයෙන් යුතු ව සවන් දීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ආචාරශීලී ව කථනයේ යෙදෙයි.<br>• පැහැදිලි ලෙස අදහස් ප්‍රකාශ කරමින් සන්නිවේදනයේ යෙදෙයි. | 2 |
| | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | • වෙස්සන්තර ජාතක කාව්‍යය<br><br>(තෝරා ගත් පද්‍ය (8) 526,527, 528, 529, 530, 531, 532, 541 | • කවි පෙළට සවන් දී තාලානුකූල ව ගායනා කරයි.<br>• කවි පෙළෙහි අන්තර්ගත කාව්‍යෝක්ති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• කවි පෙළෙහි රස ජනනය වන ආකාරය පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට කවි පෙළ රසාස්වාදයේ යෙදෙයි.<br>• සාහිත්‍ය නිර්මාණ රස විඳියි. | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | ● කාලීන ගුවන් විදුලි හා රූපවාහිනි වැඩ සටහන්<br>-ගුවන් විදුලි සංවාද/සාකච්ඡා | ● ගුවන් විදුලි වැඩ සටහනෙහි ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>● සවන්දීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>● සවන් දී අවශ්‍ය තොරතුරු රැස්කර ගනියි.<br>● රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත ව යොදා ගනියි. | 2 |
| | 1.5 දේශන, සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි | ● විද්වත් දේශන<br>- සුප්‍රකට කලාකරුවන් පිළිබඳ දේශන (පණීභාරත) | ● දේශනයකට සාවධානව සවන් දීමේ අගය පැහැදිලි කරයි.<br>● දේශනයකට සවන් දී එහි වැදගත් කරුණු මතකයෙන් ඉදිරිපත් කරයි.<br>● දේශනයෙහි අන්තර්ගත කරුණු පිළිබඳ විචාරශීලී ව අදහස් ප්‍රකාශ කරයි. | 2 |
| | 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | ● මාතෘකානුකූල කතා<br>-ක්ෂණික කථා<br>● නිවේදන ඉදිරිපත් කිරීම | ● ක්ෂණික කතාවක තිබිය යුතු ලක්ෂණ පැහැදිලි කරයි.<br>● නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.<br>● අසන්නන්ගේ අවධානය යොමු වන පරිදි කතා කරයි.<br>● ස්වාධීන කථන ශෛලියක් ප්‍රදර්ශනය කරයි. | 2 |
| | 1.7 බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | ●ඉදිරිපත් කිරීම සඳහා විවිධ මාධ්‍ය භාවිතය<br>- කථනය සහිත බහුවිධ මාධ්‍ය<br>- ප්‍රක්ෂේපණ භාවිතය<br>- පවර් පොයින්ට් සමර්පණ (Presantation)<br>- භූමිකා රංගන | ● බහුවිධ මාධ්‍ය හඳුනා ගෙන නම් කරයි.<br>● බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් තොරතුරු ඉදිරිපත් කිරීමේ වැදගත්කම විස්තර කරයි.<br>● බහුවිධ මාධ්‍ය භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>● බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් කරුණු ඉදිරිපත් කරයි. | 2 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | ● ශාස්ත්‍රීය ලිපියක්<br>අපේ සංස්කෘතික උරුමය (14, 15පිටු මධ්‍යම සංස්කෘතික අරමුදල)<br>● නිවැරදි ශබ්දෝච්චාරණය සහ හඬ පාලනය<br>-ශ්ලෝක<br>-ගාථා<br>-ගුවන් විදුලි ප්‍රවෘත්ති | ● කියවීමේ දී නිවැරදි උච්චාරණයේ හා හඬ පාලනයේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>● ලේඛනවල විවිධත්වය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කියවයි.<br>● අසන්නාගේ අවධානය ලබා ගත හැකි වන සේ කියවයි.<br>● අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවීමේ අගය ප්‍රකාශ කරයි. | 5 |
| | 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි. | ● පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ<br>- නානච්ඡන්ද ජාතකය /සද්ධර්ම රත්නාවලිය මහ ධන සිටුපුත් වත<br>● නිවැරදි උච්චාරණය සඳහා ක්‍රියාකාරකම්<br>-අතිශයෝක්තිය, ස්වභාවෝක්තිය | ● පොතපත කියවීමේ දී භාවිත වන විවිධ ශෛලි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● විවිධ ශෛලි රස ජනනයට හේතු වන බව පැහැදිලි කරයි.<br>● විවිධ ශෛලිවලට අනුගත වෙමින් කියවයි.<br>● කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 4 |
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ-කරගත් කරුණු ඉදිරිපත් කරයි. | ● විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධව පළ කළ අදහස් දැක්වෙන ලිපියක්<br>- ස්ටෆන් හොව්කින්ග් (Stephen Hawking) | ● නිශ්ශබ්ද ව කියවා අන්තර්ගතය අවබෝධ කර ගෙන පැහැදිලි කරයි.<br>● නිශ්ශබ්ද ව කියවීමෙන් ලබාගත් දැනුම ප්‍රායෝගික ව භාවිත කරයි.<br>● විෂයානුබද්ධ ලේඛන නිශ්ශබ්ද ව කියවා කරුණු ගොනු කරයි.<br>● නිශ්ශබ්ද ව කියවීමේ අගය පැහැදිලි කරයි. | 3 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0<br>සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | • උත්පත්ති ස්ථාන අනුව ව්‍යඤ්ජනාක්ෂර වර්ග කිරීම. (සරල ව)<br>- කණ්ඨජ, තාලුජ, දන්තජ, මූර්ධජ, ඕෂ්ඨජ දන්තෝෂ්ඨජ (අක්ෂර) උත්පත්ති ස්ථාන අනුව වර්ග කිරීම (සරල ව)<br>භාෂා ශබ්ද මුඛයේ විවිධ ස්ථානවලින් ඉපදීම<br>ඒ ඒ ස්ථානය අනුව භාෂා ශබ්ද ජනිත වීම | • සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• සිංහල අක්ෂර මාලාවේ ප්‍රභේද වර්ග කර දක්වයි.<br>• භාෂාවේ ශබ්ද සංකේත උපදින ස්ථාන හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• සිංහල අක්ෂර මාලාවේ ප්‍රභේද වර්ග කර දක්වයි. | 3 |
| | 3.2 ප්‍රායෝගික භාෂා කාර්ය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි. | • ශබ්දකෝෂ භාවිතය අකාරාදි පිළිවෙළට වචන සකස් කිරීම (ක්‍රියාකාරකම්)<br>- ශබ්දකෝෂ භාවිතය<br>- නාමාවලිය සකස් කිරීම පිළිබඳ මූලික හැඳින්වීමක් | • සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.<br>• අකාරාදි පිළිවෙළ යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අකාරාදි පිළිවෙල නිවැරදි ව භාවිත කරමින් නාමාවලි සකස් කරයි.<br>• ශබ්දකෝෂ භාවිතයේ දී ආකාරාදිය පිළිබඳ දැනුම ප්‍රායෝගික ව භාවිත කරයි. | 3 |
| | 3.3<br>නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුක්ත ව ලියයි. | • ණ, න, ල, ළ, ශ, ෂ, ස සම්බන්ධ මූලික රීති හා භාවිතය(සිංහල ලේඛන රීතිය ඇසුරින්) | • ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අක්ෂර වින්‍යාස රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• අක්ෂර වින්‍යාසය පිළිබඳ ලබා ගත් දැනුම භාවිත කරමින් ලේඛන නිවැරදි කරයි.<br>• නිවැරදි ව ලේඛන කාර්යයෙහි යෙදෙයි. | 4 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0<br>ශිල්පීය ප්‍රයෝග ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1<br>විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | • විරාම ලක්ෂණ භාවිත කර ලේඛන නිවැරදි කිරීම (ක්‍රියාකාරකම්)<br>• විරාම ලකුණු භාවිතය (ක්‍රියාකාරකම්)<br>6 - 8 ශ්‍රේණි දක්වා ඇති පාඩම් ඇසුරෙන් කෙටි හැඳින්වීමක් හා අභ්‍යාස (ක්‍රියාකාරකම්) | • විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.<br>• භාෂා භාවිතයේ දී විරාම ලකුණු යෙදීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• අදහස් ප්‍රකාශ කිරීම සඳහා විරාම ලකුණු යෙදීමේ වැදගත්කම අවධාරණය පැහැදිලි කරයි.<br>• විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයෙහි යෙදෙයි. | 3 |
| | 4.2<br>වචන වෙන් කිරීමේ හා එක් කිරීමේ රීති අනුගමනය කරමින් ලියයි. | • 'ත්' පෙර පදය හා එක් ව යෙදේ.<br>• විධි ක්‍රියාවේ 'යෙදෙන 'ව' සහ 'වු' ද ප්‍රාර්ථනාර්ථවත් ක්‍රියාවේ දී යෙදෙන 'වා' යන්න ද ප්‍රයෝජ්‍යාර්ථවත් ව, වී, වූ ද පෙර පදයට එකතු කර ලිවිය යුතු ය.<br>උදාහරණ :<br>ඔහුත්, මමත්<br>කරව, බලව<br>කරවු, බලවු<br>සුවපත් වේවා<br>කරවයි, කරවීය<br>මෙහෙයවූ<br>දැක්වූ | • වචන වෙන් කිරීමේ හා එක් කිරීමේ සම්මත ක්‍රම හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නාම පදයක් සමග යෙදෙන ''ත්'' එක් ව ලිවිය යුතු බව ප්‍රකාශ කරයි.<br>• විධි ක්‍රියාවේ 'ව' හා 'වු' ද ප්‍රාර්ථනවාචී ක්‍රියාවේ දී 'වා' ද ප්‍රයෝජ්‍යාර්ථයේදී ව' 'වී', 'වූ', ද පෙර පදයට එක් කර ලිවිය යුතු බව පැහැදිලි කරයි.<br>• ලේඛනයේ දී නිවැරදි ව වචන වෙන් කර ලියයි. | 3 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0<br>භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 5.1<br>වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | • සමානාර්ථ පද<br>• විරුද්ධාර්ථ පද<br>• තනි පද<br>• විශේෂණ පද<br>• බහ්වර්ථ පද<br>(ක්‍රියාකාරකම්) | • භාෂාවේ භාවිත වන විවිධ පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• වාක්කෝෂය පෝෂණය සඳහා විවිධ පද වර්ග පිළිබඳ දැනුම ඉවහල් වන බව ප්‍රකාශ කරයි.<br>• විවිධ පද අර්ථවත් ව හා අවස්ථෝචිත ව භාවිත කරයි. | 9 |
| | 5.2<br>සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. | • ප්‍රස්තාව පිරුළු<br>- රූඪී, (ඉඟි වැකි)<br>- යුගල පද<br>- ආප්තෝපදේශ<br>- (ක්‍රියාකාරකම්) | • යුගල පද භාෂාවේ යෙදෙන සාම්ප්‍රදායික යෙදුම් විශේෂත්වයක් බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• යුගල පද වලින් සාම්ප්‍රදායික යෙදුම්වලින් භාෂාව පෝෂණය වන ආකාරය පැහැදිලි කරයි.<br>• යුගල පද යොදා ගනිමින් භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරයි.<br>• යුගල පද ව්‍යක්ත ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි. | 4 |
| | 5.3<br>භාෂා ව්‍යවහාරයේ සමාජීය විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • පරිමිත භාෂා ව්‍යවහාර<br>-ධීවර භාෂාව | • විවිධ වෘත්ති හා බැඳුණු භාෂා ව්‍යවහාර පවතින බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• භාෂා ව්‍යවහාරය මගින් විවිධ වෘත්තීන්හි අනන්‍යතාව පළ කරන බව ප්‍රකාශ කරයි.<br>• ධීවර භාෂා ව්‍යවහාරය පිළිබඳ දැනුම සන්නිවේදන කාර්ය සකස් කර ගැනීම සඳහා යොදා ගනී. | 3 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0<br>සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1<br>නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි. | ● උක්ත, අනුක්ත රූප (ක්‍රියාකාරකම්)<br><br>- සචේතන බහුවචන නාම පද<br>- සචේතන අනියමාර්ථ ඒක වචන නාම පද<br>- සචේතන සර්ව නාම පද<br>- සචේතන රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද | ● නාම පදවල උක්ත, අනුක්ත රූප හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● උක්ත, අනුක්ත වශයෙන් නාම පද ලැයිස්තු ගත කරයි.<br>● භාෂා කාර්යයේ දී උක්ත අනුක්ත රූප නිවැරදි ව යොදයි. | 4 |
| | 6.2<br>ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | ● ප්‍රයෝජ්‍ය ක්‍රියා<br>● අසම්භාව්‍ය ක්‍රියා | ● ක්‍රියා පද හා එහි ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ප්‍රයෝජ්‍ය ක්‍රියා හා අසම්භාව්‍ය ක්‍රියා හඳුනා ගෙන වෙන් කර දක්වයි<br>● ප්‍රයෝජ්‍ය ක්‍රියා සහ අසම්භාව්‍ය ක්‍රියා නිවැරදි ව වාක්‍යවල යොදයි. | 3 |
| | 6.3<br>අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි. | ● අව්‍යය පද<br>-නිපාත (හැඳින්වීමක් සහිත ව අභ්‍යාස) | ● නිපාත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ලේඛනයේ දී නිපාත වෙන් කොට ලිවිය යුතු බව ප්‍රකාශ කරයි.<br>● නිපාත වර්ග කරයි.<br>● නිපාත නිවැරදි ව හා අර්ථවත් ව භාවිත කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.4<br>සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි. | • කර්තෘ කාරක - කර්ම කාරක භේදය<br>• විශේෂ වාක්‍ය රීති,<br>(සමූහාර්ථවාචී, සචේතන අචේතන නිත්‍ය බහු වචන ගෞරවාර්ථ ආණ, අණු, අණි, වහන්සේ, දෑ,) | • වාක්‍ය නිර්මාණයේ දී සම්මත රීති අනුගමනය කළ යුතු ආකාරය පැහැදිලි කරයි.<br>• සම්මත රීතිවලට අනුව වාක්‍ය නිර්මාණ කරයි.<br>• කර්තෘ කාරක හා කර්ම කාරක වශයෙන් වාක්‍ය වර්ග දෙකක් ඇති බව හඳුනා ගෙන ඉදිරිපත් කරයි. | 7 |
| 7.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 7.1<br>තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | • ව්‍යාපාරික ලිපි | • ව්‍යාපාරික ලිපි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ව්‍යාපාරික ලිපියක මූලිකාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ග්‍රාහකයා ආකර්ෂණය වන පරිදි ලිපි ලිවීමේ අශ්‍යතාව පැහැදිලි කරයි.<br>• යෝග්‍ය ආකෘතිවලට අනුව ව්‍යාපාරික ලිපි ලියයි. | 4 |
| | 7.2<br>ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | • ආරාධනා පත්‍ර<br>• ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම. (ක්‍රියාකාරකම්) | • විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කිරීමේ අවශ්‍යතා හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණශීලී ව හා ආකර්ෂණීය ලෙස ආරාධනා පත්‍ර සකස් කරයි.<br>• ජීව දත්ත ඇසුරු කර ගෙන ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.<br>• ප්‍රායෝගික ලේඛන මගින් සුවිශේෂ අවශ්‍යතා ඉටුකර ගනියි. | 3 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1<br>කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | • මාතෘකානුකූල රචනා<br>-ආදර්ශ රචනා මගින් කරුණු සංවිධානය හා ලේඛන සම්බන්ධ නිදර්ශන | • මාතෘකාව තෝරා ගනියි.<br>• මාතෘකාවට උචිත පරිදි කරුණු සංවිධානය කරයි.<br>• මාතෘකාවට අදාළ දළ සැලැස්මක් සකස් කරයි.<br>• හරවත් තොරතුරු උපයෝගී කර ගනිමින් භාෂාව නිවැරදි ව භාවිත කරයි.<br>• ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් විවිධ මාතෘකා ඔස්සේ රචනා ලියයි. | 4 |
| | 8.2<br>පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. | • බිත්ති පුවත්පත් ලිපි, සඟරා ලිපි (ක්‍රියාකාරකම්) | • බිත්ති පුවත් පතක හා සඟරාවක ස්වරූප හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• පාඨකයා ආකර්ෂණය වන පරිදි නිවැරදි ව ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• බිත්ති පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණාත්මක ලිපි ලියයි. | 3 |
| | 8.3<br>සාරාංශකරණයේ යෙදෙයි | • ලේඛන සාරාංශකරණය<br>-හැඳින්වීමක් හා අභ්‍යාස | • ලේඛන සාරාංශකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරයි.<br>• සාරාංශකරණයේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.<br>• අදාළ ලේඛන කියවා වැදගත් කරුණු මතු කර ගනියි.<br>• මූලික අදහස සුරැකෙන පරිදි සාරාංශකරණයේ යෙදෙයි. | 3 |

**සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0<br>සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. | 9.1<br>සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි. | • සංස්කෘතිය ගැන ලියැවුණු ලිපියක් - - කඨින පූජෝත්සවය | • නිර්දිෂ්ට ලේඛනය කියවා සංස්කෘතික දායාද හා හර පද්ධති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට ලේඛනයේ ඇතුළත් සංස්කෘතික අංගවලින් මතුවන සාරධර්ම අගය කරයි.<br>• අනාගත පරපුරට සංස්කෘතිකාංග පවරා දීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව ලියවුණු ලිපි ලේඛන පරිශීලනය කරයි. | 3 |
| | 9.2<br>පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි | • සාරධර්ම හා සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය ලිපියක් | • සාරධර්ම යන්න පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට ලේඛනයේ ඇතුළත් සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ජීවිතාවබෝධය පිණිස සාරධර්ම ඉවහල් වන ආකාරය පැහැදිලි කරයි.<br>• සාරධර්ම අන්තර්ගත වූ සාහිත්‍ය කෘති පරිශීලනය කරයි. | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.3<br>දේශාභිමානි හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | • යෝග්‍ය පරිදි සාහිත්‍ය නිදර්ශන ඇතුළත් කරමින් පාඩමක්<br><br>• මල් මල් වාරම් හරිම උදාරම් | • නිර්දිෂ්ට නිර්මාණවලින් ධ්වනිත වන දේශාභිමානි හැඟීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්මාණවලින් ඉස්මතු කෙරෙන අදහස් පැහැදිලි කරයි.<br>• නිර්මාණවලින් ඉස්මතු කෙරන දේශාභිමානි හැඟීම් අගය කරයි.<br>• දේශාභිමානය දනවීම සඳහා භාෂාව යොදා ගෙන ඇති ආකාරය සාකච්ඡා කරයි. | 4 |
| | 9.4<br>විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි. | • විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් ගැන ලියැවුණු නිර්මාණයක්<br>-අප්‍රිකානු සම්භවයක් ඇති පුත්තලම සිරම්බි අඩිය ජන කොට්ඨාසය පිළිබඳ ලිපියක් | • විවිධ ජන කොටස්වලට අවේණික සිරිත් විරිත් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ සිරිත් විරිත් මගින් ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රදර්ශනය වන බව පැහැදිලි කරයි.<br>• විවිධ ජන කොට්ඨාසවලට අයත් සිරිත් විරිත් පිළිබඳ ලියැවුණු ලිපි ලේඛන පරිශීලනය කරමින් තොරතුරු රැස් කරයි.<br>• විවිධ ජන කොට්ඨාසවල සිරිත් විරිත් ඉදිරිපත් කිරීමේ දී භාෂාව යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරයි. | 4<br><br><br>12.0<br>අත්දැකීම් පාදක<br>ගනිමින් නිර්මා<br>කාර්යයේ යෙ |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.5<br>විවිධ නායකයන්ගේ චරිත කථා පරිශීලනය කරයි. | • ආනන්ද කුමාරස්වාමි | • ආනන්ද කුමාරස්වාමි විද්වතානන් පිළිබඳ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ඔහුගෙන් ශාස්ත්‍රීය හා කලා ක්ෂේත්‍රයට සිදුවී ඇති සේවය පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.<br>• විවිධ නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරමින් භාෂා කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3 |
| 10.0<br>සාහිත්‍යික දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි. | 10.1<br>සාහිත්‍යයික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | • කුමාරතුංග මුනිදාස මහතාගේ භාෂා විෂයක අදහස් දැක්වෙන ලිපියක් | • කුමාරතුංග මුනිදාස මහතා භාෂාවේ අභිවෘද්ධියට කළ සේවය පැහැදිලි කරයි.<br>• කුමාරතුංග මුනිදාස මහතා පළ කළ භාෂා විෂයක අදහස් පැහැදිලි කරයි.<br>• කුමාරතුංග මුනිදාස මහතාගේ සාහිත්‍ය නිර්මාණවල දක්නට ලැබෙන සුවිශේෂ භාෂා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.<br>• කුමාරතුංග මුනිදාස මහතාගේ ළමා සාහිත්‍යය නිර්මාණ රස විඳ අදහස් ප්‍රකාශ කරයි. | 3 |
| | 10.2<br>විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබාගත් දැනුම භාෂා කාර්ය සඳහා යොදා ගනියි. | • අභ්‍යවකාශ ගවේෂණය පිළිබඳ විද්‍යාත්මක ලේඛනයක් | • පොතපත කියවා තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ලේඛනයේ ඇතුළත් පාරිභාෂික වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• ලේඛන පරිශීලනයෙන් ලබාගත් දැනුම උචිත පරිදි භාවිත කරයි.<br>• හඳුනා ගත් පාරිභාෂික වචන ලේඛනයේ දී සුදුසු පරිදි යොදා ගනියි. | 3 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| . | 10.3<br>අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි. | • ළමා සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ලිපියක් | • ළමා සාහිත්‍යය නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ළමා සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• අද්‍යතන ළමා සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් වර්ධනය කර ගත් භාෂා හැකියා ප්‍රදර්ශනය කරයි. | 4 |
| 11.0<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1<br>සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි. | • කෙටිකතා<br>- අල්මේදලා බෝල ගසති (ස්වර්ණ ශ්‍රී බණ්ඩාර)<br>- දිට්ඨ දාන (ජේ. ඒ. එස්. ඩී. එස්. සිරිවර්ධන)<br>• මහාසාර නාටකය එදිරිවීර සරච්චන්ද්‍ර (පළමු අංකයෙන් තෝරාගත් කොටසක්) | • නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණ කියවා රස විඳියි.<br>• සාහිත්‍ය නිර්මාණවල අන්තර්ගතය ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණයෙහි චරිත හඳුනා ගෙන සුවිශේෂ ලක්ෂණ මතු කර දක්වයි.<br>• සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි. | 7 |
| | 11.2<br>සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | • නූතන පද්‍ය - දෑසේ නිල් පැහැය (රන් තැටියක කඳුළු - දයාසේන ගුණසිංහ) | • නිර්දිෂ්ට කවි පෙළ රිද්මයානුකූලව ගායනා කරයි.<br>• කවිපෙළෙහි ව්‍යංග්‍යාර්ථ ඉස්මතු කර දක්වයි.<br>• කවි පෙළෙහි දක්නට ඇති කාව්‍යෝක්ති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• කවි පෙළ රසවිඳිමින් අදහස් ප්‍රකාශ කරයි. | 4 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.3<br>සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි. | • සාහිත්‍ය නිර්මාණ පරිශීලනයට උනන්දු කරවන , උසස් සාහිත්‍ය නිර්මාණ හඳුනා ගැනීමට යෝග්‍ය විචාරාත්මක ලිපියක් | • සාහිත්‍ය නිර්මාණ විචාරය යන්න සරල ව පැහැදිලි කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>• නිර්දිෂ්ට ලිපියෙහි ඇතුළත් විචාර ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• භාෂාව නිර්මාණශීලී ව භාවිත කරමින් සාහිත්‍ය නිර්මාණ විචාරය කරයි. | 4 |
| 12.0<br>අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1<br>පද්‍ය රචනා නිර්මාණය කරයි. | • මාතෘකානුකූල ව පද්‍ය නිර්මාණය කිරීමට අදාළ ක්‍රියාකාරකම් | • පද්‍ය නිර්මාණයට සුදුසු මාතෘකා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පද්‍ය නිර්මාණයේ දී යොදාගත හැකි කාව්‍ය උපක්‍රම පැහැදිලි කරයි.<br>• විවිධ අත්දැකීම් පාදක කර ගෙන මාතෘකානුකූලව පද්‍ය නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 4 |
| | 12.2<br>නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • අත්දැකීම් ඔස්සේ කෙටිකතා ප්‍රබන්ධ කිරීම. | • විවිධ අත්දැකීම් පාදක කරගෙන කෙටිකතා ප්‍රබන්ධ කළ හැකි බව ප්‍රකාශ කරයි.<br>• කෙටිකතා ප්‍රබන්ධකරණයේ දී නිර්මාණාත්මක චින්තනය මෙහෙය විය යුතු බව පැහැදිලි කරයි.<br>• කෙටිකතාකරණයේ මූලික ලක්ෂණ හඳුනා ගෙන නිර්මාණකරණයේ යෙදෙයි. | 4 |

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.3<br>නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | ● ළමා අත්දැකීම් පදනම් කරගත් කෙටි නාට්‍ය රචනය<br>- මහාසාර නාටකයෙන් තෝරාගත් කොටසක් | ● ළමා නාට්‍ය රචනය සඳහා සුදුසු තේමා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>● නාට්‍යෝචිත අවස්ථා පැහැදිලි කරයි.<br>● චරිත, අවස්ථා හා සිද්ධි උචිත පරිදි යොදා ගැනීමෙන් නාට්‍යය රසය ජනිත වන බව පැහැදිලි කරයි.<br>● ළමා නාට්‍ය සඳහා ගැළපෙන තේමා පදනම් කර ගෙන නිර්මාණාත්මක ව නාට්‍ය පෙළ රචනා කරයි. | 3 |

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පෙළ පොතට හා පන්ති කාමරයට පමණක් සීමා නොවිය යුතු ය. විවිධ සන්නිවේදන මාධ්‍ය පුළුල් ලෙස ව්‍යාප්ත වෙමින් පවත්නා මේ යුගයේ භාෂාව නිර්මාණාත්මක ව භාවිත කිරීම කෙරෙහි ශිෂ්‍ය පරපුර යොමු කළ යුතු ව ඇත. මේ සඳහා සාහිත්‍යයෙන් ලද හැකි පිටුබලය පුළුල් ය. එබැවින් භාෂාව හා සාහිත්‍යය සම්බන්ධ ව විෂය සමගාමී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමුවීම අවශ්‍ය ය. මේ වෙනුවෙන් පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධානය වීම ඵලදායක වනු ඇත.

මෙහි දී පාසල් සංස්කෘතියට අදාළ ව පවත්නා සම්පත්වලින් ප්‍රයෝජන ගත හැකි අයුරින් පහත සඳහන් ආකාරයේ වැඩසටහන් සංවිධානය කළ හැකි වේ.

1. සාහිත්‍ය සංගම්
2. ක්‍රීඩා හා රංගන
3. චාරිකා
4. පැවරුම්
5. ප්‍රදර්ශන
6. වාද විවාද
7 බිත්ති පුවත් පත් හා සඟරා
8. නිර්මාණ කව
9. පුස්තකාල පරිහරණය
10. ප්‍රහේලිකා දෘශ්‍ය මාධ්‍ය හා විවිධ නිර්මාණසිංහල භාෂා දින
11 ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සඳහා විවිධ නිර්මාණ
12 සිංහල භාෂා දින
13 අන්තර්ජාලය

## තක්සේරුකරණය

1. ශිෂ්‍යයන්ගේ ඉගෙනීම සාඵල්‍යයයේ විවිධ ප්‍රාප්ති මට්ටම් ඇත. ඒවා හැඳින ගැනීමටත් ඔවුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීමටත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අඛණ්ඩ තක්සේරුව අවශ්‍ය වේ. මෙම තක්සේරුව පාඩම් ඒකක අවසානයේ දී කෙරෙන සම්භවන ඇගයීම හා නිශ්චිත (FORMATIVE) කාලයක් (අවසන දී) සිදු කෙරෙන සම්පිණ්ඩිත ඇගයීම (FORMATIVE) වශයෙන් දෙයාකාරයකින් සිදු කළ හැකි ය.

2. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ (SBA) සඵල කර ගැනීම සඳහා ගුරු මාර්ගෝපදේශයෙහි සඳහන් කොට ඇත.

3. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී චතුර්විධ භාෂා කුසලතා (ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම) හා සන්නිවේදන කුසලතාව මෙන් ම රසඥතාව ගැන ද අවධානය යොමුකළ යුතු වේ. චතුර්විධ ක්‍රියාකාරකම්වලට සහ රස වින්දනාත්මක ක්‍රියාකාරකම්වලට සමාන අවස්ථා සලසා දී එම ක්‍රියාකාරකම්වල සාධනය මැනීමට පන්ති කාමර මට්ටමින් ලකුණක් ප්‍රදානය කොට ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් ද යොදා ගැනීම අපේක්ෂිත ය. මේ සඳහා උපදෙස් පාසල් පාදක ඇගයීම් ක්‍රමය (SBA) යටතේ සපයා ඇත.

4. මෙම තක්සේරු ක්‍රියාලියේ දී නිර්දිෂ්ට කොටස්වලට පමණක් නොව, ඊට පරිබාහිර වූ කොටස්වලට අදාළ ව ද සාධනය මැනීමට අපේක්ෂිත බැව් සැලකිය යුතු ය.

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.1 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ජනකතාවලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- අවධානයෙන් යුතු ව සවන් දී රසාස්වාදයේ යෙදෙයි.
- ජනකතාව සඳහා යොදා ගත් භාෂාව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- සිද්ධි හා අවස්ථා වටහා ගනිමින් ජනකතා අගය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ජනකතා යනු මොනවා දැයි ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් දන්නා ජනකතා පිළිබඳ විමසීමක යෙදෙමින්, ජනකතා ගැන ඔවුන් තුළ අවදි බවක් ඇති කරන්න. (ඇමුණුම 1 යොදා ගන්න)
- ජනකතාවක් කියමින් එය ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- ඒ පිළිබඳ වාචික ප්‍රශ්න අසමින් දැනුම තහවුරු කරන්න.
- අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයන් කිහිප දෙනෙකු ලවා පෙළපොතේ ඇතුළත් ජනකතාව කියවීමට සලස්වන්න. එයට අවධානයෙන් සවන් දීමට අනෙක් ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්න අසමින් ජනකතාව රස විඳීමට සලස්වන්න. (ඇමුණුම 2 යොදා ගන්න)
  පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  – කතාවේ අන්තර්ගතය
  – කතාවේ භාෂා ලක්ෂණ
  – අවස්ථා හා සිද්ධි
  – ජීවිතයට ගත හැකි ආදර්ශ
  – පෙළ පොතේ සඳහන් '**ශ්‍රී පාදය වැන්ද වූ හැටි**' ජනකතාවේ කොටසක් භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **ජනකතා 1** - ජාතික අධ්‍යාපන ආයතන
- **නගුල් මුන්නා සහ වෙනත් කතා** - ඒ. පී. ගුණරත්න
- **මග දිගට ජනකතා 1,2** - ඩී. පී. වික්‍රමසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ජනකතාවලට සාවධාන ව සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ජනකතාවලින් මතු වන රසය ඉස්මතු කරයි.
- ජනකතාවේ සඳහන් ජනවහර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ජනකතාවලින් ලද හැකි ජීවිතාදර්ශ පැහැදිලි කරයි.

ඇමුණුම - 01

**ජනකතා**

- ජනකතා අපේ ජනශ්‍රැතියෙහි අංගයක් වෙයි.
- ලිඛිත සාහිත්‍යයක් නොමැති ව මුඛපරම්පරාගත ව ආ කතා සම්ප්‍රදායක් අනුව ජනකතා බිහි විය.
- පසුව ඒවා එක් රැස් කර ජනකතා වශයෙන් ලේඛන ගත කර ඇත.
- අතීත ගැමි සමාජයේ ඇදහිලි හා සිරිත් විරිත් ආදිය ජනකතාවලින් පිළිබිඹු වෙයි.
- පුරාණයේ පැවතියේ ජනකතාවලට සවන් දී රසවිඳීමේ සම්ප්‍රදායකි.
- බොහෝ ජනකතාවලින් සමාජයට ආදර්ශයක් මෙන් ම ගුරුහරුකම් ද ලබා දෙයි.

ඇමුණුම - 02

- පෙළපොතේ සඳහන් ජනකතාව ඇසුරින් ප්‍රශ්න
  - ජනකතාවේ අන්තර්ගත චරිත නම් කරන්න.
  - කතාවේ ඇතුළත් සිද්ධි හා අවස්ථා කෙටියෙන් කියන්න.
  - කතාවෙන් ගත හැකි ආදර්ශ මොනවා ද?
  - කතාවේ ඇතුළත් සාම්ප්‍රදායික යෙදුම් මොනවා ද?

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 5.0 | භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම** | : | 5.2 | සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. |
| **කාලච්ඡේද** | : | 02යි. | |

**ඉගෙනුම් පල :**

- භාෂාවේ යෙදෙන සාම්ප්‍රදායික යෙදුම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සාම්ප්‍රදායික යෙදුම්වලින් භාෂාව පෝෂණය වන ආකාරය පැහැදිලි කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරමින් භාෂාව නිර්මාණාත්මක ලෙස යොදා ගනියි.
- ව්‍යක්ත ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- බහුල ව භාවිත වන ''**ප්‍රස්තාව පිරුළු**'' කිහිපයක් ලබා දී අදහස් ප්‍රකාශ කිරීම සඳහා ඒවා යොදා ගත හැකි ආකාරය ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් පවත්වන්න.
- එවැනි සාම්ප්‍රදායික යෙදුම් භාෂාවේ යෙදෙන අයුරුත්, ඒවා භාෂාව රසවත් කිරීම සඳහා ඉවහල් වන ආකාරයත් සාකච්ඡා කරන්න. (ඇමුණුම 1 යොදා ගන්න)
- තමන් දන්නා ප්‍රස්තාව පිරුළු කිහිපයක් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ හා බැඳුණු කතා ඇත්නම් ඒවා ද ශිෂ්‍යයන්ගේ රස වින්දනය සඳහා ඉදිරිපත් කරන්න.
- අදහස් ප්‍රකාශ කිරීමේ දී ප්‍රස්තාව පිරුළු මගින් එම අදහස් ප්‍රබල ව ප්‍රකාශ කළ හැකි බව පෙන්වා දෙන්න.
- '**ආප්තෝපදේශ**' යනු පැරණි උගතුන්ගේ උපදෙස් බව පැහැදිලි කරන්න. ඒවා ද **ප්‍රස්තාව පිරුළු** ලෙස භාවිත වී ඇති ආකාරය විස්තර කරන්න.
- **රූඪී** යනු කවරේ දැයි උදාහරණ මගින් පැහැදිලි කර ඒවා භාෂාවෙහි යෙදෙන ආකාරය සාකච්ඡා කරන්න. (ඇමුණුම - 2)
- පෙළපොතේ එන ජනකතාවේ ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ හා රූඪී යෙදී ඇත් දැයි පරීක්ෂා කර, ඒවා සොයා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ හා රූඪී එක් රැස් කිරීමට ඒ ඒ කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- එම ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ කණ්ඩායම් අතර හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒවායේ අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය නිර්මාණය කිරීමට යොමු කරන්න.
- ඒවා පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවමින් සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- **සිංහල ප්‍රස්තාව පිරුළු සාහිත්‍යය** - ප්‍රේමදාස ශ්‍රී අලවත්ත
- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබදු
- **පිරුළු මිණි** - ටී. එස්. ධර්මබන්දු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ හා රූඪී හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රස්තාව පිරුළු යොදා ගනිමින් භාෂාව ව්‍යක්ත ව හා රසවත් ව භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරයි.
- ආප්තෝපදේශ හා රූඪී යොදා ගැනීමෙන් භාෂාවෙහි ප්‍රකාශන ශක්තිය ප්‍රබල වන බව ප්‍රකාශ කරයි.
- ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ හා රූඪී යොදා ගෙන භාෂාව රසවත් ලෙස හා ව්‍යක්ත ලෙස ව්‍යවහාර කරයි.

ඇමුණුම 1
**සාම්ප්‍රදායික යෙදුම්**

භාෂාව රසවත් කර ගැනීමටත්, ප්‍රාණවත් කර ගැනීමටත්, පාඨක අවධානය යොමු කර ගැනීමටත් හැකි වන අයුරින් භාෂාවක යොදා ගන්නා සාම්ප්‍රදායික යෙදුම් ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ, යුගල පද හා රූඪී ආදි වශයෙන් දැක්විය හැකි ය.

**ප්‍රස්තාව පිරුළු**

ප්‍රකාශ කිරීමට අපේක්ෂිත අදහස් වඩාත් හොඳින් තහවුරු කිරීම සඳහා ප්‍රස්තාව පිරුළු යොදා ගැනෙයි. භාෂණයේදීත්, ලේඛනයේදීත් බහුල ව භාවිත වන මෙම යෙදුම් විශේෂය මගින් වචනාර්ථය ඉක්මවා යන පුළුල් අදහසක් ප්‍රකාශ කරයි. පහත සඳහන් වන්නේ එවැනි ප්‍රස්තාව පිරුළු කිහිපයකි.

| | | | |
|---|---|---|---|
| උදා : | ගඟට ඉනි කැපුවා වගේ | - | උත්සාහය නිෂ්ඵල වීම |
| | එළිපත්තෙ ඉන්න බළලා වගේ | - | ස්ථිර බවක් නැති |
| | අහසට ඉනිමං බැන්දා වගේ | - | නිෂ්ඵල ක්‍රියාවක් සිදු කිරීම |
| | කිරි ගහට ඇන්නා වගේ | - | ස්ථිර ව ම ප්‍රතිඵල ලැබීම |
| | කල දුටු කල වළ ඉහගන්නා සේ | - | අවස්ථාවක් ලැබුණු විට ඉන් ප්‍රයෝජන ගැනීම |
| | ගඟෙන් වතුර බී මුහුදට ආවඩන්නා සේ | - | උදව් කළ අය අමතක කර වෙනත් අය පැසසීම |
| | ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ | - | අනුන් රැවටීමට ගොස් තමා ද රැවටීම |

1. තම දරුවන්ගේ දියුණුව වෙනුවෙන් කැපවුණු දෙමව්පියන්ගේ බලාපොරොත්තු ''**ගඟට ඉනි කැපුවා මෙන්**'' වූයේ දරුවන් නොමග ගිය බැවිනි.
2. තම අරමුණු හරියට ම ඉටු වුණු හෙයින් ශාස්ත්‍රකරුගේ අනාවැකිය ''**කිරිගහට ඇන්නා වැනි**'' යැයි මව පැවසුවා ය.

**ආප්තෝපදේශ**

වියතුන්ගේ උපදේශ මෙනමින් සැලකේ. අවස්ථෝචිත ව භාෂාව රසවත් කර ගැනීමට මෙම යෙදුම් භාවිත වේ.

උදා ඃ පෙරළෙන ගලේ පාසි නො බැඳේ
ඉවසීමෙන් සැනසීම ලැබේ
උඩ පැන්නොත් බිම වැටෙයි
පිරුණු කළේ දිය නො සැලේ
දිලිසෙන සියල්ල රත්තරන් නො වේ
උගත මනා ශිල්පය මැයි මතු රැකෙනා
ගින්නක් නැති ව දුමක් නො නගී
පනින්ට පෙර සිතා බලනු
උගත මනා ශිල්පයමයි මතු රැකෙනා

ඇමුණුම - **02**

**රූඪී හෙවත් ඉඟි වැකි**

වචනාර්ථ අභිභවා වෙනත් අර්ථයක් ප්‍රකාශ වීම රූඪීවල ඇති විශේෂත්වයයි.

| | | |
|---|---|---|
| උදා ඃ පණට පණ මෙන් | - | ඉතා හිතවත් ලෙස |
| අං ඒම | - | අහංකාර වීම |
| අකුල් හෙළීම | - | බාධා කිරීම |
| කරල පැහිලා | - | යහපත් කාලයක් උදා වීම |
| දෙහි කපනවා | - | දොස් පැවරීම |
| කිඹුල් කඳුළු හෙළීම | - | බොරුවට හැඬීම |
| මුරුංගා අත්තේ තැබීම | - | බොරු වර්ණනා කිරීම |
| සුදු ලූනු පොඩි කිරීම | - | අනුන් මුළා කිරීම |

1. **පණට පණ මෙන්** සිටි දෙමිතුරන්ගේ විරසකය සැමගේ ම කතාබහට ලක් විය.
2. යම් අයෙකුගේ දියුණුවට **අකුල් හෙළීම** නුසුදුසු ක්‍රියාවක් බව ගුරුතුමා ප්‍රකාශ කළේ ය.
3. ''මං ඒ ගැන හොඳට දන්නවා. මට **සුදු ලූනු පොඩි කරන්න එපා**'' යැයි සිරිදාස පැවසුවේ ය.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි.

කාලච්ඡේද : 04යි.

**ඉගෙනුම් පල :**

- කවි පෙළට සවන් දී තාලානුකූල ව ගායනා කරයි.
- කවි පෙළෙහි අන්තර්ගත කාව්‍යෝක්ති හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- කවි පෙළෙහි රසය ජනනය වන ආකාරය පැහැදිලි කරයි.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.
- ජන කාව්‍යවල මූලික ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සාම්ප්‍රදායානුකූල නාද මාලාවකට අනුව නිර්දිෂ්ට කවි ගායනයකට සවන් දීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- වෙස්සන්තර ජාතක කථාවේ සාරාංශය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- කාව්‍යෝක්ති පිළිබඳ ව සරල ව සාකච්ඡා කරන්න.
- කවිවලට සවන් දී එමගින් විස්තර, සිද්ධි හා සිත්ගත් අවස්ථා විස්තර කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලස්වන්න.
- කවිවල අර්ථ අවබෝධ කර ගැනීමට සහාය වන්න.
- පහත සඳහන් කාව්‍යමය යෙදුම්, කවි පෙළෙන් උදාහරණ ඉදිරිපත් කරමින් සරල ව සාකච්ඡා කරන්න.
  - අලංකාර (උපමා/රූපක)
  - ව්‍යංග්‍යාර්ථවත් භාෂාව
  - එළිසමය (එළිවැට/ එළිය)
  - අනුප්‍රාසය
  - විරිත
- **වෙස්සන්තර ජාතක කාව්‍යය** ජන කාව්‍ය සම්ප්‍රදාය අනුව යමින් රචිත කාව්‍යයක් බව සාකච්ඡා කරන්න.
- කවි පෙළෙහි කාව්‍යෝක්ති මගින් මතු වන සාහිත්‍ය රසය ගැන පැහැදිලි කරමින්, කවි පෙළ රස විඳීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**මූලික වදන්/සංකල්ප :**

- උපමාලංකාර, රූපකාලංකාර, ව්‍යංග්‍යාර්ථවත් යෙදුම්, එළිසමය, අනුප්‍රාසය, විරිත

**ගුණාත්මක යෙදවුම් :**

- **පුරාණ වෙස්සන්තර ජාතක කාව්‍යය** - මහාචාර්ය සුචරිත ගම්ලත් (සංස්කරණය)
- **වෙස්සන්තර ජාතක කතාව** - පන්සිය පනස් ජාතක පොත
- **ජනකවි සංග්‍රහය** - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නියමිත පද්‍ය පන්තියට සවන් දී ගායනා කරයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව රසවිඳ අදහස් දක්වයි.
- කවි පෙළෙහි ඇති කාව්‍යමය යෙදුම් උපුටා දක්වයි.
- කාව්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- භාෂාවේ භාවිත වන විවිධ පද වර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සමානාර්ථ හා විරුද්ධාර්ථ පද පිළිබඳ දැනුම වාක්කෝෂය පෝෂණය සඳහා ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද අවස්ථෝචිත ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද යනු මොනවා දැයි හඳුන්වා දෙන්න.
- සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද භාෂාව රසවත් කර ගැනීමට යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
- සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද හඳුනා ගැනීමට සුදුසු ක්‍රියාකාරකම් සකස් කරන්න.
- විරුද්ධාර්ථ පද සෑදෙන ආකාර පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- වාක්කෝෂය පෝෂණය කර ගැනීම සඳහා විවිධ පද වර්ග හඳුනා ගත යුතු බව පැහැදිලි කරන්න.
- කණ්ඩායම් හෝ කේවල ව සුදුසු ක්‍රියාකාරකම් යොදා ගන්න.
- සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණ කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- අභ්‍යාසවල නිරත කරවමින් වාක්කෝෂය පෝෂණය කිරීමට සැලසුම් කරන්න. (ඇමුණුම යොදා ගන්න)

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබදු
- **සිංහල විරුද්ධාර්ථ පද කෝෂය** - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- **සමානාර්ථ පද කෝෂය** - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද විස්තර කරයි.
- භාෂාව පරිහරණය කිරීමේ දී සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද යොදා ගත හැකි අවස්ථා ඉදිරිපත් කරයි.
- වාක්කෝෂය පෝෂණය කර ගැනීමෙන් ව්‍යක්ත ලෙස භාෂා කාර්යයේ යෙදෙයි.
- ලේඛන කාර්යයේ දී සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද නිවැරදි ව යොදයි.

ඇමුණුම

**පහත සඳහන් ක්‍රියාකාරකම් ඇසුරෙන් වාක්කෝෂය පෝෂණය කරන්න.**

දී ඇති පද අතුරෙන් සමානාර්ථ නො වන පදය තෝරන්න.

උදාහරණ ඃ

ආඩම්බරය - අහංකාරය, උඩඟුකම, **අවමානය**

මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථවත් පදය තෝරන්න.

උදාහරණ ඃ

උත්තීර්ණ - නිරාවරණය, **අවතීර්ණ,** අනුකරණය

අවම - අධම, දාතම, **උපරිම**

පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පද ත්‍රිකෝණය තුළ ඇති පද අතරෙන් තෝරන්න.

1. ආරක්ෂිත
2. චාරිත්‍ර
3. ආර්ය
4. අවරගිර
5. නින්දා
6. සාර
7. එලොව
8. නිත්‍ය
9. සියුම්
10. සුහද

රක්ෂිත
සාරවත්
පරලොව
මනා, බටහිර
අනාරක්ෂිත
ප්‍රශංසා
අසාර
අනිත්‍ය, මෙලොව,
දළ, වාරිත්‍ර
අනාර්ය, උදාගිර, දුහද

පහත දැක්වෙන පදවලට සමානාර්ථවත් පද ත්‍රිකෝණය තුළ ඇති පද අතරෙන් තෝරන්න.

1. නුවණ
2. ප්‍රවීණ
3. උභය
4. අනල
5. ජනනි
6. දසන්
7. පහණ
8. මිහිපා
9. රජත
10. මුකුලිත

දක්ෂ
උදාර
මව, උපත
ඥානය
දෙක, ගින්න
වාතය, දත්
ප්‍රතිචීන, දර්ශන, නයන
එළිය, මිහිකත
පාෂාණ, රිදී, විකසිත
මී මැස්සා, පරවුණු, අභය, රාත්‍රිය, රජ

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.5 දේශන, සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- දේශනයට සාවධාන ව සවන් දීමේ අගය පැහැදිලි කරයි.
- දේශනයට සවන් දී එහි වැදගත් කරුණු මතකයේ තබා ගෙන ප්‍රකාශ කරයි.
- දේශනයෙහි අන්තර්ගත කරුණු පිළිබඳ විචාරශීලී ව අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- දේශනයකට සවන්දීමේ දී සැලකිය යුතු කරුණු සාකච්ඡා කරන්න. (අවධානය යොමු කිරීම, නිශ්ශබ්දතාව රැකීම, වැදගත් කරුණු මතකයේ තබා ගැනීම)
- සුප්‍රකට කලාකරුවකු වන **එස්. පණීභාරතයන්** පිළිබඳ දේශනයකට සවන් දීම සඳහා ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් දේශනයට සවන් දුන් පසු මතක තබා ගත් කරුණු පිළිබඳ ව ප්‍රශ්න නගමින් තහවුරු කරන්න.
  - පණීභාරත කලාකරුවාගේ ජීවන තොරතුරු
  - නර්තනයට සිදු කළ සේවාව
  - ජීවිතයෙන් ගත හැකි ආදර්ශ
  - ඔහු ලැබූ සම්මාන

  ආදි කරුණු ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- දේශනයට සවන් දීමෙන් පසු තමන්ට ඇති වූ හැඟීම් පිළිබඳවත් පණීභාරතයන්ගෙන් සිදු වී ඇති සේවය පිළිබඳවත් සාකච්ඡාවක් පවත්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විද්වත් දේශකයකු ගෙන්වා පණීභාරතයන් පිළිබඳ දේශනයක් පැවැත්වීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විද්වත් දේශනයට සාවධාන ව සවන්දෙයි.
- දේශනයට සවන් දී වැදගත් කරුණු සටහන් කරයි.
- සවන් දුන් කරුණු මතකයෙන් කියයි.
- සවන් දී රැස් කර ගත් කරුණු අවස්ථෝචිතව භාවිත කරයි.

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාරය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල :**

- යුගල පද, භාෂාවේ යෙදෙන සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- යුගල පදවලින් භාෂාව පෝෂණය වන ආකාරය පැහැදිලි කරයි.
- යුගල පද යොදා ගනිමින් භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරයි.
- යුගල පද භාවිත කරමින් අදහස් ව්‍යක්ත ව ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සාම්ප්‍රදායික යෙදුම් පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම පරීක්ෂා කිරීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- යුගල පද සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් බව පැහැදිලි කර දෙන්න.
- යුගල පද යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
- යුගල පද නිර්මාණය වී ඇති ආකාරය සාකච්ඡා කරන්න. (මේ සඳහා ඇමුණුම භාවිත කරන්න)
- යුගල පද හඳුනා ගැනීම සඳහා අභ්‍යාසයක නිරත කරවන්න.
- යුගල පද ලැයිස්තුවක් සකස් කිරීමට පවරන්න.
- එම ලැයිස්තුවේ ඇති යුගල පද, සකස් වී ඇති ආකාර අනුව වෙන් කිරීමේ පැවරුමක යොදවන්න.
- යුගල පද යොදා වාක්‍ය නිර්මාණයට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබදු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- යුගල පද යනු කුමක්දැයි නිර්වචනය කරයි.
- යුගල පද ලැයිස්තුවක් සකස් කරයි.
- යුගල පද සකස් වී ඇති ආකාරය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- යුගල පද ඇතුළත් වාක්‍ය නිර්මාණය කරයි.

ඇමුණුම

- සමාන අර්ථ සහිත පද දෙකක් එක් වීමෙන් සෑදෙන යුගල පද ፡
  උදා ፡ සැප සනීප, මිල මුදල්, ඉමක් කොනක්

- විරුද්ධාර්ථ සහිත පද දෙකක් එක් වීමෙන් සෑදෙන යුගල පදඃ
  උදාඃ ගනු දෙනු, පින් පව්, යන එන

- අර්ථ විරහිත පද දෙකක් එක් වීමෙන් සෑදෙන යුගල පද ፡
  උදාඃ අනම් මනම්, තක්කු මුක්කු, ලට්ට ලොට්ට

- අර්ථ සහිත පදයක් හා අර්ථ රහිත පදයක් එක් වීමෙන් සෑදෙන යුගල පදඃ
  උදාඃ ඉඩම් කඩම්, ගමන් බිමන්, නහින දෙහින

- පූර්ව ක්‍රියා පද දෙකක් එක් වීමෙන් සෑදෙන යුගල පදඃ
  උදාඃ අඬා දොඩා, කා බී, කවා පොවා

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.7 බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- බහුවිධ මාධ්‍ය හඳුනා ගෙන නම් කරයි.
- තොරතුරු ඉදිරිපත් කිරීමේ දී බහුවිධ මාධ්‍ය යොදා ගැනීමේ වැදගත්කම විස්තර කරයි.
- බහුවිධ මාධ්‍ය භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- බහුවිධ මාධ්‍ය යොදා ගනිමින් කරුණු ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- මානව දැනුම ඉදිරිපත් වන විවිධ මාධ්‍ය පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න. එමගින් දැනුම ඉදිරිපත් කරන විවිධ මාධ්‍ය මොනවා දැයි ඉස්මතු කර ගන්න (ඇමුණුම 01)
- තොරතුරු ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කර ගත යුතු බව අවධාරණය කරන්න. එහි වැදගත්කම පිළිබඳ ආකල්ප වර්ධනය කරන්න.
- බහුවිධ මාධ්‍ය භාවිත කරමින් පෙළපොතේ කැමති පාඩමක් ඇසුරෙන් විනාඩි 5ක පවර් පොයින්ට් සමර්පණයක් (Presentation) ඉදිරිපත් කිරීමට කණ්ඩායම් පැවරුමක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- කල් ඇති ව සකස් කර ගත් පවර් පොයින්ට් සමර්පණය
- බහුවිධ මාධ්‍ය ප්‍රක්ෂේපණය (Multimedia Projector)
- පෝස්ටරයක්
- පිටු පෙරළනයක් (Clip chart)
- චිත්‍රයක්
- කාටූන්
- ශ්‍රව්‍ය පට/සංයුක්ත තැටි

**ඇගයීම හා තක්සේරුකරණය :**

- තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත හැකි බහුවිධ මාධ්‍ය නම් කරයි.
- බහුවිධ මාධ්‍ය භාවිත කරමින් තෝරා ගත් පාඩමක් ඇසුරෙන් සමර්පණයක් (Presentation) ඉදිරිපත් කරයි.
- ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනයේ වැදගත්කම අවධාරණය කරයි.

**ඇමුණුම 01**

**තොරතුරු ඉදිරිපත් වන බහුවිධ මාධ්‍ය**

- වාචික මාධ්‍ය ඉදිරිපත් කිරීම
- චිත්‍රමය මාධ්‍ය- චිත්‍ර, පෝස්ටර්
- චලන චිත්‍ර මාධ්‍ය - රූපවාහිනිය, චිත්‍රපට
- නාට්‍යය මාධ්‍ය - භූමිකා රංගන, නාට්‍ය
- බහුවිධ මාධ්‍ය සමර්පණය
- පුවත්පත් මාධ්‍ය
- පිටු පෙරළනය
- කාටූන්
- ශ්‍රව්‍ය පට/සංයුක්ත තැටි

**වර්ධනය කළ යුතු කුසලතා**

- කථන හැකියාව
- කථන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමේ කුසලතාව
- පරිගණක පවර් පොයින්ට් සමර්පණ
- ලිවීමේ හැකියාව
- ගායනය
- රංගනය
- චිත්‍රකරණය

**නිපුණතාව** : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- නිශ්ශබ්ද ව කියවා අන්තර්ගතය අවබෝධ කර ගෙන පැහැදිලි කරයි.
- නිශ්ශබ්ද ව කියවීමෙන් ලබා ගත් දැනුම ප්‍රායෝගික ව භාවිත කරයි.
- විෂයානුබද්ධ ලේඛන නිශ්ශබ්ද ව කියවා සුවිශේෂ කරුණු ගොනු කරයි.
- නිශ්ශබ්ද ව කියවීමේ අගය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිශ්ශබ්ද ව කියවීමේ අගය පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙන්න. (ඇමුණුම 1 යොදා ගන්න)
- පුවත්පතක තෝරා ගත් කොටසක් නිශ්ශබ්ද ව කියවීමට යොමු කරන්න. (ඡායා පිටපත් කර ලබා දෙන්න)
- එම කොටස ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් වාචික ව ඉදිරිපත් කරන්න.
- අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ අගය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පෙළපොතේ එන **ස්ටෆන් හොව්කින්ග් (Stephen Hawking)** පිළිබඳ පාඩම නිශ්ශබ්ද ව කියවීම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.
- කියවා අවසන් වූ පසු කාර්ය පත්‍රිකාවක් ඇසුරෙන් පිළිතුරු ලිවීමට අවස්ථාව ලබා දෙන්න. (ඇමුණුම 2)
- විෂය කරුණු අවබෝධ කර ගැනීම සඳහා නිශ්ශබ්ද ව කියවීමේ අගය ශිෂ්‍යයන්ට වටහා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- නිශ්ශබ්ද ව කියවීම සඳහා සුදුසු ශාස්ත්‍රීය ලේඛන කීපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිශ්ශබ්ද ව කියවීමේ අගය ප්‍රකාශ කරයි.
- නිශ්ශබ්ද ව කියවා පාඩමේ අන්තර්ගතය ඉදිරිපත් කරයි.
- අදාළ චරිතය පිළිබඳ ව අගයමින් කතා කරයි.
- විෂයානුබද්ධ ලේඛන නිශ්ශබ්ද ව කියවා තොරතුරු රැස් කරයි.

ඇමුණුම 1

- නිශ්ශබ්ද ව කියවීමේ පුරුදු
  - පද අරුත් ඉගෙනීම සඳහා කියවීම
  - කරුණු අවබෝධ කර ගැනීම සඳහා කියවීම
  - පාඨයෙන් හා උද්ධෘතයෙන් පළ වන දෑ සම්පිණ්ඩනයක් ලෙස ගැනීමට කියවීම
  - දන්නා දේ වඩා වර්ධනය කර ගැනීම සඳහා කියවීම
  - වාක්කෝෂ පුළුල් කර ගැනීම සඳහා කියවීම
  - නිර්මාණකරණය සඳහා ශිල්පීය දැනුම ලබා ගැනීමට කියවීම
  - භාෂාත්මක ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා කියවීම

ඇමුණුම 2

**කාර්ය පත්‍රිකාව**

- පෙළපොතේ පාඩමට අනුව කාර්ය පත්‍රිකාව සකස් කර ගන්න. පහත සඳහන් ආකාරයට ප්‍රශ්න ඇතුළත් කර ගන්න.

| | |
|---|---|
| - අවබෝධය සම්බන්ධ ප්‍රශ්න | 60% |
| - වාක්කෝෂීය දැනුම පිළිබඳ ප්‍රශ්න | 10% |
| - අක්ෂර වින්‍යාසය පිළිබඳ ප්‍රශ්න | 10% |
| - වාක්‍ය නිර්මාණය පිළිබඳ ප්‍රශ්න | 20% |

**නිපුණතාව** : 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සිංහල අක්ෂර මාලාවේ ප්‍රභේද වර්ග කර දක්වයි.
- භාෂාවේ ශබ්ද සංකේත උපදින ස්ථාන හඳුනා ගෙන පැහැදිලි කරයි.
- සිංහල අක්ෂර මාලාවේ වර්ගාක්ෂර, උත්පත්ති ස්ථාන අනුව වගුගත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සම්මත සිංහල අක්ෂර මාලාව උචිත ක්‍රමවේදයක් භාවිත කර ඉදිරිපත් කරන්න.
- **සිංහල අක්ෂර මාලාව** ප්‍රධාන වශයෙන් ස්වර, ව්‍යඤ්ජන ලෙස වර්ග වන බව පැහැදිලි කරන්න.
- වර්ගාක්ෂර උත්පත්ති ස්ථාන අනුව වෙන්කර දක්වන්න.
- ශබ්ද උච්චාරණය කිරීමේ දී උගුර, තල්ල, මුදුන, දත් හා තොල්වල ස්පර්ශ වන ආකාරය අනුව අක්ෂර වර්ග වන බව පැහැදිලි කරන්න.
- අක්ෂර වර්ග කර ඇති ආකාරය වගුවක් ඇසුරෙන් පෙන්වා දෙන්න.
  උදාහරණ : ක, ච, ට, ත, ප අක්ෂර උච්චාරණය කර පෙන්වන්න. (ඇමුණුම 01)

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල ලේඛන රීතිය** (නව සංස්: 2015 ) - ජාතික අධ්‍යාපන ආයතනය
- **සිංහල භාෂා ව්‍යාකරණය** - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- **භාෂා විෂයක ලිපි** - ම. ව. සුගතපාල ද සිල්වා

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ස්වර, ව්‍යඤ්ජන ලෙස වර්ග කර දක්වයි.
- වර්ගාක්ෂර උත්පත්ති ස්ථාන අනුව වර්ග කර දක්වයි.
- අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.

**ඇමුණුම 01**

- මෙම අක්ෂර අකුරු වශයෙන් හල් උච්චාරණය කිරීම අපහසු බැවින් ස්වරයක් යොදා උච්චාරණය කරනු ලැබේ. ක් + අ, ක
  ඛ් + අ, ඛ ආදි වශයෙනි.

- ඟ්, ඦ්, ඬ්, ඳ්, ඹ් යන අකුරු සිංහල හෝඩියේ වර්ගාක්ෂරවල අන්තයේ ඇතුළත් කොට ඇති බැවින් ඒවා වර්ගාක්ෂර වශයෙන් සැලකීම වරදක් නැත.

| උත්පත්ති ස්ථාන | වර්ගය | ව්‍යංජන අක්ෂර | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කණ්ඨජ (උගුරෙන් උපදින) | ‘ක’ වර්ගය | ක් | ඛ් | ග් | ඝ් | ඞ් | ඟ් |
| තාලුජ (තල්ලෙන් උපදින) | ච’ වර්ගය | ච් | ඡ් | ජ් | ඣ් | ඤ් | ඦ් |
| මූර්ධජ (මුදුනෙන් උපදින) | ‘ට’ වර්ගය | ට් | ඨ් | ඩ් | ඪ් | ණ් | ඬ් |
| දන්තජ (දත්වලින් උපදින) | ‘ත’ වර්ගය | ත් | ථ් | ද් | ධ් | න් | ඳ් |
| ඕෂ්ඨජ (තොල්වලින් උපදින) | ‘ප’ වර්ගය | ප් | ඵ් | බ් | භ් | ම් | ඹ් |

**නිපුණතාව** : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- කියවීමේ දී නිවැරදි උච්චාරණයේ හා හඬ පාලනයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ලේඛනවල විවිධත්වය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කියවයි.
- අසන්නාගේ අවධානය ලබා ගත හැකි වන සේ කියවයි.
- අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවීමේ අගය ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවන ලද ඇමුණුම 1හි ඇතුළත් අක්‍රෝධමාරෝග්‍ය ශ්ලෝකයට සවන් දීමට සලස්වන්න.
- ලේඛනයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවීමේ අවශ්‍යතා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
  උදාහරණ: වාර්තා , ප්‍රවෘත්ති
- ශ්‍රාවක අවධානය යොමු කර ගැනීම සඳහා **නිවැරදි උච්චාරණය හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවීම** අවශ්‍ය බව අවධාරණය කරන්න.
- විවිධ ලේඛන අදාළ ශෛලියෙන් ම කියවිය යුතු බව පැහැදිලි කර දෙන්න. (මේ සඳහා ඇමුණුම් අංක 01හි සඳහන් ශ්ලෝක, ගාථා හා ලේඛන අදාළ ශෛලියෙන් කියවා ආදර්ශනය කරන්න)
- සියලු ම ශිෂ්‍යයන්ට ශබ්ද නගා කියවීමට අවස්ථා දෙන්න.
- ශබ්ද නගා කියවීම පුහුණු කරන්න.
- පෙළපොතේ අදාළ පාඩමේ ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **ප්‍රත්‍ය ශතකය**
- **බුද්ධ ගජ්ජය**
- **සකස්කඩ**
- **ධම්ම පදය**
- **පන්සිය පනස් ජාතක පොත**
- **සද්ධර්මරත්නාවලිය**

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශබ්ද නගා කියවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- විවිධ ලේඛන කියවිය යුතු ශෛලිය හඳුනා ගෙන කියයි.
- විධිධ ලේඛන උචිත ශෛලියෙන් කියවයි.
- විවිධ ලේඛන අවස්ථෝචිත ව ශබ්ද නගා කියවයි.

ඇමුණුම 01

**ශ්ලෝක**

අක්‍රෝධමාරෝග්‍ය ජිතේන්ද්‍රියත්වං
දයාක්ෂමා සර්ව ජනප්‍රියත්වං
නිර්ලෝභි දාතා භය ශෝක මුක්තිර්
ඥාණප්‍රභේදා දශ ලක්ෂණානි

**(ප්‍රත්‍ය ශතකය)**

(ක්‍රෝධ නැති බව ද, නිරෝගී බව ද, දිනන ලද ඉඳුරන් ඇති බව ද, දයාවන්ත බව ද, ඉවසීම ද, සියල්ලන්ට ප්‍රිය බව ද, ලෝභ නැති බව ද, ත්‍යාගවන්ත බව ද, භය නැති බව ද, ශෝක නැති බව ද යන මේ දහය ඥානවන්තයාගේ ප්‍රභේද ලක්ෂණයෝ ය)

**ගාථා**

අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
ජිණ්ණ කොඤ්චා වඣායන්ති - ඛීණ මච්ඡේව පල්ලලේ

**(ධම්ම පදය)**

(තරුණ කාලයේ දී බඹසර නො හැසිර, මනා ඉගෙනීමක් නැති ව කල්ගත කළ හොත්, මහලු කාලයේ දී මසුන් නැති විලක් ළඟ බලා සිටින කොස්වාලිහිණියෙකු මෙන් කල් ගෙවන්නට සිදු වේ)

**ගාථා**

මාතා පෙත්ති භරං ජන්තුං - කුලේ ජෙට්ඨාපචායිනං
සණ්හංසඛිල සම්භාසං - පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡේර විනයේ යුත්තං - සච්චං කෝධාභිභුං නරං
තං වේ දේවා තාවතිංසා - ආහු සප්පුරිසො ඉති

**(සංයුක්ත නිකාය - දේවා (සත්තවත පද) සුත්ත)**

(මවුපියන් පෝෂණය කිරීම ද, පරපුරේ වැඩිහිටියන්ට ගරු කිරීම ද, මිහිරි වචන කතා කිරීම ද, පරුෂ වචන කතා නොකිරීම ද, මසුරු කමෙන් ඈත් වීම ද, සත්‍ය වචන කතා කිරීම ද, ක්‍රෝධ නොකිරීම ද යන මෙකී ලක්ෂණවලින් යුක්ත පුද්ගලයාට තව්තිසාවේ දෙවියෝ සත් පුරුෂයා යැයි කියති)

**ශ්ලෝක**

දීපඞ්කරාහ්වය මුනීශ්වරපාදමූලේ
සන්ත්‍යජ්‍ය ලබ්ධමමෘතං කරුණාං විධාය
අත්‍යාහිතං පරහිතං සුකෘතං විශේෂාත්
සිද්ධං නමෝස්තු සුගතාය ජිගද්ධිතාය

**(සකස්කඩ)**

**ගද්‍ය පාඨ**

තව ද සැදැ ඇත්තවුන්ගේ සැදැ වඩනට නිසි වූ අනිකුත් කථාවක් දක්වන්නමෝ යම් සේ චක්ඛුපාල තෙරුන් වහන්සේ වෙද ව උපන් ජාතියෙහි නුවණ නමැති ඇස මෝහ නමැති පටලය වැඩීමෙන් කුසල් නමැති ඉඳුරා මඟ නො දැක අකුසල් නමැති විෂම මඟට පැමිණ ලසු වූත් අකුශලය නිසා රහත් වූ ජාතියෙහි අන්ධ වීමෙන් මේ සා හානියක් වී ද එසේ නො ව යම් කෙනෙක් නුවණ නමැති පහන් ඇසින් කුසල් මඟට බැස ලසු වූත් කුශලයෙහි හැසිරෙත් නම් ඒ නිසා ලබන ලොවී ලොවුතුරා සැපත් මට්ටකුණ්ඩලී වස්තුවෙන් දක්වම්හ.

**(සද්ධර්මරත්නාවලිය)**

**නිපුණතාව** : 4.0 ශිල්පීය ප්‍රයෝග ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.
- භාෂා භාවිතයේ දී විරාම ලකුණු යෙදීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- අදහස් ප්‍රකාශ කිරීම සඳහා විරාම ලකුණු යෙදීමේ වැදගත්කම අවධාරණය කරයි.
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- කියවීමේ දී මෙන් ම ලිවීමේ දී ද **විරාම ලකුණු** කෙරෙහි සැලකිලිමත් විය යුතු බව අවධාරණය කරන්න.
- පෙර පන්තිවල දී උගත් විරාම ලකුණු සිහිපත් කරන්න. (මේ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න)
- සුදුසු අභ්‍යාස යොදා විරාම ලකුණු භාවිත කරමින් කියවීමටත් ලිවීමටත් අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- **සිංහල ලේඛන රීතිය** (නව සංස්: 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබදු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විරාම ලකුණු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී හා කියවීමේ දී විරාම ලකුණු භාවිත කිරීම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- විරාම ලකුණු භාවිතයේ අගය පැහැදිලි කරයි.
- විරාම ලකුණු නිසි පරිදි භාවිත කරමින් ලියයි.

ඇමුණුම 01

**විරාම ලකුණු**

## තිත (.)

වාක්‍යයක අවසානය දැක්වීම සඳහා යෙදේ.

සිසුහු ගුරුවරුන් නමදිති.

පුද්ගල නාම මුල් අකුරු හා යෙදේ.

**නිදසුන් :**

- පු. බ. තෙන්නකෝන්
  ක. ග. අමරසේන
  ආර්. එස්. ගුණවර්ධන

නාමයක් කෙටි කොට දැක්වීමේ දී යෙදේ.

**නිදසුන් :**

ලං.ග.ම. (ලංකා ගමනාගමන මණ්ඩලය)
රු. 30/= (රුපියල් 30/=)
පූජා. (පූජාවලිය)

## කොමාව (,)

වාක්‍යයක නොයෙක් කොටස් අතර පැවැතිය හැකි ඇතැම් මඳ විරාමය දැක්වීම සඳහා යෙදේ.

**නිදසුන :**

ළමයි පාසල් බිමට ඇතුළු ව, මඳක් ක්‍රීඩා කොට, පන්සිල් ගෙන, පන්ති කාමරයට ගොස් ඉගෙනීමෙහි නිරත වූහ.

**නිදසුන :**

ඇතැම් ස්වදේශික බෙහෙත් ද්‍රව්‍යඃ
අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, බැබිල, කටුවැල් බටු

## තිත් කොමාව (;)

ඒක-කර්තෘක අන්තර් වාක්‍ය කිහිපයක් එකින් එක වෙන් කිරීමේ දී යෙදේ.

**නිදසුන :**

විශේෂ අමුත්තා සතුටින් පිනා ගියේ ය; නළුවන් කරා පා නැඟුවේ ය; සතුට පළ කළේ ය; සමු ගත්තේ ය.

## දෙතිත (:)

දෙබසක් ලියා දැක්වීමේ දී ප්‍රකාශකයාගේ නම ඉදිරියෙන් යෙදේ.

**නිදසුන් :**

ගැමියා : පලදනාව මම වෙන කෙනෙකුට දුන්නා, දේවයන් වහන්ස.

රජ : කාට ද?

පැය සහ විනාඩි ඉලක්කමින් ලිවීමේ දී යෙදේ.

**නිදසුන :**

රැස්වීම ආරම්භ වූයේ ප.ව. 6:30ට ය.

ගණිත ප්‍රකාශනයක අනුපාතයක් ලියා දැක්වීමේ දී යෙදේ.

**නිදසුන:**

ඒ ධනය ඔවුන් දෙදෙනා අතර 2:3 අනුපාතයට බෙදා දක්වන්න.

## කෙටි ඉර (-)

පද සංයුක්ත ව යෙදෙන කල්හි එහි අන්‍යෝන්‍ය සම්බන්ධතාව දක්වනු සඳහා යෙදේ.

**නිදසුන් :**

සමාජ-දේශපාලන ආයතන

ජෛව-රසායනික විපර්යාස

ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය

කාලපරිච්ඡේද ආදිය ඉලක්කමින් දැක්වීමේ දී යෙදේ.

**නිදසුන් :**

i. මහාපරාක්‍රමබාහු රජ සමය ක්‍රි.ව. 1153 - 1186 යනුවෙන් පිළිගැනේ.

පේළියක කෙළවරෙහි සම්පූර්ණ පදයක් සඳහා ඉඩ ප්‍රමාණය මඳ වූ අවස්ථාවක, එහි යෙදිය හැකි අවසන් පදයට පර ව යෙදේ.

සැ.යු.

i. මෙසේ කැඩිය හැක්කේ ද පදයක් අකුරු හතරක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් යුක්ත නම් පමණි.
ii. හල් අකුරක් පමණක් දෙවන පේළියට එන සේ කැඩීම ද නුසුදුසු ය.
iii. හල් අකුරකින් ආරම්භ වන පද කොටසක් දෙවන පේළියට එන සේ කැඩීම ද නුසුදුසු ය.

නිදසුන්:

| වැරදි | නිවැරදි |
|---|---|
| සඳහ-<br>න්<br>විද්‍යා-<br>ත්මක | සඳ<br>-හන්<br>විද්‍යාත්-<br>මක |

iv. මෙසේ කැඩිය හැක්කේ දිග පදවල අක්ෂර සංඛ්‍යාවෙහි සමබරතාව සලකා ය.

## යුගල උඩු කොමා ('' '')

ප්‍රකෘති භාෂණ, උද්ධෘත පාඨ සහ විශේෂ ව්‍යවහාර දැක්වීම සඳහා යෙදේ.

**නිදසුන් :**

i. ''මම ගෙදර යමි'' යි හෙතෙම කී ය.

ii. ''වදිමු මුනි උතුමන් තිලෝගුරු'' යනු ගුත්තිල කාව්‍යයේ පද්‍ය පාදයකි.

## තනි උඩු කොමා (' ')

ප්‍රකෘති භාෂණයකට නොහොත් උද්ධෘත පාඨයකට අන්තර්ගත තවත් ප්‍රකෘති භාෂණයක්, උද්ධෘත පාඨයක් නොහොත් විශේෂ ව්‍යවහාරයක් දැක්වීමට යෙදේ.

**නිදසුන් :**

(i) ''ඒ දියවැල හැඳින්වෙන්නේ 'කුරුසිවෝ' යනුවෙනි''යි ශිෂ්‍යයා පිළිතුරු දිනි.
(ii) ''කුමාරතුංග මුනිදාසයන්ගේ 'හත්පණ' කියවන්නැ'' යි ගුරුතුමිය කීවා ය.

## තනි උඩු කොමාව (')

ශබ්ද සංවිධානය පිණිස පදයක අක්ෂරයක් ලොප් වුණු තැන ඇඟවීම සඳහා ඒ අකුරු පේළියට මඳක් ඉහළින් යෙදේ.

**නිදසුන් :**

අප'තර
පෙර'ඹර
හිර'වරණ

## ප්‍රශ්න ලකුණ (?)

ප්‍රකාශයක් ප්‍රශ්නයක් බව දැක්වීමට එහි අගට යෙදේ.

**නිදසුන් :**

පුතා ගෙදර ගියා ද?

මෙය කීයට ද ගත්තේ?

ඊයේ නිවාඩුවක් ලැබුණේ නැහැ?

## විස්මයාදි ලකුණ (!)

විස්මයක්, ආශිර්වාදයක්, ප්‍රාර්ථනයක්, හඬ නඟා කරන ආමන්ත්‍රණයක්, නොහොත් නියෝගයක්, හර්ෂයක්, ශෝකයක් ආදිය හඟවන ප්‍රකාශනයක කෙළවර යෙදේ.

**නිදසුන් :**

මොනවා, කතරගම දෙවියන් හැබැහින් දැකලා!
ඔබ හැමට නිදුක් නිරෝගි සුවය ලැබේවා!
මම සුවපත් වෙම්වා!
පුතේ! දරුවනේ!
නො නවතිවු, ඉදිරියට ම යවු!
ඒ ගැන අපට හතර හිනා!
අනේ ඔහුට වුණු දේ!

## ඇල ඉර (/)

විකල්ප ව්‍යවහාර දැක්වීමට යෙදේ.

**නිදසුන් :**

(i) මේස/තේ හැන්දෙන් දෙක බැගින් කෑමට පෙර/පසු බොන්න.

## වරහන්

විකල්ප ව්‍යවහාර දැක්වීමට යෙදේ.

**නිදසුන් :**

(i) පාර්ලිමේන්තුව පිහිටා ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර (කෝට්ටේ) ය.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : 9.0 | සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** | : 9.3 | දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. |
| **කාලච්ඡේද** | : 04යි. | |

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට නිර්මාණවලින් ධ්වනිත වන දේශාභිමානී හැඟීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අදාළ නිර්මාණවලින් මතු කෙරෙන අදහස් පැහැදිලි කරයි.
- නිර්මාණවලින් ඉස්මතු කෙරෙන දේශාභිමානී හැඟීම් අගය කරයි.
- අදාළ නිර්මාණවල දේශාභිමානය දනවීම සඳහා භාෂාව යොදා ගෙන ඇති අවස්ථා සාකච්ඡා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- තෝරා ගත් දේශාභිමානී ගීතයක්, කවියක් හා ගද්‍ය පාඨයක් ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- දේශාභිමානය හා දේශවාත්සල්‍යය යන්න පිළිබඳ ව ශිෂ්‍යයන්ට අවබෝධ කරවන්න.
- ඒ ඒ සාහිත්‍ය නිර්මාණ මගින් මතු වන දේශාභිමානය හා දේශවාත්සල්‍යය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් දන්නා **දේශාභිමානී ගීත**, කවි ගායනා කිරීමට අවස්ථාව සලස්වන්න.
- ඒ ඒ සාහිත්‍යය නිර්මාණ රස විඳීමේ දී දනෙන වීරත්වය, වාත්සල්‍යය, අභිමානය ඉස්මතු කිරීම සඳහා යොදා ගෙන ඇති කාව්‍යෝක්ති පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- උපමා, රූපක ධ්වනිතාර්ථ, එළිසමය, විරිත හා අනුප්‍රාසය යන කාව්‍යෝක්ති සඳහා උදාහරණ ගෙන පහදා දෙන්න.
- ජාතික ගීය ගායනා කර එහි අදහස පහදා දෙමින් එයින් මතු වන දේශාභිමානය හා දේශවාත්සල්‍යය පැහැදිලි කර ඊට ගරු බුහුමන් දක්වන ආකාරය පහදා දෙන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- දේශාභිමානය - ස්වකීය දේශය පිළිබඳ ව ඇති සාඩම්බර හැඟීම
- දේශවාත්සල්‍යය - දේශය පිළිබඳ ඇති ඇල්ම, ආදරය, ස්නේහය

**ගුණාත්මක යෙදවුම් :**

- දේශාභිමානී ගී ඇතුළත් හඬ පටයක්
- රට වෙනුවෙන් දිවි පිදූ වීරයන් කිහිප දෙනෙකුගේ ඡායාරූප හා නාමාවලියක්
- ජාතික උරුම කිහිපයක ඡායාරූප
- ජාතික ධජය ඇතුළත් පින්තූරයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේශාභිමානය හා දේශවාත්සල්‍යය යන හැඟීම් අවබෝධ කර ගෙන විස්තර කරයි.
- දේශාභිමානී ගී හා කවි ගායනා කරයි.
- දේශාභිමානී හැඟීම් ජනිත වන නිර්මාණ එක්රැස් කරයි.
- දේශාභිමානී හැඟීම් දනවන ආකාරයේ නිර්මාණවල යෙදෙයි.

**නිපුණතාව** : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- මාතෘකාව තෝරා ගනියි.
- උචිත පරිදි කරුණු සංවිධානය කරයි.
- මාතෘකාවට අදාළ දළ සැලැස්මක් සකස් කරයි.
- හරවත් තොරතුරු උපයෝගී කර ගනියි.
- භාෂාව නිවැරදි ව භාවිත කරයි.
- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් විවිධ මාතෘකා ඔස්සේ රචනා ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සරල මාතෘකාවක් ඉදිරිපත් කර ඊට අදාළ තොරතුරු සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කරන තොරතුරු පිළිවෙළකට පෙළ ගස්වන්න.
- ඒ තොරතුරු හැඳින්වීම, අන්තර්ගතය, යෝජනා හා අවසානය යන අනුමාතෘකා ඔස්සේ පෙළ ගස්වමින් සාකච්ඡා කරන්න.
- තොරතුරු නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කිරීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් සහ කාව්‍යෝක්ති යොදා ගත හැකි බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
- **ව්‍යූහගත රචනා හා නිර්මාණාත්මක රචනා** මාතෘකා කිහිපයක් ගෙන ඒ එක් එක් මාතෘකාව ඔස්සේ තොරතුරු සංවිධානය කර ගැනීම, කෙසේ කළ යුතු දැයි සාකච්ඡා කරන්න.
- රචනාවක දී සාරවත් භාවය, සංවිධානය, නිර්මාණාත්මක භාවය, ස්වීයත්වය, ශිල්පීය දක්ෂතා සහ ඡේද වෙන් කිරීම යන කරුණු පිළිබඳ ව සැලකිය යුතු බව පැහැදිලි කරන්න. (ඇමුණුම 01 යොදා ගන්න)

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබඳු
- **කුමාර රචනය** - ඒ. ඊ. එස්. දිසානායක
- **ප්‍රබන්ධ සංග්‍රහය** - කුමාරතුංග මුනිදාස
- **ප්‍රබන්ධෝපදේශය** - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාර්ථක රචනාවක් ලිවීමට සුදුසු මාතෘකාවක් තෝරා ගනියි.
- අදාළ තොරතුරු සංවිධානාත්මක ව පෙළ ගස්වයි.
- ව්‍යාකරණ රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.
- නිර්මාණශීලී ලේඛනයක් සඳහා විවිධ යෙදුම් භාවිත කරයි.

**ඇමුණුම 01**

**රචනා මාතෘකා**

01. ළමා සාහිත්‍යය, දරුවා අපූරු ලෝකයකට ගෙන යන සාහිත්‍යාංගයකි. ළමයින් උදෙසා කවි, කතා හා නාට්‍ය නිර්මාණය කරන්නට වෙහෙසුණු ලේඛකයෝ බොහෝ ය. ඔවුහු තම රචනා මගින් ළමා චරිතය සංවර්ධනය කරති. එබැවින් ළමා සාහිත්‍යය පෝෂණය කළ යුතු ය.

02. රූපවාහිනිය සහ පරිගණකය බොහෝ තොරතුරු ලබා ගත හැකි මාධ්‍ය බවට පත් වී ඇත. බොහෝ දරුවන් නාට්‍ය හා කාටූන් චිත්‍රපටවලටත් පරිගණක ක්‍රීඩාවලටත් නැඹුරු වීම නිසා ඔවුහු රූපවාහිනියෙන් හා පරිගණකයෙන් නිසි ඵල ප්‍රයෝජන නො ගනිති. අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි, ප්‍රධාන මෙවලම් ලෙස මෙම උපකරණ භාවිත කිරීම අත්‍යවශ්‍ය ය.

03. පරිසරය සුන්දර ව හා පිරිසිදු ව තබා ගන්නට අප වෙහෙසෙන විට පරිසරය ද අප නිරෝගී ව තබන්නට වෙහෙසෙයි. පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය නිසා අහිංසක සතුන් මරණයට පත්වන්නේ ඛේදනීය ආකාරයකට ය. අද ජීවත් වන සතුන් අනාගතයේ දී වඳ වී යාමට ඇති ඉඩකඩ බොහෝ ය. පරිසරය රකිමින් සතුන්ගේ ජීවිත ද රැක ගන්නට කැප වෙමු.

04. මවුපියන් දරුවන් රැක බලා ගන්නේ තම දෑස මෙනි. සිරිත් විරිත්, ගුණ දහම් හා නැණ නුවණින් පිරිපුන් දරුවකු සමාජයට දායාද කිරීම ඔවුන්ගේ එක ම පැතුම යි. එහෙත් ඇතැම් දරුවෝ ඉහළ රැකියාවලට ගොස් ගුණ දහම් හා සිරිත් විරිත් අමතක කරති. එයින් අසරණ වන්නෝ දෙමවුපියෝ ම ය. මේ තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරමු.

05. කඳු මුදුනකින් කුඩා දිය පහරක් ව උපත ලබන ගංගාවක් අතර මඟ දහසක් බාධක ද මිනිසුන්ගෙන් එල්ල වන ගැහැට ද සම සිතින් ඉවසමින් පරිසරයට තම යුතුකම් ද ඉටු කරමින් අවසන මුහුද කරා ළඟා වේ. ඔබ ගඟක් යැයි සිතා ගඟක කතාව තේමා කර ගනිමින් නිර්මාණාත්මක රචනාවක් ලියන්න.

**නිපුණතාව** : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : **11.2** සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කවි පෙළ තාල තබමින් ගායනා කරයි.
- කවි පෙළෙහි ව්‍යංග්‍යාර්ථ ඉස්මතු කර දක්වයි.
- කවි පෙළෙහි දක්නට ඇති කාව්‍යෝක්ති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කවි පෙළ රස විඳිමින් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙළපොතේ දැක්වෙන **දෑසේ නිල් පැහැය** කවි පෙළ කණ්ඩායම් වශයෙන් ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලස්වන්න.
- කිහිපවරක් ගායනා කිරීමෙන් පසු කවි පෙළ හා එහි කතුවරයා පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් මෙහෙය වන්න. (ඒ සඳහා ඇමුණුම යොදා ගන්න)
- ශිෂ්‍යයන් රස වින්දනයට යොමු කරන්න.
- කවිපෙළ සමාලෝචනය කරමින් අගය කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **රන්තැටියක කඳුළු** - දයාසේන ගුණසිංහ
- **සාහිත්‍යය විද්‍යාව** - එදිරිවීර සරච්චන්ද්‍ර

**මූලික වදන් හා සංකල්ප :**

- **ව්‍යංග්‍යාර්ථ**
  මතුපිටින් කියැවෙන අර්ථයට වඩා වෙනස් අරුතක් ප්‍රකාශ වීම

- **කාව්‍යෝක්ති**
  නිර්මාණ රසවත් කර ගැනීම සඳහා යොදා ගන්නා උපක්‍රම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිර්දිෂ්ට කවි පෙළ රිද්මානුකූල ව ගායනා කරයි.
- කවි පෙළෙහි අන්තර්ගතය පැහැදිලි කරයි.
- කාව්‍යෝක්ති උපුටා දක්වයි.
- ව්‍යංග්‍යාර්ථවත් යෙදුම් ඉදිරිපත් කරයි.
- කවි පෙළ රස වින්දනයේ යෙදෙයි.

ඇමුණුම

ශිෂ්‍යයන් සමග සාකච්ඡාවේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- කවි පෙළ උපුටා ගත් මුල් කෘතිය
- කතුවරයා
- කවි පෙළෙහි අන්තර්ගතය
- කවි පෙළෙහි රසවත් තැන්
- කවි පෙළෙහි ඇති කාව්‍යෝක්ති
- ව්‍යංග්‍යාර්ථ ඉස්මතු වන ස්ථාන
- කවි පෙළ රසාස්වාදය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේද
  - කවියාගේ අත්දැකීම/අනුභූතිය
  - එය ප්‍රකාශ කිරීමට යොදා ගෙන ඇති භාෂාව
  - කවියාගේ උත්සාහයේ සාර්ථක අසාර්ථක භාවය

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල :**

- භාෂාවේ භාවිත වන විවිධ පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විවිධ පද වර්ග පිළිබඳ දැනුම වාක්කෝෂය පෝෂණය සඳහා ඉවහල් වන බව පැහැදිලි කරයි.
- නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද වෙන් වෙන් ව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද අවස්ථෝචිත ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිංහල භාෂාවේ භාවිත විවිධ පද වර්ග පිළිබඳ ව සිහිපත් කරමින් **විශේෂණ පද** පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
- නාම පදයක් හෝ ක්‍රියා පදයක් හෝ විස්තර කරන පදය විශේෂණ පදයක් ලෙස හැඳින්වෙන බව පැහැදිලි කර දෙන්න. (ඒ සඳහා ඇමුණුම යොදා ගන්න)
- පෙළපොතේ යොදා ඇති පාඩමෙන් විශේෂණ පද සොයා ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- විශේෂණ පද භාවිත කිරීමෙන් ප්‍රකාශිත අර්ථය තවදුරටත් වර්ණනා කිරීමට හැකි වන බව පැහැදිලි කරන්න.
- නාම විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පද ඇතුළත් වගු සැකසීමට උපදෙස් දෙන්න.
- පෙළපොතේ ක්‍රියාකාරකම්වලට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

**සිංහල භාෂා ව්‍යාකරණය** - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ පද වර්ග අතර විශේෂණ පදවල ලක්ෂණ කියයි.
- විශේෂණ පද ප්‍රභේද හඳුනා ගෙන පැහැදිලි කරයි.
- විශේෂණ පද භාෂාව පෝෂණය සඳහා ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- විශේෂණ පද භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

ඇමුණුම

විශේෂණ පද දෙවර්ගයකි.

1. නාම විශේෂණ
2. ක්‍රියා විශේෂණ

- නාම පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යෙදෙන පද නාම විශේෂණ නම් වේ.
- ක්‍රියා පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යෙදෙන පද ක්‍රියා විශේෂණ නම් වේ.

| නාම විශේෂණ | ක්‍රියා විශේෂණ |
|---|---|
| **සුවඳ** මල | **වේගයෙන්** දුවයි |
| **විශාල** ගස | **හෙමින්** ගමන් කරයි. |
| **නිල්** අහස | **බියෙන්** වෙවුලයි. |
| **හොඳ** මිනිසා | **ලුහුඬින්** පවසයි. |

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **12.1** පද්‍ය රචනා නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- කැමති මාතෘකා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණයේ දී යොදා ගත හැකි කාව්‍ය උපක්‍රම පැහැදිලි කරයි.
- විවිධ අත්දැකීම් පාදක කර ගෙන මාතෘකානුකූල ව පද්‍ය නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සරල කවියක් ගායනා කරන්න.
  උදා : **නිල් අහස් තලේ, සමන්පිච්ච මල් ඉහිරුණු නිල් තණ කොළ පිට්ටනියක්** වැනි කාව්‍ය සඳහා පාදක අත්දැකීම් ශිෂ්‍යයන්ට ඇති බවත් ඒවා සිහිපත් කර ගැනීමටත්, අවස්ථාවක් ලබා දෙන්න.
- හිරු, සඳු, තාරකා, ගස්, වැල්, ගංගා, දිය ඇලි වැනි පරිසරයේ එදිනෙදා අප දකින අපූර්ව වස්තු තේමා කර ගැනීම කාව්‍ය නිර්මාණයට පහසු වන බව වටහා දෙන්න.
- එවැනි කෙටි කවි කිහිපයක් ශිෂ්‍යයන් ලවා නිර්මාණය කරවන්න.
- **'දෑසේ නිල් පැහැය'** කවි පෙළ කියවීමට අවස්ථාව සලසා දෙන්න.
- කවි පෙළෙහි යොදා ඇති
  කාව්‍ය ආකෘතිය
  උපයුක්ත භාෂාව සාකච්ඡා කරන්න.
- තමා ලැබූ අත්දැකීමක් පදනම් කර ගෙන **පද්‍ය කීපයක් නිර්මාණය** කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් ලියූ කවි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ප්‍රතිපෝෂණය කර සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **කවි ශික්ෂාව** - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කාව්‍ය නිර්මාණ සඳහා සුදුසු අත්දැකීම් ඉදිරිපත් කරයි.
- කාව්‍ය නිර්මාණ සඳහා සුදුසු කාව්‍ය උපක්‍රම විස්තර කරයි.
- කාව්‍යෝපක්‍රම හා උචිත ව්‍යංග්‍යාර්ථ භාවිත කර පද්‍ය නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතාව** : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල :**

- කියවීමේ දී නිවැරදි උච්චාරණයේ හා හඬ පාලනයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ලේඛනවල විවිධත්වය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කියවයි.
- අසන්නාගේ අවධානය ලබා ගත හැකි වන සේ කියවයි.
- අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවීමේ අගය ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර ගන්න.
- පෙළපොතේ පාඩම වෙත ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- නිවැරදි ව (ශබ්ද නගා) හඬ පාලනයෙන් යුතු ව කිය වූ පාඨයක් පටිගත කර හෝ ගුරුවරයා විසින් කියවා හෝ ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පෙළපොතේ පාඩම ශබ්ද නගා කියවීමට සෑම කණ්ඩායමකින් ම අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයෙකුට අවස්ථාව සලසන්න.
- අමතර කියවීම් සඳහා යොමු කළ කොටස් ද ඒ අයුරින් ම කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- විවිධ ලේඛන කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරන්න.
- අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවීමත්, නිවැරදි උච්චාරණයත්, හඬ පාලනයත් මගින් අසන්නාගේ අවධානය ලබා ගත හැකි වන අයුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **වන කතා** - යක්කඩුවේ පඤ්ඤාරාම හිමි
- **ප්‍රබන්ධ සංග්‍රහය** - කුමාරතුංග මුනිදාස
- **කථාමෘතය** - වැලිවිටියේ සෝරත හිමි
- **නල දමයන්ති** - කේ. බී. සුගතදාස

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශබ්ද නගා කියවීමේ දී අවබෝධයෙන් යුතු ව කියවිය යුතු බව ප්‍රකාශ කරයි.
- ලේඛනයේ ස්වභාවය අනුව හඬ පාලනයේ හා නිවැරදි උච්චාරණයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- කියවීමේ මූලධර්ම නිසි ලෙස භාවිත කිරීමෙන් අසන්නාගේ අවධානය ලබා ගත හැකි බව ප්‍රකාශ කරයි.
- නිවැරදි ක්‍රමවේද භාවිත කරමින් ලේඛන කියවයි.

**නිපුණතාව** : 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුක්ත ව ලියයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අක්ෂර වින්‍යාස රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ ලබා ගත් දැනුම භාවිත කරමින් ලේඛන නිවැරදි කරයි.
- නිවැරදි ව ලේඛන කාර්යයෙහි යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- **අක්ෂර වින්‍යාස රීති** පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ලේඛනවල අක්ෂර වින්‍යාස දෝෂ පවතින විට අදහස් ව්‍යාකූල වන අයුරු පැහැදිලි කර දෙන්න. (ඒ සඳහා ඇමුණුම 1 උපයෝගි කර ගන්න)
- අක්ෂර දෝෂ සහිත ලේඛන නිවැරදි කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න. (ඇමුණුම 2)
- එවැනි ලේඛන නිවැරදි කිරීමේ දී අක්ෂර වින්‍යාස රීති පිළිබඳ ලබා ගත් දැනුම උපයෝගී කර ගත හැකි බව පැහැදිලි කරන්න.
- ලේඛනයේ දී සිංහල අක්ෂර නිවැරදි ව භාවිත කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල ලේඛන රීතිය** (නව සංස්: 2015) - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ණ, න, ල, ළ, ශ, ෂ, ස අක්ෂර පිළිබඳ මූලික රීති ඉදිරිපත් කරයි.
- ණ, න, ල, ළ , ශ, ෂ, ස අක්ෂර නිවැරදි ලෙස භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීම අගය කරයි.
- භාවිතයේ දී හමු වන වැරදි වචන නිවැරදි කිරීමට යොමු වෙයි.

ඇමුණුම 1

**නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

01. මුළු රාත්‍රිය ම........................... තුළ නිදිවර්ජිත ව රැඳී සිටින ගොවියා ........................... ගොයම සතුන්ගෙන් ආරක්ෂා කරයි. (පැළ/පැල)

02. මග සලකුණු නොසලකා ........................... ගිය පිරිස බොරු ........................... ගැන නො දැන එහි වැටී තුවාල ලැබූහ. (වළ/වල)

03. ධර්ම ශාලාවට පිවිසි ........................... භික්ෂූන් වහන්සේට ........................... නමා වැන්දෝ ය. (දණ/දන)

04. ........................... අලියාගේ එක් කකුළක් ........................... වී ඇති අයුරු පශු වෛද්‍යවරයාගේ අවධානයට ලක් විය. (වණ/වන)

ඇමුණුම 2

**නිවැරදි පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

01. ........................... (උශ්ණාධික/උෂ්ණාධික) ආහාර ගැනීමෙන් වළකින ලෙස වෛද්‍යවරයා රෝගියාට අවවාද කළේ ය.

02. එදිනෙදා ගමන් බිමන් පහසු කර ගැනීම සඳහා ........................... (දක්ෂිණ/ දක්ශින) අධිවේගී මාර්ගය ජනතාවට මහගු මෙහෙයක් සපයයි.

03. සිංහල විෂය සඳහා ශිෂ්‍යයන් ලබා ගෙන ඇති ලකුණු ........................... (අවරෝහණ/අවරෝහන) පිළිවෙළට සැකසීමට ගුරුවරයා සිතුවේ ය.

04. ලංකාවට ........................... (ආවේනික/ආවේණික) සත්ත්ව හා ශාඛ විශේෂ කිහිපයක් දක්නට ඇත.

05. ........................... (ධර්මිෂ්ඨ/ධර්මිෂ්ට) සමාජයක් උදෙසා කැපවීම ජාතියක වගකීමකි.

06. ........................... (දෘෂ්ටි, දෘශ්ටි) ඌනතාවෙන් පෙළෙන අය වෙනුවෙන් ඇස් කණ්ණාඩි නොමිලේ ලබා දීමට තරුණ සංවිධානයක් කටයුතු කරයි.

07. දිනාගත් නිදහස ආරක්ෂා කර ගැනීමට සියලු ජනතාව ........................... (අධිශ්ඨාන. අධිෂ්ඨාන) කර ගත යුතු බව ජනාධිපතිතුමා අවධාරණය කළේ ය.

08. ........................... (ප්‍රවීණ/ප්‍රවීන) කලාකරුවන්ගේ සේවය ඇගයීම සඳහා උපහාර උළෙලක් සංවිධානය කිරීමට සංවිධාකයෝ පෙළ ගැසුණහ.

09. ශ්‍රී පාදස්ථානය වන්දනා කළ පිරිස හිරු උදාවේ ........................... (ආශ්චර්යය/ආස්චර්යය) අමන්දානන්දයට පත් වූහ.

10. ........................... (කනිෂ්ඨ/කනිෂ්ට) සේවයන්ගේ ද වැටුප් වැඩි කිරීමට ආයතන ප්‍රධානියා ගත් තීරණය සියලු දෙනාගේ ම පැසසුමට ලක් විය.

**නිපුණතාව** : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.2 විවිධ ශෛලියෙන් රචිත පොතපත කියවයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- පොතපත කියවීමේ දී භාවිත වන විවිධ ශෛලි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ ශෛලි රස ජනනයට හේතු වන බව පැහැදිලි කරයි.
- විවිධ ශෛලිවලට අනුගත වෙමින් කියවයි.
- කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවිය හැකි සාහිත්‍ය කොටස් කියවීම ආදර්ශනය කරන්න.
- පෙළපොතෙහි පාඩමේ ඇතුළත් **පුරාතන ගද්‍ය සාහිත්‍ය** කොටස් කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඒවා විවිධ ශෛලියෙන් කියවීමට හැකි බව පෙන්වා දෙන්න.
- සියලු ම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- තවත් ඡේද කිහිපයක් කියවීමට යොමු කරන්න. (ඒ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.)
- භාෂා ශෛලියෙහි විවිධත්වය හඳුන්වා දෙන්න.
- ස්වභාවෝක්ති, අතිශයෝක්ති යොදා ගැනීම අවධාරණය කරන්න.
- කියවීමේ නිපුණතාව සාධනය කළ හැකි කියවීමේ තරගයක් සංවිධානය කර ක්‍රියාත්මක කරන්න.

**මූලික වදන් හා සංකල්ප :**

- ස්වභාවොක්ති - යමක් ලෝක ස්වභාවයේ පවතින ආකාරයෙන් ම පැවසීම
- අතිශයෝක්ති - ලෝක ස්වභාවය ඉක්ම වන අයුරින් පැවසීම

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල සාහිත්‍ය 1, 2** - ආනන්ද කුලසූරිය
- **ජාතක කතා විමසුම** - මාර්ටින් වික්‍රමසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ශෛලියෙන් රචිත පොතපත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ ශෛලි නිසා රස ජනනය වන බව ප්‍රකාශ කරයි.
- විවිධ ශෛලියෙන් රචිත පොතපත කියවයි.
- කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.

ඇමුණුම - 1

''එකල්හි දිවසරන් බඳු සතළිස් දහසක් නළුවෝ සව් බරණින් සැදි පසගතුරු ගෙනැ මහ පුරිසා පිරවරා නැටුම්, ගැයුම් පැවැත් වූහ. එකෙණෙහි මහ බෝසතාණෝ නිදන්නට වන්හ. ඔවුන් නිදනසේ දැක තමන් තමන් ගත් පසග තුරුයෙහි වැතිර හෙවැ නිදන්නට වන්හු. එකල්හි මහ බෝසතාණෝ පිබිද යහන් මත්තේ පලක් බැඳ හුන්නාහු ගඳ තෙල දිලිසෙන පහනින් නිදිගත් මාගමුන්, නැහැ හඬවනුන්, මියෙන් වැහෙන කෙළින් තෙත් සිරුරු ඇතියවුන්, දත් කනුවන්, වළකට ඇතියවුන්, කස්නවුන්, වලප්නවුන් නොමුවහ රහස් පියෙස් ඇතියවුන්, දුගඳ වා විහිදනුවන් දැක, සංවේග කොට...'' **(අමාවතුර)**

''අතීතයෙහි බරණැස් නුවර සතළිස් කෙළක් ධන ඇති සිටක්හුගේ දිට්ඨමංගලිකා නම් එක ම දුවක් වුව. ඕ යහපත, පැහැපත, රූපත හෝ රූප සම්පතින්, කුල සම්පතින්, භෝග සම්පතින් සම්පන්න වන බැවින් බොහෝ දෙන විසින් පතන ලද ...'' **(අමාවතුර)**

''ඉක්බිති ත්‍රෛ ලෝකාචාර්ය වූ, අනාචාර්ය වූ, ධර්ම චක්‍රවර්තී වූ, ධර්මධ්වජ වූ, ත්‍රිභුවන චූඩාමාණික්‍ය වූ, දශබලධාරී වූ, විශාරද වූ, අසම සම වූ අප්‍රති පුද්ගල වූ, ආශ්චර්ය නිධාන වූ, සමන්තභද්‍ර වූ අකුතෝභය වූ, ලෝකාලෝක දිවාකර වූ, මුළු ලොවට පිහිට වූ, ලෝක ස්වාමී වූ, නේත්‍රෝත්සවයට නිධාන වූ, ස්වාමිදරුවාණන් වහන්සේ...'' **(බුත්සරණ)**

''යටගිය දවස රජගහ නුවර එක් මගධ රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. එකල්හි මහ බෝසතාණෝ මෘග යෝනියෙක්හි ඉපැද මෘග සමූහයා විසින් පිරිවරණ ලදු ව වනයෙහි වාසය කරන්නාහ. ඉක්බිත්තෙන් ඒ බෝධිසත්වයන්ගේ නැගණියෝ තමන්ගේ පුතණුවන් එතැනට කැඳවා ගෙන අවුත්'බෑයන් වහන්ස, නුඹ වහන්සේගේ බෑනණුවනුත් මෘග මායම් ඉගැන්නුව මැනවැ'යි කිවූ ය. මහා බෝධිසත්වයෝ යහපතැ'යි නැගණියන්ට ප්‍රතිවචන දී යවා 'දරුව, අසවල් වේලේ ඇවිත් උගනුව'යි කීහ. ඒ මෘග පෝතකයාට ද මයිලණුවන් විසින් නියම කොට කී වේලා නොයික්මවා බෝධිසත්වයන් කරා එළඹ, මෘග මායම් උගන්නේ ය...'' **(පන්සිය පනස් ජාතක පොත)**

''සිටු දුවණියෝත් පුතණුවන් ගසා ගන්ට බස්නා උකුස්සා දැක අත්ලෙන් අත්ල ගසා අරගල කළහ. උකුස්සාත් අරගල අසා ගත නො හී අලුත උපන් කුමාරයන් ගසා ගත, ඔබින් දරුවෝත් නැත. මෙතෙර සිටි කුමාරයෝ මෑණියන් ගං මැද සිට අත ඔසවා ලා අරගල කළා දැක අසා තමන් කැඳවතී යන්නක් කර්ම බලයෙන් සිතා ගෙන මෑණියන් එන තුරුත් නො රඳා වහා දියට බටවු ය. බැස ත් තමන්ට, දිය බොහෝ හෙයින් වතුරේ ගිය හ. එලෙසින් මෙ ගොඩ සිටි පුතණුවෝත් නැත. සිටු දුවණියෝ ද අතුරු මග දී රක්ෂා කළ සමුණෝ මළෝ ය. බාල දරුවන් උකුස්සෙක් ගසා ගත වැඩි මලු දරුවෝ දියෙන් ගියෝ ය'යි හඬමින් වලපමින් යන තැනැත්තෝ සැවත් නුවර සිට එන කොනකුන් දැක කොයි සිට එවු දැ'යි විචාරා සැවැත් නුවර අසවල් වීදියේ ම නම් සිටු කුලයෙක් ඇත...'' **(සද්ධර්මරත්නාවලිය)**

**නිපුණතාව** : 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.2 ප්‍රායෝගික භාෂා කාර්ය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.
- අකාරාදි පිළිවෙළ යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- අකාරාදි පිළිවෙළ නිවැරදි ව භාවිත කරමින් නාමාවලි සකස් කරයි.
- ශබ්දකෝෂ භාවිතයේ දී අකාරාදිය පිළිබඳ දැනුම ප්‍රායෝගික ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් කිහිප දෙනෙකු ලවා සිංහල අක්ෂර මාලාව මතකයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිංහල හෝඩිය ලියූ පුවරුවක් මගින් ශිෂ්‍යයන්ට ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- **අකාරාදි පිළිවෙළ** යනු අක්ෂර මාලාවේ අනුපිළිවෙළ ම බව ශිෂ්‍යයන්ට පැහැදිලි කර දෙන්න.
- අකාරාදි පිළිවෙළ ප්‍රායෝගික ව භාවිත වන අවස්ථා පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරවන්න.
  - ශබ්දකෝෂවල හා විශ්වකෝෂවල වචන පෙළගැස්වීම
  - දූරකථන නාමාවලිය, ඡන්ද ලැයිස්තු ආදි නාමාවලි සැකසීම
  - පුස්තකාලවල ග්‍රන්ථ නාමාවලි සකස් කිරීම
  - ග්‍රන්ථ සූචි සකස් කිරීම
  - විවිධ අවස්ථාවල අනුකොටස් නම් කිරීම
- අකාරාදි පිළිවෙළ භාවිත කිරීමේ ප්‍රයෝජන උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.
- ශබ්දකෝෂ කිහිපයක් ශිෂ්‍යන්ට ලබා දී වචන සෙවීමේ කණ්ඩායම් ක්‍රියාකාරකමක නිරත කරවන්න.
- අපිළිවෙළට ලියූ නම් ලැයිස්තු කිහිපයක් කණ්ඩායම්වලට ලබා දී ඒවා අකාරාදි පිළිවෙළට සකස් කිරීමේ අභ්‍යාසයක යොදවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය**
- **විශ්වකෝෂය (කාණ්ඩයක්)**

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් කියයි.
- අකාරාදි පිළිවෙළ යොදා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ශබ්දකෝෂ පරිහරණය පහසු කර ගැනීම සඳහා අකාරාදි පිළිවෙළ භාවිත කරයි.
- නම් ලැයිස්තු අකාරාදි පිළිවෙළට සකස් කරයි.

**නිපුණතාව** : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ව්‍යාපාරික ලිපි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ව්‍යාපාරික ලිපියක මූලිකාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ග්‍රාහකයා ආකර්ෂණය වන පරිදි ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- යෝග්‍ය ආකෘතිවලට අනුව ව්‍යාපාරික ලිපි ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- එදිනෙදා ජීවිතයේ දී අපට ලිවීමට සිදුවන ලිපි පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මෙම ලිපි පෞද්ගලික, රාජකාරි හා ව්‍යාපාරික ලිපි වශයෙන් විවිධාකාර බව පෙන්වා දෙන්න.
- පෞද්ගලික ලිපි, රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපිවලින් බෙහෙවින් වෙනස් වන බවත්, එම වෙනස ලිපියෙහි අන්තර්ගතයෙන් මෙන් ම ආකෘතියෙන් ද පැහැදිලි වන බවත් නිදසුන් මගින් පෙන්වා දෙන්න.
- රාජකාරි ලිපි හා ව්‍යාපාරික ලිපි ආකෘතියෙන් සමාන වුව ද කාර්ය අතින් වෙනස් බව පෙන්වා දෙන්න.
- ව්‍යාපාරික ලිපි මගින් ව්‍යාපාරිකයා හා පාරිභෝගිකයා හා අතර තොරතුරු හුවමාරුව සිදු වන බව පෙන්වා දෙන්න. (ඒ සඳහා ඇමුණුම 1 හා 2 යොදා ගන්න)
- වෙළෙඳ ආයතනයක් මගින් යවන ලද ව්‍යාපාරික ලිපියක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට සලස්වන්න.
- ව්‍යාපාරික ලිපිය කරුණු සංක්ෂිප්ත ව, පැහැදිලි ව හා නිරවුල් ව, ඉදිරිපත් කළ යුතු බව පෙන්වා දෙන්න.
- පෙළපොතේ **ව්‍යාපාරික ලිපි** පාඩම ඇසුරෙන් ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ව්‍යාපාරික ලිපියක මූලිකාංග පැහැදිලි කරයි.
- ව්‍යාපාරික ලිපි භාවිත වන අවස්ථා පැහැදිලි කරයි.
- ග්‍රාහකයා ආකර්ෂණය වන අයුරින් ව්‍යාපාරික ලිපි ලිවිය යුතු බව පිළිගනියි.
- විවිධ අවස්ථාවන්ට අදාළ ව ව්‍යාපාරික ලිපි ලියයි.

**ඇමුණුම 01**

මදුර පොත් ප්‍රකාශකයෝ,
අංක 228,
දෙවන පටුමග,
කොළඹ 02.
2016.03.18

විදුහල්පති,
ම/ප/මල්වත්ත මහ විදුහල,
මහනුවර.

**පොත් ප්‍රදර්ශනයක් සහ පොත් අලෙවි සැලක් පැවැත්වීම**

1. අප සමාගම දිවයිනේ විවිධ පාසල්වල පොත් ප්‍රදර්ශන හා පොත් අලෙවි සැල් පවත්වමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, ගුරු භවතුන්ට හා දෙමව්පියන්ට ඉතා වටිනා දුර්ලභ ගණයේ පොත් දැක බලා ගැනීමටත් සහන මිලට ලබා ගැනීමටත් අවස්ථාව සලසා ඇත.

2. පාසල් විෂය මාලාවට අනුකූල ව ලියන ලද පොත්පත් ද මෙම ප්‍රදර්ශනය හා අලෙවි සැල් සඳහා ඉදිරිපත් කෙරේ.

3. මිලදී ගන්නා සෑම පොතක් සඳහා ම 10% - 20% දක්වා වූ වට්ටටම් හිමි වනු ඇත.

4. පොත් අලෙවියෙන් ලබන ආදායමෙන් 05%ක් පාසල් පුස්තකාල සංවර්ධන අරමුදලට ලබා දීමට කටයුතු කෙරේ.

මෙම සත්කාර්යය සඳහා ඔබ පාසලේ අනුග්‍රහය ලබා දෙන මෙන් කාරුණික ව ඉල්ලමි.

අලෙවි කළමනාකරු,
මදුර පොත් ප්‍රකාශකයෝ

**ඇමුණුම 02**

විදුහල්පති,
ම/ප මල්වත්ත මහ විදුහල,
මහනුවර.
2016.04.05

අලෙවි කළමනාකරු,
මධුර පොත් ප්‍රකශකයෝ,
දෙවන පටුමග,
කොළඹ 02.

**පොත් ප්‍රදර්ශනයක් සහ පොත් අලෙවි සැලක් පැවැත්වීම**

උක්ත කරුණ යටතේ 2016.03.18 දිනැති ඔබගේ ලිපිය හා බැඳේ.

පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමටත් දැනුම වැඩි දියුණු කර ගැනීමටත් පාසල් පුස්තකාලය සංවර්ධනය කර ගැනීමටත් හැකි වෙතියි යන අපේක්ෂාවෙන් පොත් ප්‍රදර්ශනයක් හා අලෙවි සැලක් පැවැත්වීමට පාසල් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

එබැවින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතුවලට බාධා නො වන පරිදි පොත් ප්‍රදර්ශනය හා පොත් අලෙවි සැල පැවැත්වීමට අවසර ලබා දෙන අතර සුදුසු දිනයක් තීරණය කර ගැනීම සඳහා සතියේ දිනක ප. ව. 1.30න් පසු මා හමුවන ලෙස කාරුණික ව දන්වමි.

විදුහල්පති,
ආර්. ඒ. සමරකෝන්

**නිපුණතාව** : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කිරීමේ අවශ්‍යතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්මාණශීලී ව හා ආකර්ෂණීය ලෙස ආරාධනා පත්‍ර සකස් කරයි.
- ජීව දත්ත ඇසුරු කරගෙන ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.
- ප්‍රායෝගික ලේඛන මගින් සුවිශේෂ අවශ්‍යතා ඉටු කර ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විවිධ අවස්ථා සඳහා සකස් කරන ලද **ආරාධනා පත්‍ර** කිහිපයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- ආරාධනා පත්‍ර, භාවිත කරනුයේ මංගල උත්සව, ගෙවදීමේ උත්සව, ත්‍යාග ප්‍රදානෝත්සව, ක්‍රීඩා උත්සව, පොත් එළි දැක්වීමේ උත්සව ආදිය සඳහා බව පැහැදිලි කර දෙන්න.
- ආකර්ෂණීය බව ආරාධනා පත්‍රයක තිබිය යුතු විශේෂ ලක්ෂණයක් බව පැහැදිලි කරන්න.
- අවස්ථාවට අනුව ආරාධනා පත්‍රයෙහි ඇතුළත් විය යුතු අංග පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරන්න. (විවිධ ආරාධනා පත්‍ර ඇසුරෙන්) ඇමුණුම 1 යොදා ගන්න.
- ශිෂ්‍යයන් ලවා ආරාධනා පත්‍ර සකස් කරවන්න.
- විවිධ අවශ්‍යතා සඳහා සම්පූර්ණ කිරීමට සිදු වන **ආකෘති පත්‍ර** පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ආකෘති පත්‍රයක ඇතුළත් විය යුතු මූලික කරුණු ශිෂ්‍යයන්ගේ අවධානයට යොමු කරන්න. (ඇමුණුම 2 යොදා ගන්න)
- ආකෘති පත්‍ර පිරවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර විවිධ අවශ්‍යතා සඳහා ආකෘති පත්‍ර කිහිපයක් සකස් කර වන්න.
- සකස් කරන ලද ආකෘති පත්‍ර ශිෂ්‍යයන් ලවා සම්පූර්ණ කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- එක්රැස් කර ගත් විවිධ ආරාධනා පත්‍ර හා ආකෘති පත්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- ආරාධනා පත්‍රවල අරමුණ හා අඩංගු විය යුතු කරුණු විස්තර කරයි.
- නිර්මාණශීලී ව හා ආකර්ෂණීය ලෙස ආරාධනා පත්‍ර සකස් කරයි.
- විවිධ ආකෘති පත්‍ර නිවැරදි ව සකස් කොට සම්පූර්ණ කරයි.

**ඇමුණුම 01**

- ආරාධනයේ අරමුණු
- පැවැත්වෙන ස්ථානය, දිනය, වේලාව ඉස්මතු වන ආකාරයට අවධාරණය කිරීම
- වැඩසටහන
- ඇරයුම කරන්නාගේ නම
- ලිපිනය හා දිනය

**ඇමුණුම 2**

- ජීවදත්ත තොරතුරුවලට අමතර ව ඇතුළත් විය යුතු කරුණු :
  - පළාත
  - දිස්ත්‍රික්කය
  - මැතිවරණ කොට්ඨාසය
  - පොලිස් බල ප්‍රදේශය
  - පළාත් සභා බල ප්‍රදේශය
  - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
  - ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය

ආකෘතියේ ස්වභාවය අනුව මෙම කරුණු අදාළ කර ගත හැකි ය.

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.3 භාෂා ව්‍යවහාරයේ සමාජීය විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- විවිධ වෘත්ති හා බැඳුණු භාෂා ව්‍යවහාර පවතින බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- භාෂා ව්‍යවහාරය මගින් විවිධ වෘත්තීන්හි අනන්‍යතාව පළ කරන බව පැහැදිලි කරයි.
- ධීවර භාෂා ව්‍යවහාරය පිළිබඳ දැනුම සන්නිවේදන කාර්ය පහසු කර ගැනීම සඳහා යොදා ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ඇමුණුමෙහි සඳහන් විස්තරය කල් ඇතිව කියවා ශිෂ්‍යයන්ට අවබෝධ කර දෙන්න.
- භාෂාවේ විවිධ ව්‍යවහාර පිළිබඳ ශිෂ්‍යයන්ට කරුණු පැහැදිලි කර දෙන්න.
- විවිධ වෘත්තීන් අනුව ඒ ඒ පළාත්වල භාවිත කරන වචන හා ව්‍යවහාර ගැන ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- හඳුනා ගත් වචන හා ව්‍යවහාර භාවිත කරමින් අර්ථවත් වාක්‍ය ශිෂ්‍යයන් ලවා නිර්මාණය කරවන්න.
- පෙළපොතේ **ධීවර භාෂාව** ගැන ලියවුණු පාඩම ඇසුරෙන් ධීවර ජනතාව භාවිත කරන වචන හා ව්‍යවාහර උපුටා දක්වා ඒවායේ පොදු ව්‍යවහාර ලිවීමට සලස්වන්න. (මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඉටු කළ හැකි ය.)
- ධීවර ජනතාව අතර භාවිත වචන හා ව්‍යවහාර ඇසුරෙන් සංවාදයක් ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- එම සංවාද පරීක්ෂා කර ලකුණු පවරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **ධීවර භාෂාව** - ඔරුක්මාන්කුලමේ චන්ද්‍රන හිමි.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- භාෂාවක පවතින විවිධ ප්‍රාදේශික ව්‍යවහාර නම් කරයි.
- ධීවර භාෂාවේ භාවිත වන ව්‍යවහාර ඉදිරිපත් කරයි.
- ධීවර භාෂාව ඇසුරු කරගෙන සංවාද ගොඩ නගයි.
- ධීවර භාෂාවේ වචන හා ව්‍යවහාර සන්නිවේදනය කාර්යය සඳහා යොදා ගනියි.

ඇමුණුම

## භාෂා ව්‍යවහාර

ඕනෑම භාෂාවක විවිධ ව්‍යවහාර පවතියි. ලේඛනය හා භාෂණය ඉන් ප්‍රධාන වේ. ලිවීම සඳහා යොදා ගන්නේ ලේඛන ව්‍යවහාරයයි. භාෂණය සඳහා යොදා ගන්නේ භාෂණ ව්‍යවහාරයයි.

භාෂණ ව්‍යවහාරය එම භාෂාව කතා කරන සියල්ලන්ගේ ම එක සමාන නැත. එය කතා කරන පිරිස ජීවත් වන සමාජයේ භූගෝලීය සාධක අනුව ද රැකියා අනුව ද වෙනස් වේ. ප්‍රාදේශීය වශයෙන් වෙනස් ව්‍යවහාර භාෂාවේ දක්නට ලැබේ. නිදසුනක් ලෙස සිංහල භාෂාවේ දකුණු පළාත් ව්‍යවහාර, අනෙක් ප්‍රදේශවල ව්‍යවහාරයට වඩා වෙනස් වේ. එවැනි විවිධ ප්‍රදේශවල පවත්නා එවැනි වෙනස්කම්, ප්‍රාදේශීය ව්‍යවහාර ලෙස හැඳින්වේ.

යම් යම් රැකියා අනුව භාවිත කරන ව්‍යවහාර පරිමිත භාෂා ව්‍යවහාර නම් වේ. නිදසුන් ලෙස ධීවර භාෂාව, කමත් භාෂාව, හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා දැක්විය හැකි ය.

**නිපුණතාව** : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.1 නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- නාම පදවල උක්ත, අනුක්ත රූප හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- උක්ත, අනුක්ත වශයෙන් නාම පද ලැයිස්තු ගත කරයි.
- භාෂා කාර්යයේ දී උක්ත අනුක්ත රූප නිවැරදි ව යොදයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නාම පදයක් **උක්ත අනුක්ත රූප** දෙකේ, ඒක වචන බහු වචන වශයෙන් වෙනස් ව යෙදෙන අයුරු පෙන්වන්න. (ඇමුණුම 01 භාවිත කරන්න)
- විවිධ නාම (සචේතන අනියමාර්ථ, සචේතන රූප ගැන්වූ අප්‍රාණවාචී පද හා සර්වනාම පද) උක්ත අනුක්ත රූපවල යෙදෙන අයුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- විවිධ උක්ත පද හා අනුක්ත පද සැකසෙන ආකාරය හුණු පුවරුවේ ලියා පෙන්වන්න. (ඇමුණුම 2 භාවිත කරන්න)
- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකට උක්ත පද ඉදිරිපත් ලෙසත් අනෙක් කණ්ඩායමට ඒවාට අයත් අනුක්ත පද ඉදිරිපත් ලෙසත් උපදෙස් දෙන්න.
- වාක්‍යයක උක්ත පද හා අනුක්ත පද නිවැරදි ව යෙදිය යුතු ආකාරය පැහැදිලි කර දෙන්න.
- උක්ත පද හා අනුක්ත පද යෙදිය යුතු ආකාරය දැක්වෙන පෙළපොතේ අභ්‍යාසවල ද ඔබ විසින් නිර්මාණය කර ගන්නා ලද අභ්‍යාසවල ද ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබඳු
- **සිංහල ලේඛන රීතිය (නව සංස්: 2015)** - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- උක්ත පදයක හා අනුක්ත පදයක ස්වරූපය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නාම පද උක්ත අනුක්ත වශයෙන් වෙන්කර දක්වයි.
- වාක්‍යයක උක්ත අනුක්ත පද නිවැරදි ව යොදයි.
- උක්ත අනුක්ත පද භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

ඇමුණුම 1

| නාම පද වර්ග | උක්ත පද | | අනුක්ත පද | |
|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| සචේතන නාම පද | මිනිසා<br>කාන්තාව<br>බල්ලා | මිනිස්සු<br>කාන්තාවෝ<br>බල්ලෝ | මිනිසා<br>කාන්තාව<br>බල්ලා | මිනිසුන්<br>කාන්තාවන්<br>බල්ලන් |
| සචේතන අනියමාර්ථ නාම පද | මිනිසෙක්<br>කාන්තාවක්<br>බල්ලෙක් | -<br>-<br>- | මිනිසකු/මිනිසෙකු<br>කාන්තාවක<br>බල්ලකු/බල්ලෙකු | -<br>-<br>- |
| සචේතන සර්ව නාම පද | මම<br>නුඹ/තෝ/ඔබ<br><br>හේ/ඔහු<br>ඕ/ඇ | අපි<br>නුඹලා/තෙපි/ඔබ<br><br>ඔවුහු<br>ඔවුහු | මා<br>නුඹ/තා/ඔබ<br><br>ඔහු<br>ඇය | අප<br>නුඹලා/තොප<br>ඔබ<br>ඔවුන්<br>ඔවුන් |
| අචේතන නාම පද | ගංගාව<br>රීතිය | ගංගා<br>රීති | ගංගාව<br>රීතිය | ගංගා<br>රීති |
| අචේතන අනියමාර්ථ නාම පද | ගංගාවක්<br>රීතියක් | -<br>- | ගංගාවක්<br>රීතියක් | -<br>- |
| සචේතන රූප ගැන්වූ නාම පද | -<br>- | ගංගාවෝ<br>රීතීහු | -<br>- | ගංගාවන්<br>රීතීන් |

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල :**

- සන්නිවේදනයේ දී සංයමයෙන් යුතු ව සවන් දීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ආචාරශීලී ව කථනයේ යෙදෙයි.
- පැහැදිලි ලෙස අදහස් ප්‍රකාශ කරමින් සන්නිවේදනයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පන්තියේ ශිෂ්‍යයන් කුඩා කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සංවාද ඇතුළත් සුදුසු හඬ පටයකට සවන් දීමට සලස්වන්න.
- පහත සඳහන් අවස්ථා භූමිකා රංගනයෙන් ඉදිරිපත් කිරීමට පවරන්න.
  - තම නිවසේ පැවැත්වෙන දානමය පුණ්‍ය කර්මයකට පන්සලේ භික්ෂූන් වහන්සේලාට ආරාධනය කරන අවස්ථාවක්
  - මුහුදු මාළු අල්ලන බෝට්ටුවක සිටින පිරිසක් අතර සිදුවන සංවාදයක්
  - ගොවීන් පිරිසක් එක් ව කරන කතා බහක්
  - රජයේ කාර්යාලයකට යන මගියෙක් තම ගැටලුව නිලධාරියෙකුට ඉදිරිපත් කිරිම
  - විදුහල්පතිතුමා හමු වූ ශිෂ්‍යයන් පිරිසක්
- භූමිකා රංගනය සඳහා සූදානම් වීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දී ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- කතාබහේ දී භාවිත කළ යුතු උචිත වචන පිළිබඳවත් පවත්වා ගත යුතු සංයමය පිළිබඳවත් උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සංවාද ඇතුළත් හඬ පටයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කතාබහ සඳහා අවස්ථාවට උචිත පරිදි සුදුසු වචන තෝරා ගනියි.
- සංයමයෙන් යුතු ව සවන් දෙයි.
- සංයමයෙන් යුතු ව කතාබහේ යෙදෙයි.
- ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතාව** : 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- කුමාරතුංග මුනිදාස මහතා භාෂාවේ අභිවෘද්ධියට කළ සේවය පැහැදිලි කරයි.
- කුමාරතුංග මුනිදාස මහතා පළ කළ භාෂා විෂයික අදහස් පැහැදිලි කරයි.
- කුමාරතුංග මුනිදාස මහතාගේ සාහිත්‍ය නිර්මාණවල දක්නට ලැබෙන සුවිශේෂ භාෂා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.
- කුමාරතුංග මුනිදාස මහතාගේ ළමා සාහිත්‍ය නිර්මාණ රස විඳ අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- කුමාරතුංග මුනිදාස මහතාගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කරමින් එතුමා හඳුනා ගැනීමට සලස්වන්න.
- එතුමා පිළිබඳ ව ශිෂ්‍යයන් දන්නා තොරතුරු විමසන්න.
- මුනිදාස මහතාගේ ජීවන තොරතුරු ද පාදක කර ගනිමින් එතුමාගෙන් භාෂාවට සිදු වූ සේවය පැහැදිලි කරන්න. (ඇමුණුම 1හි තොරතුරු ද යොදා ගන්න)
- සිංහල භාෂාව පිළිබඳ ඔහු තුළ තිබූ වියත් දැනුම, එතුමා පළ කළ ග්‍රන්ථ මගින් හෙළි වන අයුරු පෙන්වා දෙන්න.
- සිංහල භාෂාවේ අභිවෘද්ධිය සඳහා ඔහුගෙන් සිදු වූ සේවය සාකච්ඡා කරන්න.
- සිංහල භාෂාව 'ඇ' කාරය ඇති ව භාවිත කිරීමට ශෛලියක් (හෙළ බස් වහර) හඳුන්වා දීම ආදී විශේෂ ලක්ෂණ පෙන්වා දෙන්න. (ඇමුණුම 2 යොදා ගන්න)
- පෙළපොතේ පාඩම ආශ්‍රයෙන් කුමාරතුංග මුනිදාස මහතාගේ භාෂා මෙහෙවර පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **කුමාරතුංග මුනිදාස** මහතාගේ ඡායාරූපයක්
- එතුමා විසින් රචිත ග්‍රන්ථ කිහිපයක් **හීන් සැරය, මඟුල් කෑම, කියවන නුවණ, කුමර ගී)**

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කුමාරතුංග මුනිදාසයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- කුමාරතුංග මුනිදාස සූරීන්ගේ ශාස්ත්‍රීය සේවය අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.
- කුමාරතුංග මුනිදාස සූරීන්ගේ ලේඛනවල භාෂා ව්‍යවහාර හා භාෂා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- හෙළ හවුලේ බස් වහර විවිධ භාෂා කාර්ය සඳහා උචිත පරිදි භාවිත කරයි.

**ඇමුණුම 1 :**

**ජීවන තොරතුරු**

| | |
|---|---|
| උපත : | ක්‍රි. ව. 1887 ජූලි මස 25 දින මාතර දික්වැල්ල වැවුරුකන්නල දික්හේන ග්‍රාමයේ දී උපත ලැබී ය. |
| අධ්‍යාපනය : | වැවුරුකන්නල පිරිවෙනින් මූලික අධ්‍යාපනය ලැබූ අතර දික්වැල්ල බෞද්ධ මිශ්‍ර පාඨශාලාව සහ මාතර ශාන්ත තෝමස් විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබී ය. |
| වෘත්තීය ජීවිතය : | 1907 දී ගුරු අභ්‍යාස විද්‍යාලයට ඇතුළත් විය. 1909 දී ගුරු පුහුණුව ලැබීමෙන් අනතුරු ව බෝමිරියේ ද්විභාෂා පාඨශාලාවේ ආචාර්යවරයකු වශයෙන් පත් විය. පසු ව කඩුගන්නාවේ රජයේ පාසලේ මුල් ගුරු තනතුරු දරා දැවුරුද්දක් පාඨශාලා පරීක්ෂකවරයකු ලෙස කටයුතු කළේ ය. එමෙන් ම සිද්ධාර්ථ ගුරු අභ්‍යාස විද්‍යාලයේ ද කෙටි කලක් විදුහල්පති තනතුර ද දැරී ය. |
| ශාස්ත්‍රීය සේවා : | කුමාරතුංග මුනිදාස මහතා විසින් සංස්කරණය කරන ලද පොත් සංඛ්‍යාව 35කට අධික ය '**හත්පණ**' '**මඟුල් කෑම**' '**හීන්සැරය**' යන රසවත් ළමා සාහිත්‍යය කෘති ද ''**කුමර ගී,** කාව්‍ය නිර්මාණ ග්‍රන්ථ ද සිදත් සඟරා විවරණය, ක්‍රියා විවරණය, ව්‍යාකරණ විවරණය ආදි ව්‍යාකරණ ග්‍රන්ථ ද එතුමා විසින් රචිත ග්‍රන්ථ අතර වේ. |
| සිංහල පුවත්පත් : සඟරා | කුමාරතුංග මුනිදාස මහතා පුවතපත් හා සඟරා ක්ෂේත්‍රයට එළඹෙන්නේ නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලයේ දී ආරම්භ කළ '**පහන**' සඟරාවෙනි. '**ලක්මිණි පහනේ**' සම්පාදක තනතුරට පත් වූ ඔහු විසින් 1959 දී '**සුබස**' සඟරාව අරඹන ලදී. |
| විපත : | ක්‍රි. ව. 1944 මාර්තු මස 02 දින<br>(මාර්තු 2 වන ''සිංහල භාෂා දිනය' ලෙස නම් කර ඇත්තේ ද එතුමාගේ ගුණානුස්මරණය නිමිති කරගෙන ය) |

**ඇමුණුම 2**

**උදාහරණ :**

දිග හූවෙක් ඇසෙන්නට වියැ. ඒ, මා පෙරැ එ තරම් අසා පුරුදු හිවල් හූව නො වේ. නො බැසැ මැ, නො නැගැ මැ, එක් පමණට පැවැති තියුණු හඬෙකි.

(**කියවන නුවණ** - කුමාරතුංග මුනිදාස)

- හෙළ හවුල නමින් ගුරු කුලයක් බිහි කිරීම
- පාරිභාෂික වචන සඳහා හෙළ වදන් හඳුන්වා දීම

**උදාහරණ :**

(උණමනුව - උණ කටුව, රජය, හෙදිය, යතුරු පැදිය)

**නිපුණතාව** : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.4 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- වාක්‍ය නිර්මාණයේ දී සම්මත රීති අනුගමනය කළ යුතු ආකාරය පැහැදිලි කරයි.
- සම්මත රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- 8 වන ශ්‍රේණියේ දී උගත් වන ලද වාක්‍ය රීති පිළිබඳ පෙර දැනුම පරීක්ෂා කරන්න.
- **වාක්‍ය රීති** පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එවැනි වාක්‍ය කිහිපයක් ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- 9 ශ්‍රේණියේ දී උගත යුතු **වාක්‍ය රීති** පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කරන්න. ඒ සඳහා ඇමුණුම යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල ලේඛන රීතිය** (නව සංස්කː 2015) - ජාතික අධ්‍යාපන ආයතනය
- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබදු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ලේඛනයේ දී විවිධ වාක්‍ය රීති භාවිත වන බව ප්‍රකාශ කරයි.
- අදහස් නිරවුල් ව ප්‍රකාශ කිරීම සඳහා වාක්‍ය රීති යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරයි.
- සම්මත රීති භාවිත කරමින් වාක්‍ය ලියයි.
- සම්මත රීති නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

ඇමුණුම

**නිත්‍ය බහු වචන පද**

අයෙක්, ඇතැමෙක්, කවරහු, කවුරු, කෙනෙක්, දෙන, සමහරු, සමහරෙක්, යමෙක්, හැම, අය යන පද නිත්‍ය බහු වචන වේ. මේවා වාක්‍යයක උක්තය ලෙස යෙදුණ විට ආඛ්‍යාතය (ක්‍රියා පදය) බහු වචනයෙන් තැබිය යුතු ය.

උදා :

1. **අයෙක්** සෙත් පැතුහ.
2. **ඇතැමෙක්** ශ්‍රමදානයට සහභාගි වූහ.
3. **කවරහු** මේ විශ්‍රාම ශාලාව කළෝ ද?
4. **කවුරුන්** මේ කටයුත්තේ නියැළෙන්නේදැයි මම නොදනිමි.

5. **කෙනෙක්** පුස්තකාලයට ගොස් පොත් කියැවූහ.

6. **බොහෝ** දෙන ඔහු පිළිගැනීමේ අභාලාෂයෙන් පසු වූහ.

7. **සමහරු** මාර්ග සංඥා නො සලකා රිය පදවති.

8. **සමහරෙක්** වැඩ වර්ජනය කළහ.

09. **යමෙක්** උනන්දුවෙන් පොත පත කියවති.

10. **ඇතැම් අය** රෝගීන්ට ඇප උපස්ථාන කළහ.

ආණ, අණු, අණි යන ගෞරවාර්ථ ප්‍රත්‍යය සමග ඕ, ප්‍රත්‍යය යෙදෙන විට ආඛ්‍යාතය බහු වචන වේ.

උදා :

- ආණ - අණු පුරුෂ ලිංග නාම සමග යෙදේ.
  වෙළෙඳ + ආණ + ඕ = වෙළෙඳාණෝ
  වෙළඳාණෝ භාණ්ඩවලට සාධාරණ මිල ගණන් ඉදිරිපත් කළහ.

  පුත් + අණු + ඕ = පුතණුවෝ
  පුතණුවෝ මහලු මවුපියන් රැක බලා ගත්හ.

- අණි ප්‍රත්‍යය ස්ත්‍රී ලිංග ප්‍රත්‍ය ලෙස යෙදෙයි.
  උදා :
  දුව + අණි + ඕ = දුවණියෝ
  දුවණියෝ යුහුසුලු ව කාර්යයෙහි නිරත වූහ.

- වහන්සේ, දෑ යන පද නාම පද සමග වාක්‍යයක උක්තය ලෙස යෙදුණු විට ආඛ්‍යාතය (ක්‍රියා පදය) බහු වචනයෙන් තැබිය යුතු ය.

  උදා :
  මැණියන්දෑ දරුවන් පෝෂණය කරන දෑ ය./කරති.
  තෙරුන් වහන්සේ දහම් දෙසූ සේක./දෙසති.

- ප්‍රාණවාචී නාම සමූහාර්ථවාචී පද සමග යෙදෙන විට ආඛ්‍යාතය (ක්‍රියා පදය) බහු වචනයෙන් යෙදේ.
  උදා :
  මුව රළ වනය අලංකාර කරති.
  අලි රංචුව වගාව පාළු කළහ.
  සොර මුළ ගම් පහරති.
  ඇත් රංචුව කැලය දෙවනක් කරති.

- අප්‍රාණ වාචී නාම ශබ්දයක් සමග සමූහාර්ථවාචී පද යෙදෙන විට ආඛ්‍යාතය ඒක වචන වේ.
  උදා :
  තරු කැල අහසේ දිදුලයි.
  තුරු පෙළ ඉදිරි වැටෙයි.
  දද පෙළ සුළඟට ලෙළදෙයි.
  මල් පොකුර සුවඳ විහිදුවයි.

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.5 විවිධ නායකයන්ගේ චරිත කථා පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ආනන්ද කුමාරස්වාමි විද්වතාණන් පිළිබඳ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.
- ඔහුගෙන් ශාස්ත්‍රීය හා කලා ක්ෂේත්‍රයට සිදු වී ඇති සේවය පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- විවිධ නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරමින් භාෂා කුසලතා ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- අපේ සංස්කෘතික දායාදයන් වූ කලා ශිල්ප, ජන සාහිත්‍ය හා හෙළ බස පිළිබඳ ව පර්යේෂණයන්හි යෙදුණු විද්වතුන් ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් මෙහෙවමින් පාඩමට පිවිසෙන්න.
- කුමාරතුංග මුනිදාස, සෙනරත් පරණවිතාන, මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර යන විද්වතුන්ගෙන් සිදු වූ මෙහෙය ඇගයීමට ලක් කරන්න.
- **ආනන්ද කුමාරස්වාමි** මහතා ගැන පහත සඳහන් කරුණු යටතේ තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් මෙහෙයවන්න. මේ සඳහා ඇමුණුම 1 හා පෙළ පොතේ පාඩම උපයෝගී කර ගන්න.
  - ආනන්ද කුමාරස්වාමි මහතා ජන්ම ලාභය ලැබූ දිනය
  - මව
  - පියා
  - අධ්‍යාපනය
  - ලබාගත් තනතුරු
  - කළ සේවය
  - සම්පාදිත ග්‍රන්ථ
  - ඔහුගේ අවසන් කාලය හා ජීවිතයෙන් සමුගැනීම

**ගුණාත්මක යෙදවුම් :**

- **පූජිත ජීවිත** - රංජිත් අමරකීර්ති පලිහපිටිය, අමරසිරි පොන්නම්පෙරුම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ආනන්ද කුමාරස්වාමි මහතාගේ ජීවන තොරතුරු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කුමාරස්වාමි මහතාගෙන් ශාස්ත්‍රිය හා කලා ක්ෂේත්‍රයට සිදු වී ඇති සේවය අගය කරමින් කතා කරයි.
- කුමාරස්වාමි මහතාගේ ජීවන තොරතුරු එක්රැස් කරයි.
- විවිධ පුද්ගලයන්ගේ චරිත කතා පරිශීලනය කිරීමට යොමු වෙයි.

ඇමුණුම 1

- ආනන්ද කෙන්ටිශ් කුමාරස්වාමි
- 1877 අගෝස්තු 22 වන දා කොළඹ කොල්ලුපිටියේ දී උපත ලැබී ය.
- මුතු කුමාරස්වාමි මහතා ඔහුගේ පියා වූ අතර ඉංග්‍රිසි ජාතික කාන්තාවක් වූ එලිසබෙත් ක්ලේ බිබි මැතිණිය මව වූවා ය.
- ඔහු ළපටි වියේ පටන් තරුණ විය තෙක් හැදුණේ වැඩුණේ එංගලන්තයේ දී ය.
- ලන්ඩනයේ වයික්ලිෆ් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාළ ඔහු ද්විතීය අධ්‍යාපනය හදාරන ලද්දේ භූ ගර්භ විද්‍යාව පිළිබඳවයි.
- ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ලතින්, ග්‍රීක්, සංස්කෘත හා පාලි භාෂාන්තර ඥානයෙහි විශිෂ්ටත්වයට පත් හෙතෙම සිංහල, දෙමළ, හින්දි, පර්සියානු, ඉතාලි, ස්පාඤ්ඤ හා ඕලන්ද භාෂා පිළිබඳ ව ද යම් දැනුමක් ලද්දේ ය.
- ලන්ඩන් විශ්වවිද්‍යාලයේ භූ ගර්භ විද්‍යාව හා උද්භිද විද්‍යාව පිළිබඳ පළමු පෙළේ උපාධියක් දිනා ගත්තේ ය.
- අනතුරුව එම විශ්වවිද්‍යාලයේ ම පර්යේෂකයෙකු වශයෙන් කටයුතු කළ එතුමා යළි අප රටට පැමිණියේ ලංකාවේ ඛණිජ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙනි.
- 1900 දී ඔහු සිය ප්‍රථම ශාස්ත්‍රීය ලේඛනය 'ලංකාවේ කඳු හා මිනිරන්' මැයෙන් භූ විෂමතා සංගමයේ වාරික සංග්‍රහය ඉදිරිපත් කළේ ය.
- 1908 දී ඔහු ඉදිරිපත් කළ ''**මධ්‍ය කාලීන සිංහල කලා**'' කෘතිය වෙනුවෙන් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධියක් පිරිනැමිණි.
- එතුමා රචනා කළ කෘති අතර 1929 ''**බුදු පිළිමයේ උපත**'' නම් ග්‍රන්ථය ද 1938 දී ''**ඉන්දියාවේ, මධ්‍යම ආසියාවේ හා ලංකාවේ බිතු සිතුවම්**'' ග්‍රන්ථය ද අගනා පර්යේෂණ ග්‍රන්ථ අතර වෙයි.

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ක්ෂණික කතාවක තිබිය යුතු ලක්ෂණ පැහැදිලි කරයි.
- නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.
- අසන්නන්ගේ අවධානය යොමු වන පරිදි කතා කරයි.
- ස්වාධීන කථන ශෛලියක් ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ක්ෂණික කතාවක් කිරීමේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් අරඹමින් පාඩමට පිවිසෙන්න. (ඇමුණුම 1)
- **මාතෘකානුකූල ව ක්ෂණික කතා** ඉදිරිපත් කිරීමට සිදු වනුයේ කුමන අවස්ථාවල දී ද යන්න පැහැදිලි කරන්න.
- නිශ්චිත කාල රාමුවක් තුළ කතා කිරීමට සිදු වන බැවින් අනවශ්‍ය කරුණුවලින් බැහැර වී වැදගත් ම කරුණු පමණක් අන්තර්ගත කර ගත යුතු බව අවධාරණය කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර ගන්න.
- ඇමුණුම 2හි සඳහන් කර ඇති මාතෘකා කණ්ඩායම්වලට ලබා දී ඒ ඒ මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ගොනු කරගත් කරුණු උපයෝගී කර ගෙන මාතෘකාවට අදාළ ව ක්ෂණික කතා ඉදිරිපත් කිරීමට අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයන් කිහිප දෙනෙකුට අවස්ථාව සලසා දෙන්න.
- **මාතෘකානුකූල ව ක්ෂණික කතා** ඉදිරිපත් කිරීමේ දී ශිෂ්‍යයන් නිවැරදි උච්චාරණය, හඬ පාලනය හා අසන්නන්ගේ අවධානය යොමු වන පරිදි කතා කිරීම අත්‍යවශ්‍ය සාධක බව ශිෂ්‍යයන්ට අවබෝධ කර දෙන්න.
- ස්වාධීන කථන ශෛලියක් හුරු කර ගත යුතු බවත් ප්‍රසිද්ධ කථකයන් අනුකරණය කිරීමට වඩා ඔවුන්ගෙන් ආභාසය ලබා ගැනීම අවශ්‍ය වන බවත් පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලියට අදාළ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛය (48/2012 - අධ්‍යාපන අමාත්‍යාංශය)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ක්ෂණික කතාවක තිබිය යුතු ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- මාතෘකාවට අනුව කතා කිරීමේ අවශ්‍යතාව විස්තර කරයි.
- කථනයේ දී, නිවැරදි උච්චාරණය, හඬ පාලනය හා අසන්නන්ගේ අවධානය ලබා ගැනීම අත්‍යවශ්‍ය සාධක බව ප්‍රකාශ කරයි.
- මාතෘකාවට අනුව අවස්ථෝචිත ව ක්ෂණික කතා ඉදිරිපත් කරයි.

ඇමුණුම 1

- මාතෘකාවට අදාළ කරුණු ක්‍රමානුකූල ව ඉදිරිපත් කිරීම
- පැහැදිලි නිවැරදි උච්චාරණය, හැඟීම් ප්‍රකාශනය හා සංයමය
- ඉදිරිපත් කෙරෙන කරුණු තහවුරු කිරීම හා අවධාරණය කිරීම පිණිස අවස්ථෝචිත ව සිදු වන අංග චලනය
- ආරම්භයේ සිට අවසානය තෙක් කතාවේ සන්දර්භයට අදාළ වන සිත් ගන්නා සුලු බව.
- නියමිත කාලයට කතාව සීමා කිරීම
- එක ම කරුණු නැවත නැවත ඉදිරිපත් නො කිරීම

ඇමුණුම 2

- පහත සඳහන් තේමා යටතේ මාතෘකා සකස් කර ගන්න.
    - පොදු දේපළ
    - ළමා පරපුර
    - ජාතික වීරයෝ
    - සාරධර්ම සුරැකීම
    - පරිසරය
    - ස්වභාව සෞන්දර්ය
    - සාමය
    - සාහිත්‍යය

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.4 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- කර්තෘ කාරක හා කර්ම කාරක වශයෙන් වාක්‍ය වර්ග දෙකක් ඇති බව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- වාක්‍ය නිර්මාණයේ දී සම්මත රීති අනුගමනය කළ යුතු ආකාරය පැහැදිලි කරයි.
- සම්මත රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සකර්මක හා අකර්මක කර්තෘ කාරක වාක්‍ය කිහිපයක් ප්‍රදර්ශනය කරන්න. ඒ සඳහා ඇමුණුම 01 යොදා ගන්න.
- එම වාක්‍යවල කර්තෘ පද හා කර්ම පද වෙන් කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- එම වාක්‍යවල ක්‍රියා පද යෙදී ඇත්තේ උක්ත කර්තෘට අනුව බවත් එම නිසා ''**කර්තෘ කාරක වාක්‍ය**'' ලෙස හඳුන්වන බවත් සිසුන්ට අවබෝධ කරවන්න.
- කර්ම පදය සහිත වාක්‍යවල කර්මය උක්ත ව ලිවිය හැකි ආකාරය ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එහි දී කර්තෘ කාරක වාක්‍යවල සිදු වන වෙනස් වීම ගැන අවධාරණය කරන්න. ඒ සඳහා ඇමුණුම 2 උපයෝගී කර ගන්න.
- කර්මය උක්ත කර ලිවිය හැකි වාක්‍ය **කර්ම කාරක වාක්‍ය** ලෙස හඳුන්වන බව පැහැදිලි කරන්න.
- කර්මකාරක වාක්‍ය බවට හැරවිය හැක්කේ කර්ම පදය සහිත වාක්‍ය පමණක් බව වටහා දෙන්න.
- ඇමුණුම 3හි සඳහන් වාක්‍ය අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට අවකාශ සලසා දෙන්න.
- එම කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට ද කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට ද හරවා නැවත ලිවීමට උපදෙස් දෙන්න.
- ඒ අනුව කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරක වාක්‍ය බවට පත් කිරීමේ දී සිදු වන වෙනස්වීම් පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කර්තෘ උක්ත වන වාක්‍ය කර්තෘ කාරක වාක්‍ය බව ප්‍රකාශ කරයි.
- කර්තෘ කාරක වාක්‍ය සකර්මක හා අකර්මක වාක්‍ය ලෙස වෙන් කර දක්වයි.
- සකර්මක වාක්‍ය පමණක් කර්මකාරකයට හැරවිය හැකි බව ප්‍රකාශ කරයි.
- කර්ම කාරක වාක්‍ය යොදා ගනිමින් ලේඛන කාර්යයේ දී භාෂාව රසවත් ව භාවිත කරයි.

**ඇමුණුම 01**

01. අම්මා දරුවා නළවයි.
02. ගස  වැටෙයි.
03. මිනිස්සු පාරක් කපති.
04. මල්ලී හයියෙන් සිනාසෙයි.
05. ගොවියෝ කුඹුරු කොටති.
06. වැද්දෝ කැළයට යති.
07. උපාසිකාව බණ පොත කියවයි.
08. පොලීසිය සොරුන් අල්ලයි.
09. ගල පෙරළෙයි.
10. ළමයා පොත කියවයි.

**ඇමුණුම 02**

| | | |
|---|---|---|
| නිදː 'ගොවියෝ | ගවයන් | බඳිති' |
| (කර්තෘ) | (කර්මය) | (ක්‍රියාව) |

යන වර්තමාන කාල වාක්‍යය  කර්ම කාරකයට හැරවීමේ දී සිදු වන වෙනස් වීම්

| | | |
|---|---|---|
| 1. | උක්ත කර්තෘ අනුක්ත කරන්න. | ගොවියෝ  - ගොවියන් |
| 2. | 'විසින්' නිපාතය එකතු කරන්න | ගොවියන් විසින් |
| 3. | අනුක්ත කර්මය උක්ත කරන්න. | ගවයන් - ගවයෝ |
| 4. | උක්ත කර්මය කාලය හා වචනයට ගැළපෙන පරිදි ආඛ්‍යාතය තබන්න. | බඳිති/බැඳෙති/බැඳෙත්/බඳිනු ලබති/ බඳිනු ලැබෙති |

- ගොවියන් විසින් ගවයෝ බැඳෙති/බැඳෙත්/බඳිනු ලබති/බඳිනු ලැබෙති.

ඇමුණුම 3

පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

| | වර්තමාන කාල වාක්‍ය | අතීත කාල වාක්‍ය |
|---|---|---|
| 1. | ළමයා ගස් සිටුවයි. | ළමයා ගස් සිටවූයේ ය. |
| 2. | වැද්දෝ මීවද කඩති. | වැද්දෝ මීවද කැඩූහ. |
| 3. | ගොවියා හේන වපුරයි. | ගොවියා හේන වැපුරුවේ ය. |
| 4. | තොටියා ඔරුව පදියි. | තොටියා ඔරුව පැද්දේ ය. |
| 5. | පියා දරුවන් රකියි. | පියා දරුවන් රැක්කේ ය. |

පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.

| | වර්තමාන කාල | අතීත කාල |
|---|---|---|
| 1. | කුරුල්ලන් විසින් කූඩු සෑදෙයි. | කුරුල්ලන් විසින් කූඩු සෑදිණි. |
| 2. | ළමයා විසින් රූපවාහිනිය නරඹනු ලබයි. | ළමයා විසින් රූපවාහිනිය නරඹනු ලැබිණි. |
| 3. | දූරිය විසින් ගී ගැයෙයි. | දූරිය විසින් ගී ගැයිණි. |
| 4. | ගොවීන් විසින් රට සරු කරනු ලබයි. | ගොවීන් විසින් රට සරු කරනු ලැබිණ. |
| 5. | පාලකයා විසින් සේවකයෝ පැසසෙති. | පාලකයා විසින් සේවකයෝ පැසසුණහ. |

**නිපුණතාව** : 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.3 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ළමා සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ළමා සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා පැහැදිලි කරයි.
- අද්‍යතන ළමා සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් වර්ධනය කර ගත් භාෂා හැකියා ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් දන්නා ළමා කවි පිළිබඳ විමසමින් ඒවා ගායනා කිරීමට සලස්වා පාඩමට ප්‍රවේශ වන්න.
- ළමා සාහිත්‍යය පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න. (ඇමුණුම 01)
- **ළමා පද්‍ය නිර්මාණ** පිළිබඳ සාකච්ඡා කරන්න. (ඇමුණුම 02)
- පෙළපොතේ පාඩම ඇසුරු කර ගෙන පද්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **කුමර ගී** - කුමාරතුංග මුනිදාස
- **කෝමළ රේඛා** - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ළමා සාහිත්‍යය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- ළමා පද්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා විස්තර කරයි.
- ප්‍රකට ළමා පද්‍ය නිර්මාණකරුවන් නම් කරයි.
- ළමා කවි ගායනය හා රස වින්දනයේ යෙදෙයි.
- සරල ළමා කවි නිර්මාණය කරයි.

**ඇමුණුම 01**

**ළමා සාහිත්‍යය**

ළමයින්ගේ කියවීම සඳහා සම්පාදිත ගද්‍ය, පද්‍ය, නාට්‍ය ආදී නිර්මාණ ළමා සාහිත්‍යය නමින් හැඳින් වෙයි. අකුරු හුරු කරගත් අවධියේ පටන් දෙළොස් වන විය වන තෙක් වයස් සීමාව ගත කරන පිරිස උදෙසා සම්පාදනය වන සාහිත්‍යාංග මේ ගණයට අයත් වේ. ළමා සාහිත්‍යය, යොවුන් සාහිත්‍යය කෘතිවලින් වෙනස් විය යුතු ය. ඒවා ළමයින්ගේ බුද්ධිය, රසඥතාව, භාෂා ඥානය, පෝෂණය කෙරෙන අයුරින් සම්පාදනය වීම අපේක්ෂිත ය. පරිසරය, සත්ත්ව ලෝකය, ස්වභාව ධර්මය විස්මය, චමත්කාරය, ළමයින්ට සමීප වදන්, ළමා අත්දැකීම්, කෙටි විරිත් ළමා නිර්මාණවල විශේෂ ලක්ෂණ වේ.

**ඇමුණුම 2**

**ළමා පද්‍ය නිර්මාණකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ**

**ආනන්ද රාජකරුණා**

**හඳ** - රන් පිඟාන ලෙස වටකුරු
දිලිහි දිලිහි තිබෙන අපූරු
හඳ හාමියෙ! හඳ හාමියෙ!
කිරිත් පැණිත් දියෝ! දියෝ!

**තාරකා** - දිලිහි දිලිහි
ආකාසේ
බබළන මල්
තාරකා

බැබළි බැබළි
ආකාසේ
දිලිහෙන මල්
තාරකා

**කුරුල්ලෝ** - ගීතිකා
වෝ රසයි.
හා කුරුල්
ලන්ගෙ දෝ?

**එස් මහින්ද හිමි**

| | | | |
|---|---|---|---|
| රාත්‍රිය | - | සමන් පිච්ච මල්ඉහිරුණු | |
| | | නිල් තණ කොළ | පිට්ටනියක් |
| | | වගෙයි අහස අන්න | බලනු |
| | | කොච්චර ලස්සන ද | රෑට |

| | | | |
|---|---|---|---|
| හඳ | - | හුරතල් පොඩි හා | පැටවා |
| | | අරගෙන උකුලේ | සිඳුවා |
| | | කිරි වතුරින් | නාවාලා |
| | | හඳ හාමි මේ | එනවා |

**ජී. එච්. පෙරේරා**

| | | | |
|---|---|---|---|
| දරු නැළවිල්ලක් | - | ලංකාවට වුණු තින් | දා |
| | | එහෙම පිටින් හළ හින් | දා |
| | | අපෙ ගජබා නර තින් | දා |
| | | ඇඳින ගතින් පුතණුන් | දා |
| | | | |
| | | සිරි සඟබෝ රජු එදී | නේ |
| | | දුගියා හට සිය අති | නේ |
| | | දුන්නා හිස ගලවමි | නේ |
| | | සාදු කියාපන් පුතු | නේ |

**කුමාරතුංග මුනිදාස**

| | | | |
|---|---|---|---|
| හාවාගේ වග | - | හා හා හරි | හාවා |
| | | කැලේ මැදින් | ආවා |
| | | හිටගෙන ගඟ | ගාවා |
| | | වටපිට ඇහැ | ලෑවා |

| | | | |
|---|---|---|---|
| මල් බස් | - | ගස අග | නා |
| | | අර රඳ | නා |
| | | මලට ම | නා |
| | | බොහොම සි | නා |

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- භාෂාවේ භාවිත වන විවිධ පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විවිධ පද වර්ග පිළිබඳ දැනුම වාක්කෝෂය පෝෂණය සඳහා ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- විවිධ පද අර්ථවත් ව හා අවස්ථෝචිත ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- භාෂාවේ පද වර්ග පිළිබඳ ශිෂ්‍යයන් කලින් උගත් කරුණු සාකච්ඡා කර ශිෂ්‍යයන් තුළ පෙලඹවීමක් ඇති කරන්න.
- **තනි පද හා බහු අර්ථ පද** හඳුන්වා දී උදාහරණ මගින් පැහැදිලි කරන්න.
- ලේඛනයේ දී මේ පද අර්ථවත් ව භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- පෙළපොතේ පාඩම්වලින් තනි පද හා බහු අර්ථ පද සොයා ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට වෙන් කර ඇමුණුම 1හි සඳහන් වචන ද උපයෝගී කර ගෙන තනි පද හා බහු අර්ථ පද එක්රැස් කිරීමට සලස්වන්න.
- එම කණ්ඩායම් දෙකට ම එම වදන් යොදා වාක්‍ය තැනීමට කෙටි පැවරුමක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබඳු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- භාෂාවේ විවිධ පද වර්ග ඇති බව ප්‍රකාශ කරයි.
- තනි පද හා බහු අර්ථ පද වෙන් වෙන් ව පැහැදිලි කරයි.
- තනි පද හා බහු අර්ථ පද සඳහා උදාහරණ සපයයි.
- තනි පද සහ බහු අර්ථ පද පිළිබඳ දැනුම භාවිත කර භාෂා කාර්යයෙහි යෙදෙයි.

**ඇමුණුම 01**
**තනිපද**

විවිධ අර්ථ සහිත පද කිහිපයකින් යුක්ත යෙදුමක් හෝ වාක්‍යාංශයක් සඳහා ඒ වෙනුවට යෙදිය හැකි, ඒ අර්ථ සියල්ල කැටිකොට ගත් ප්‍රකාශයකින් යුක්ත පද, තනි පද ලෙස ව්‍යවහාර වේ. එමගින් අදහස් රාශියක් ඉක්මනින් හුවමාරු කර ගැනීමට හැකි වන අතර භාෂාවේ සංක්ෂිප්ත භාවය ද ආරක්ෂා වේ.

උදාහරණ :

- අනුන් විසින් පෝෂණය කළ - පරපුටු
- අවුරුද්දක් පාසා පැවැත් වෙන - සාංවත්සරික
- උසට ගැළපෙන මහතින් යුත් - ආරෝහපරිණාහ
- කැළෑවේ ඉබේ හටගන්නා ගින්න - ළැව්ගින්න
- කිසිවකුට දෙවන නොවන - අද්විතීය
- කිසිම ප්‍රයෝජනයකට නැති - නිෂ්ප්‍රයෝජන
- කෙළෙහි ගුණ නොසලකන - අකෘතඥ
- ගලින් නිමවන ලද - ශෛලමය
- දියෙහි උපන්නා වූ - ජලජ
- දුරදිග බලා කටයුතු කරන - දූරදර්ශි

බහු අර්ථ පද

එක ම පදයකින් අර්ථ කිහිපයක් ප්‍රකාශ වේ නම් එබඳු පද බහු අර්ථවත් පද වේ. මෙබඳු පදවලින් ප්‍රකාශ වන නිශ්චිත අර්ථය නිවැරදි ව අවබෝධ කර ගැනීමට නම් එම වචනය යෙදී ඇති වාක්‍ය පරිසරය ද අවබෝධ කර ගත යුතු වෙයි.

උදාහරණ :

- අඟ - ජලය, මව, ස්ත්‍රිය, අඟ (ගෙඩි) වලාකුළ
- උතුරු - උතුම්, උත්තර, උතුරු (දිසාව)
- කර - අත, හොඬ, බෙල්ල
- කල් - ස්ත්‍රිය, කාලය, යහපත
- ගත - ශරීරය, ග්‍රන්ථය, වෛර
- දන - දේපළ, ධනය, සම්පත, ජනයා
- දද - කොඩි, මෝඩ, දද (වණ), බමුණා
- දිය - ජය, ලුණුව, ලෝකය, (දෙන්න)
- නා - ඇතා, නාගයා, නාගස, නායක
- වත - මුහුණ, වස්ත්‍රය, ව්‍රතය, කථාව

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල :**

- සවන් දුන් වැඩ සටහනෙහි ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සවන්දීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- සවන් දී අවශ්‍ය තොරතුරු රැස් කර ගනියි.
- රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත ව යොදා ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සවන්දීමේ වැදගත්කම තහවුරු කරන්න.
  - **සවන්දීම** තොරතුරු ලබා ගැනීමේ මූලික ක්‍රමයකි.
  - මනාව සවන් දීමෙන් බොහෝ දේ ඉගෙන ගත හැකි ය.
  - සවන්දීම සඳහා හොඳ පුරුද්දක් ඇති කර ගත යුතු ය.
- ඇමුණුම 01හි සඳහන් පැවරුම ශිෂ්‍යයන්ට කල් ඇති ව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් විසින් සකස් කරන ලද නිර්මාණ බිත්ති පුවත්පතක ප්‍රදර්ශනය කරන්න.
- ඒවා කියවීමටත්, ඇගයීමටත් අනෙක් ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුවන් විදුලියට සවන් දී රැස් කර ගත් තොරතුරු, කථනයෙන් ඉදිරිපත් කිරීමට අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයන් කිහිප දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාවධාන ව සවන් දීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ගුවන් විදුලියට සවන් දී වැදගත් කරුණු සටහන් කර ගනියි.
- රැස් කර ගත් තොරතුරු ඇසුරින් නිර්මාණකරණයේ යෙදෙයි.
- අන් අයගේ නිර්මාණ කියවා බලා රස විඳිමින් අදහස් දක්වයි.

**ඇමුණුම**
**පැවරුම**

- නිවසේ දී ගුවන් විදුලියට සවන් දී රැස්කර ගත් තොරතුරු ගොනුවක් ලෙස සකසා ගෙන එන්න. පහත වගුව අනුව ගොනුව පිළියෙල කරන්න.

| | |
|---|---|
| ගුවන් විදුලි නාලිකාව | |
| වැඩ සටහනේ නම | |
| ප්‍රචාරය වූ වේලාව | |
| ඉගෙන ගත් කරුණු | |

- සවන් දුන් තොරතුරු ඇසුරෙන් කවි, ගීත, චිත්‍ර, පොස්ටර් ආදිය නිර්මාණය කරන්න.

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධතිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට ලේඛනය කියවා සංස්කෘතික දායාද හා හර පද්ධති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට ලේඛනයේ ඇතුළත් සංස්කෘතික අංගවලින් මතු වන සාරධර්ම අගය කරයි.
- අනාගත පරපුරට සංස්කෘතිකාංග පවරා දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව ලියවුණු ලිපි ලේඛන පරිශීලනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් දහම් පාසලේ දී හා තම පන්සලේ දී ලබා ගත් අත්දැකීම් ඇසුරු කර ගෙන වාර්ෂික ව පැවැත්වෙන **කඨින පූජෝත්සවය** පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න. එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  - වස් ආරාධනය
  - චීවර මාසය
  - කඨින පෙරහැර
  - කඨින චීවරය
  - කඨින දානය
  - වස්සාවාසික චීවර
  - කඨිනානිශංස ධර්ම දේශනය

- ශිෂ්‍යයන් කණ්ඩායම්වලට වෙන් කර ඉහත මාතෘකා අනුපිළිවෙළින් ලබා දී පාඩම ඇසුරින් විස්තර ලිවීමට යොමු කරන්න.
- ශිෂ්‍යයන් ලියූ කරුණු සමාලෝචනය කරන්න.
- කඨින පූජෝත්සවයක් සඳහා ශිෂ්‍යයන් සහභාගි කරවන්න.
  මෙහි දී වෙනත් ආගම්වල ශිෂ්‍යයන් සිටී නම් ඔවුන් සමග සංහිඳියාවෙන් යුතු ව කටයුතු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- කඨින පිංකම ආශ්‍රිත පින්තූර කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සංස්කෘතික දායාද හා හර පද්ධති හඳුනා ගෙන විස්තර කරයි.
- කඨින පූජෝත්සවයකින් මතු වන සාරධර්ම අගය කරමින් අදහස් දක්වයි.
- සංස්කෘතික උත්සවවලට සහභාගි වීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- සංස්කෘතික දායාද පිළිබඳ ලියැවුණු ලිපි ලේඛන කියවයි.

**නිපුණතාව** : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.2 ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ක්‍රියා පද හා එහි ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද හා අසම්භාව්‍ය ක්‍රියා පද හඳුනා ගෙන වෙන් කර දක්වයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සහ අසම්භාව්‍ය ක්‍රියා පද නිවැරදි ව වාක්‍යවල යොදයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් කලින් ඉගෙන ගත් ක්‍රියා පද වර්ගීකරණ පිළිබඳ වාචික ප්‍රශ්න අසමින් පාඩමට පිවිසෙන්න.
- ක්‍රියා පද අවසාන ක්‍රියා සහ අනවසාන ක්‍රියා වශයෙන් වර්ග කළ හැකි බව පෙන්වා දෙන්න. (ඇමුණුම 1)
- **ප්‍රයෝජ්‍ය ක්‍රියා** පද අවසාන ක්‍රියාවක් ලෙස වර්ග වන බවත් **අසම්භාව්‍ය ක්‍රියා** පද අනවසාන ක්‍රියා ලෙසත් වර්ග වන බව පැහැදිලි කරන්න.
- පෙළපොතෙහි පාඩම කියවා **ප්‍රයෝජ්‍ය ක්‍රියා පද හා අසම්භාව්‍ය ක්‍රියා පද** වර්ග සෙවීමට කණ්ඩායම් දෙකකට පවරන්න.
- එම ක්‍රියා වර්ග දෙක හොඳින් පැහැදිලි කරන්න.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සහ අසම්භාව්‍ය ක්‍රියා පද යොදා වාක්‍ය ලිවීමේ කෙටි පැවරුමක් ලබා දෙන්න. (උදාහරණ : වාක්‍ය කීපයක් ලබා දෙන්න. (ඇමුණුම 2)


**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල භාෂා ව්‍යාකරණය** - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සහ අසම්භාව්‍ය ක්‍රියා පද හඳුනා ගෙන පැහැදිලි කරයි.
- භාෂා භාවිතය සඳහා ප්‍රයෝජ්‍ය ක්‍රියා සහ අසම්භාව්‍ය ක්‍රියා පද වල වැදගත්කම විස්තර කරයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සහ අසම්භාව්‍ය ක්‍රියා පද නිවැරදි ව ලියයි.

ඇමුණුම 1




**ඇමුණුම 02**
**ප්‍රයෝජ්‍ය ක්‍රියා පද**

අනුන් මෙහෙයවා, අන් කෙනෙකු ලවා කරනු ලබන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාවයි. ධාතු ප්‍රකෘතියත්, ප්‍රත්‍යයත් අතරට 'ව' ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා පදය සෑදෙයි.

උදා : ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු **ලියවයි.**
කොන්ත්‍රාත්කරුවෝ පෙදරේරුවන් ලවා ගෙවල් **තනවති.**

**අසම්භාව්‍ය ක්‍රියා පද**

කිසියම් ක්‍රියා රූපයක් මගින් නිශ්චිත කාලයක් හෝ අවිනිශ්චිත බවක් හෝ හඟවන්නේ නම් එවැනි ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා පද නම් වේ. මෙය අනවසාන ක්‍රියාවකි.
අසම්භාව්‍ය ක්‍රියා පද **වර්ග 2කි.**

1. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද
2. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද

**1. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා**

- උදෑසන කුකුළන් **හඬලද්දී** අපි ගමන පිටත් වීමු.
- ක්‍රීඩකයා පිටියට **පිවිසෙත් ම** නරඹන්නෝ ප්‍රීති ඝෝෂා පැවැත් වූහ.
- **කියත** උන් මෙතෙපුල ආයේය ඇඳුරු ගුත්තිල.

**2. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද**

- හොඳින් පාඩම් **කළොත්** විභාගය සමත් වෙයි.
- එසේ **වුවහොත්** හිමි ඹහුට මම අතවැසි වෙමි.
- නුඹ කුමක් **කීවත්** අපි එකඟ නොවෙමු.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : 9.0 | සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** | : 9.4 | විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි. |
| **කාලච්ඡේද** | : 04යි. | |

**ඉගෙනුම් පල :**

- විවිධ ජන කොටස්වලට අවේණික සිරිත් විරිත් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විවිධ සිරිත් විරිත් මගින් ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රදර්ශනය වන බව පැහැදිලි කරයි.
- විවිධ ජන කොට්ඨාසවලට අයත් සිරිත් විරිත් පිළිබඳ ලියැවුණු ලිපි ලේඛන පරිශීලනය කරමින් තොරතුරු රැස් කරයි.
- විවිධ ජන කොට්ඨාසවල සිරිත් විරිත් ඉදිරිපත් කිරීමේ දී භාෂාව යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විවිධ ජන කොටස්වලට ආවේණික සිරිත් විරිත් පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.
- එම සිරිත් විරිත් නිසා ඒ ඒ ජන කොටස්වල අනන්‍යතාව ප්‍රදර්ශනය වන බව පැහැදිලි කරන්න.
- ශ්‍රී ලංකාවේ වාසය කරන **සිරම්බි අඩිය ජන කොට්ඨාසයට** ආවේණික සිරිත් විරිත් පිළිබඳ පෙළපොතේ පාඩම ඇසුරෙන් කරුණු පැහැදිලි කරන්න.
- සිරම්බි අඩිය ජන කොට්ඨාසය පිළිබඳ පහත සඳහන් කරුණු යටතේ තොරතුරු ගොනු කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසන්න. මෙම ක්‍රියාකාරකමට පිවිසීමට පෙර ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.

- සිරම්බි අඩිය ජන කොට්ඨාසය පිළිබඳ
  - ඓතිහාසික තොරතුරු
  - ආවේණික සිරිත් විරිත්
  - සංස්කෘතික ලක්ෂණ
  - සෞන්දර්යාත්මක හැකියා

- වෙනත් ජන කොට්ඨාසවලට ආවේණික සිරිත් විරිත් සොයා ගොනු ගත කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිරම්බි අඩිය ජන කොට්ඨාසය නියෝජනය වන ඡායා රූපයක්**
- **ගාඩි වත** - ඇන්. ටී. කරුණාතිලක
- **සිරිලක වැදි ජන පුරාණය** - පී. බී. මීගහකුඹුර
- **අභිගුණ්ඨික ජනයා** - චන්ද්‍ර ශ්‍රී රණසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විවිධ ජන කොටස්වලට අවේණික වූ සිරිත් විරිත් ඇති බව ප්‍රකාශ කරයි.
- විවිධ ජන කොටස්වල සිරිත් විරිත් අගය කිරීමෙන් ජන කොට්ඨාස අතර සහයෝගිතාව වර්ධනය වන බවට කරුණු දක්වයි.
- විවිධ ජන කොටස්වලට ආවේණික සිරිත් විරිත් පිළිබඳ කරුණු සොයා ලේඛන සකසයි.

**නිපුණතාව** : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 8.3 සාරාංශකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- ලේඛන සාරාංශකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරයි.
- සාරාංශකරණයේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- අදාළ ලේඛන කියවා වැදගත් කරුණු මතු කර ගනියි.
- මූලික අදහස සුරැකෙන පරිදි සාරාංශකරණයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පාඩමක් කිය වූ විට හෝ දේශනයකට හෝ සවන් දුන් විට මතකයේ රැඳෙන්නේ වැදගත් කරුණු පමණක් බව ප්‍රකාශ කරමින් පාඩමට පිවිසෙන්න.
- වාක්‍යයක හෝ අනුච්ඡේදයක හෝ ඡේදයක හෝ හරය පමණක් මතු කර දැක්වීම **සාරාංශකරණයේ** දී සිදු වන බව පෙන්වා දෙන්න. (ඇමුණුම 1 භාවිත කරන්න.)
- ඒ අනුව **සාරාංශකරණයේ දී** අත්‍යවශ්‍ය ම කරුණු පමණක් මතු කොට ගත යුතු බව අවධාරණය කරන්න.
- **සාරාංශකරණයේ දී** අවධාරණය කළ යුතු සුවිශේෂ කරුණු ඇති බව ශිෂ්‍යයන්ට පැහැදිලි කර දෙන්න. (ඇමුණුම 2 යොදා ගන්න)
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර ගන්න. ඇමුණුම් 3හි සඳහන් ක්‍රියාකාරකම්වල යොදවන්න.
- පිළිතුරු ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

**සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය** - පී. තේනබදු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ප්‍රකාශ කරයි.
- සාරාංශකරණයේ වැදගත්කම පැහැදිලි කරයි.
- ඡේදයක මූලික සාරය ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- ඡේදයක් සාරාංශ කර දක්වයි.

ඇමුණුම 1
පහත සඳහන් වාක්‍යය සාරාංශ කොට දක්වන්න.

- විවිධ ජන කොට්ඨාස අතර පවතින සිරිත් විරිත් ගැන නිසි අවබෝධයකින් හා සංවේදී බවකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන්නේ ජන කොට්ඨාස අතර සාමය, සමගිය, සහජීවනය තහවුරු කොට සාමූහික ව කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමට ය.

**සාරාංශය :**

විවිධ ජන කොට්ඨාසවලට ආවේණික සිරිත් විරිත් අගය කිරීමෙන් සාමූහිකත්වය වර්ධනය වෙයි. **(වචන 11)**

ඇමුණුම 2

- ඡේදය හොඳින් කියවා මුඛ්‍ය අදහස අවබෝධ කර ගන්න.
- මුඛ්‍ය අදහසට අදාළ වාක්‍ය හා වාක්‍යාංශ යටින් ඉරි ඇඳ ලකුණු කර ගන්න.
- පුනරුක්තිය, උපමා, අලංකාර, අතිශයෝක්ති, විවරණ, උදාහරණ, විස්තර, අනවශ්‍ය විශේෂණ හා අනවශ්‍ය නිපාත ඉවත් කරන්න.
- මුල් පාඨයෙහි යොදා ඇති වචන වෙනුවට තමාගේ වචන යෙදීමෙන් සාරාංශයේ අගය වැඩි වන බව සිතට ගන්න.
- දී ඇති ඡේදය 1/3ක් පමණ වන සේ සාරාංශ කරන්න.
- මුල් පාඨයෙහි ඡේද කීපයක් තිබුණත් සාරාංශ ලිවීමේ දී එක් ඡේදයක් ලෙස ලිවීම අවශ්‍ය බව අවධාරණය කරන්න.
- සාරාංශය අවසානයේ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

ඇමුණුම 3

- **පහත සඳහන් ඡේද 1/3ක් පමණ වන සේ සාරාංශ කොට දක්වන්න.**

රටක සැබෑ දියුණුව ඇති වීමට එරට පුරවැසියන් බුද්ධිමත් අය විය යුතු ය. ඔවුන් අංග සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබිය යුතු ය. අංග සම්පූර්ණ අධ්‍යාපනයෙන් අදහස් කරන්නේ උපාධි ලැබීම හෝ නොයෙක් නොයෙක් විෂයයන් ගැන තොරතුරු ඉගෙනීම නො වේ. 'අධ්‍යාපනය' යනු ජීවිතයට සෑම අතින් ම සූදානම් කිරීම ය.

**සාරාංශයː**

රටක් දියුණු වීමට එහි වැසියන් නියම ඉගෙනීමකින් ද, බුද්ධිමත් භාවයකින් ද, නිරෝගී බවකින් ද පිරිපුන් විය යුතු ය. **(වචන 18)**

රටක යම් සාහිත්‍යයක් දියුණු වන්නේ නිදහසේ සිතන්නට පුරුදු වුණු, කරදරවලින් තොර, බුද්ධිමත් සමාජයක් ඇති වූ විට ය. රට යුද්ධ කෝලාහලවලින් හා දුර්භික්ෂවලින් පීඩා විඳිමින් මහජනයා හිරිහැරයට භාජනය වී ඇති විට දී උසස් සාහිත්‍යාංග බිහි නො වේ. රට ආහාර අතින් ස්වයංපෝෂිත වීම ද සමාදානයෙන් හා සමගියෙන් යුක්ත ව ජීවත් වීමට රට වැසියනට අවස්ථාව ලැබීම ද ජනතාව තුළ නව සිතුම් පැතුම් වර්ධනය වීමට හේතු වෙයි. බුද්ධිමතුන් සාහිත්‍යකරණයට පිවිසෙනුයේ එවිට ය.

**සාරාංශය :**

යුද්ධ කෝලාහල, දුර්භික්ෂය, හිරිහැර කරදරවලින් රටවැසියා පීඩාවට පත් වන විට සාහිත්‍යකරණය කෙරෙහි නැඹුරු නො වන අතර සමාදානය හා සමගිය, ස්ථාපනය වීමෙන් සාහිත්‍ය ද දියුණු වෙයි. **(වචන 25)**

**නිපුණතාව** : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- නිර්දිෂ්ට කෙටිකතාව කියවා රස විඳියි.
- කෙටිකතාවේ අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- කෙටිකතාවක සීමිත චරිත සංඛ්‍යාවක් ඇතුළත් වන බව ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවෙහි චරිත හඳුනා ගෙන සුවිශේෂ ලක්ෂණ මතු කර දක්වයි.
- කෙටිකතාව පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙළපොතේ ඇතුළත් **''දිට්ඨ දාන'' කෙටිකතාව** කියවා ගෙන එන ලෙස ශිෂ්‍යයන් යොමු කරන්න.
- කෙටිකතාවේ කතා සාරය ශිෂ්‍යයන්ගෙන් විමසා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- කෙටිකතාවේ එන චරිත හා ඒවායේ චරිත ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- කෙටිකතාවෙන් මතු වන ජීවන අත්දැකීම පැහැදිලි කරන්න.
- කෙටිකතාවක සුවිශේෂ ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න. (ඇමුණුම යොදා ගන්න.)
- කෙටිකතාව නැවත කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවේ සිත් ගත් අවස්ථාවක් භූමිකා රංගනයේ යෙදීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලස්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **බවතිමිර** (පෙරවදන) - මහාචාර්ය ඒ. වී. සුරවීර
- **වහල්ලු** (ප්‍රස්තාවනාව) - මාර්ටින් වික්‍රමසිංහල
- **සංස්කෘති** (විචාර සංග්‍රහය) - 2013 පෙබරවාරි (23 කලාපය - අංක 2)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට කෙටිකතාවේ රසවත් අවස්ථා මතු කර දක්වයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ අන්තර්ගතය පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවේ චරිත ලක්ෂණ විස්තර කරයි.

- හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**ඇමුණුම**

පුද්ගල චරිතයක සුවිශේෂ චරිත ලක්ෂණයක් විවරණය කිරීම, එක ප්‍රබල සිදුවීමක් විවරණය කිරීම වැනි සංක්ෂිප්ත කතා පුවතක් ඉදිරිපත් කෙරෙන නිර්මාණ විශේෂයක් වන කෙටිකතා සාහිත්‍යාංගයේ සංක්ෂිප්ත බවත්, එක් ධාරාණාවකින් යුතු වීමත් සුවිශේෂ ලක්ෂණ වේ. අවස්ථා නිරූපණයට කෙටිකතාවක දී ප්‍රමුඛතාවක් හිමි වන අතර කතා වස්තුව වඩාත් ප්‍රබල ව ඉස්මතු වන ආකාරයේ බස් වහරක් ඉවහල් කර ගැනීම සාර්ථක කෙටි කතාවක ලක්ෂණ වේ.

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- විවිධ අත්දැකීම් පාදක කර ගෙන කෙටිකතා ප්‍රබන්ධ කළ හැකි බව ප්‍රකාශ කරයි.
- කෙටිකතා ප්‍රබන්ධකරණයේ දී නිර්මාණාත්මක චින්තනය මෙහෙය විය යුතු බව පැහැදිලි කරයි.
- කෙටිකතාකරණයේ මූලික ලක්ෂණ හඳුනා ගෙන නිර්මාණකරණයේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් මීට පෙර ඉගෙන ගත් **''දිට්ඨ දාන'' කෙටිකතාව** සිහිපත් කරමින්, ඒ පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න.
- අත්දැකීම් පාදක කර ගෙන කෙටිකතා නිර්මාණය වී ඇති බව පැහැදිලි කර දෙන්න.
- අත්දැකීම් ඔස්සේ නිර්මාණාත්මක චින්තනය මෙහෙය විය යුතු බව අවධාරණය කරන්න.
- කෙටිකතාකරණයේ මූලික ලක්ෂණ පැහැදිලි කර දෙන්න. (ඇමුණුම යොදා ගන්න.)
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර අර්ධකවාකාර ව ඉඳගන්නට සලස් වන්න. ඔවුන් තුළ කෙටිකතාව පිළිබඳ අවධි බවක් ජනිත කරන්න.
- කෙටිකතාවේ මුල් ඡේදය තක්සේරුකරණයේ යෙදෙන්න.
- නිදහසේ සාකච්ඡා කරමින් කෙටිකතා ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- අහඹු ලෙස තෝරා ගත් කෙටිකතා කිහිපයක් පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **කෙටිකතා කලාව** - සෝමවීර සේනානායක
- **කෙටිකතා අධ්‍යයනය හා මූලධර්ම** - රංජිත් ධර්මකීර්ති

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කෙටිකතාවක් නිර්මාණය සඳහා පාදක කර ගත හැකි අත්දැකීම් පැහැදිලි කරයි.
- ප්‍රබන්ධකරණය සඳහා නිර්මාණාත්මක චින්තනය මෙහෙය විය යුතු බව ප්‍රකාශ කරයි.
- නිර්මාණාත්මක චින්තනය මෙහෙයවයි.
- කෙටිකතා නිර්මාණකරණයේ යෙදෙයි.

ඇමුණුම

**කෙටිකතාකරණයේ මූලික ලක්ෂණ**

- අත්දැකීම
- කතා ප්‍රවෘත්තිය
- අදාළ සිද්ධි ගැළපීම (කතා වින්‍යාසය)
- චරිත
- පසුබිම/පරිසරය
- සංක්ෂිප්ත බව
- නිර්මාණාත්මක භාෂාව
- දෘෂ්ටි කෝණය (උත්තම පුරුෂ, ප්‍රථම පුරුෂ)

**නිපුණතාව** : 10.0 සාහිත්‍යික දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.2 විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබා ගත් දැනුම භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- පොතපත කියවා තොරතුරු ඉදිරිපත් කරයි.
- ලේඛනයේ ඇතුළත් පාරිභාෂික වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛන පරිශීලනයෙන් ලබා ගත් දැනුම උචිත පරිදි භාවිත කරයි.
- හඳුනා ගත් පාරිභාෂික වචන ලේඛනයේ දී සුදුසු පරිදි යොදා ගනියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ඇමුණුමෙහි දී ඇති නිර්මාණාත්මක ලේඛනය හා පෙළපොතේ පාඩම කෙරෙහි අවධානය යොමු කරමින් පාඩමට පිවිසෙන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර ගන්න.
- පෙළපොතේ හා ඇමුණුමෙහි ඇතුළත් පාරිභාෂික වචන ගොනු කරන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- හඳුනා ගත් වචන යොදා වාක්‍ය තැනීමට කණ්ඩායම්වලට පවරන්න.
- පාරිභාෂික වචන යොදා තැනූ වාක්‍ය පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- අවශ්‍ය නිවැරදි කිරීම් හා උපදෙස් ලබා දෙන්න. හඳුනා ගත් එක් වචනයකට එක් වාක්‍යය බැගින් අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- **අභ්‍යවකාශ ගවේෂණය** පිළිබඳ ලියැවුණු පොතපත කියවා කරුණු එක් රැස් කරන ලෙස ශිෂ්‍ය කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.
- එම තොරතුරු ඇසුරෙන් සකස් කළ ලිපි එකතුවක් සහිත පිටු පෙරළනයක් සකස් කිරීමට යොමු කරන්න.
- ඒවා පන්තියේ ප්‍රදර්ශනය කර සියලු ම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව සලසා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **අනාගතයේ පැති කඩක්**
  **අනාගත ආශ්චර්යයක්**
  **3001 අවසාන වීර චාරිකාව**
  } - අතර් සී ක්ලාක් -
  (පරිවර්තනය එස්. එච්. බන්දුසීල)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විද්‍යාත්මක ලේඛනවල පාරිභාෂික වචන යෙදෙන බව ප්‍රකාශ කරයි.
- පාරිභාෂික වචන යොදා ගැනීමෙන් ලේඛනයේ විශිෂ්ටත්වය සුරැකෙන බව පෙන්වා දෙයි.
- විද්‍යාත්මක ලේඛන ඇතුළත් පොතපත කියවීමට යොමු වෙයි.
- පාරිභාෂික වචන යොදා වාක්‍ය තනයි.
- විද්‍යාත්මක ලේඛන පරිශීලනයෙන් ලත් දැනුම භාෂා කාර්යයේ දී යොදා ගනියි.

**ඇමුණුම**

අවකාශයේ ඇති ස්වාභාවික ශක්ති ප්‍රභවයන් ප්‍රයෝජනයට ගන්නා, ඉන්ධන රහිත ගුවන් යානා තැනීමට හැකි වෙති'යි යන අදහසක් ද දැන් ඉදිරිපත් ව ඇත. මෙය සත්‍යයක් වීමට බැරි තරම් හොඳ අදහසක් බව පෙනේ. අභ්‍යවකාශයේ ඇති මෙවැනි ශක්ති ප්‍රභවයන් දැනටමත් පරීක්ෂණ ගණනාවක් සඳහා ප්‍රයෝජනයට ගෙන තිබේ. රොකට්ටුවක් මගින් නියමිත උසක දී සෝඩියම් වාෂ්පය පිට කළ විට, ඒවා වායු ගෝලයේ ඉහළ ම සීමාවේ ඇති විද්‍යුත් ආරෝපිත පරමාණුවල ප්‍රතික්‍රියාවක් ඇති කරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අහසේ සැතපුම් ගණනක් දිගට දෘශ්‍යමාන දිලිසීමක් ඇති වෙයි. මෙම දිලිසීමට හේතුව පරමාණු මගින් දිවා කාලයේ දී උරා ගන්නා ලද සූර්යාලෝකයේ ශක්තිය නියම උත්තේජයක් ලැබීමෙන් නිදහස් වීමයි.

ඉහළ වායුගෝලයේ රැස් වී ඇති ශක්ති ප්‍රමාණය ඉතා විශාල නමුත්, අවාසනාවකට මෙන් එය ඇත්තේ ඉතා තනුක අවස්ථාවක ය. ප්‍රයෝජනවත් විය හැකි ශක්ති ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා විරල වූ වාතය අතිවිශාල වශයෙන් එකතු කොට සකස් කිරීමට සිදු වනු ඇත. යම්කිසි උපකරණයක් මගින් ඉහළ වායුගෝලයේ ඇති තුනී වායුව එකතු කොට, ප්‍රමාණවත් තෙරපීමක් ඇති කිරීමට තාප ශක්තිය නිදහස් කළ හැකි නම්, කිසිම ඉන්ධන වියදමක් නොමැති ව අපට නොනවත්වා ම අහසේ ගමන් කිරීමට හැකි වෙනු ඇත. දැනට මෙය කළ නො හැකි දෙයක් ලෙස පෙනෙතත් එය සම්පූර්ණයෙන් ම ඉවත දැමිය යුතු අදහසක් නො වේ. දශක කිහිපයකට කලින් මෙවැනි ශක්ති ප්‍රභවයන් අභ්‍යවකාශයේ තිබූ බවවත්, අපි දැන නො සිටියෙමු. ඒ අනුව බලන විට, මෙයට වඩා බලවත් ශක්ති ප්‍රභවයන් අනාගතයේ සොයා නො ගනිතැ'යි කිසිවෙකුට කිව හැකි නො වේ.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | : | 8.0 | භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. |
| **නිපුණතා මට්ටම** | : | 8.2 | පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. |
| **කාලච්ඡේද** | : | 03යි. | |

**ඉගෙනුම් පල :**

- බිත්ති පුවත්පතක හා සඟරාවක ස්වරූප හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පාඨකයා ආකර්ෂණය වන පරිදි නිවැරදි ව ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- බිත්ති පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණාත්මක ලිපි ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- බිත්ති පුවත්පතක හා සඟරාවක ව්‍යුහයේ ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න.
- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කර ගන්න.
- එක් එක් කණ්ඩායම්වලට විවිධ තේමා ලබා දෙන්න. ඇමුණුම යොදා ගන්න
- ඒ ඒ තේමා යටතේ ඉතා කෙටි ගද්‍ය පද්‍ය නිර්මාණ සැකසීමට උපදෙස් දෙන්න. අදාළ චිත්‍ර, රූප සටහන් ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- පාඨකයා ආකර්ෂණය වන පරිදි නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මතු කර දක්වන්න.
- බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
- ඇමුණුමෙහි දී ඇති තේමා යටතේ විස්තරාත්මක ගද්‍ය පද්‍ය නිර්මාණ සකස් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාඨකයා ආකර්ෂණය කර ගත හැකි පරිදි චිත්‍ර, රූප සටහන්, ප්‍රස්තාර ආදිය යොදා ගත යුතු බව පැහැදිලි කර දෙන්න.
- සඟරාවක මුල් පිටු හා ඇතුළු පිටු සකස් විය යුතු ආකාරය විස්තර කරන්න. එම කාර්යය ද අදාළ පරිදි කණ්ඩායම්වලට පවරන්න.
- ශිෂ්‍ය නිර්මාණ ඇතුළත් කර **බිත්ති පුවත්පතක් සහ සඟරාවක්** සකස් කරන්න.
- ශිෂ්‍යයන් නිර්මාණය කළ බිත්ති පුවත්පත හා සඟරාව පිළිබඳ ඇගයීමක් කරමින් සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- බිත්ති පුවත්පතක ආකෘතියක්
- සඟරා කීපයක් (උදාහරණ - **නුවණ, නවයුගය, දෙසතිය** ආදිය)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- බිත්ති පුවත්පතක හා සඟරාවක ව්‍යුහයේ ඇති වෙනස්කම් පිළිබඳ කරුණු පැහැදිලි කරයි.
- බිත්ති පුවත්පතක් සඳහා කෙටි ගද්‍ය/පද්‍ය නිර්මාණකරණයේ යෙදෙයි.
- වර්ෂය පුරා සුදුසු කාල රාමුවක් තුළ බිත්ති පුවත්පත් නිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.
- සඟරාවකට සුදුසු වන ආකාරයේ ගද්‍ය/පද්‍ය නිර්මාණකරණයේ යෙදෙයි.
- පාඨකයා ආකර්ෂණය වන පරිදි නිර්මාණ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
- මාසික ව, ත්‍රෛමාසික ව, වාර්ෂික ව වශයෙන් කාල රාමුවක් තුළ සඟරා නිර්මාණය කරයි.

**ඇමුණුම**
**විවිධ තේමා**

- ස්වභාව සෞන්දර්යය
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම්
- සාරධර්ම වර්ධනය
- සාමය හා සහජීවනය
- සාහිත්‍ය හා ලලිත කලා නිර්මාණ ඇගයීම
- කෘෂි කර්මාන්තය
- විද්‍යාව හා තාක්ෂණවේදය
- පොත්පත් කියවීමේ අගය
- අධ්‍යාපනය

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.2 පොතපත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- සාරධර්ම යන්න පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ලේඛනයේ ඇතුළත් සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ජීවිතාවබෝධය පිණිස සාරධර්ම ඉවහල් වන ආකාරය පැහැදිලි කරයි.
- සාරධර්ම අන්තර්ගත වූ සාහිත්‍ය කෘති පරිශීලනය කරයි.

**පාඩම සැලසුම් කිරීම :**

- සාරධර්ම සම්බන්ධ ව පෙළපොතේ ඇති පාඩම කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩම ඇසුරෙන් සාරධර්ම පිළිබඳ කරුණු සෙවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පුස්තකාල පරිහරණය ඇසුරෙන් සාරධර්ම ඇතුළත් ලිපිලේඛන හා පොතපත පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- සාරධර්ම හා එහි වටිනාකම පිළිබඳ ව සාකච්ඡාවක් සංවිධානය කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර පහත සඳහන් කණ්ඩායම් පැවරුම් ලබා දෙන්න.

**I කණ්ඩායම**
විවිධ කතන්දරවලින් මතු කෙරෙන සාරධර්ම ලැයිස්තුවක් සකස් කර ඉදිරිපත් කරන්න.

**II කණ්ඩායම**
සාරධර්ම ඇතුළත් කවි, ගීත, නාට්‍ය නම් කර ඒවායින් ඉස්මතු වන සාරධර්ම ඉදිරිපත් කරන්න.

**III කණ්ඩායම**
විවිධ සංස්කෘතික උත්සව නම් කර ඉන් පිළිබිඹු වන සාරධර්ම විස්තර කරන්න.

**IV කණ්ඩායම**
විවිධ සමාජ චාරිත්‍ර නම් කර ඉන් කියවෙන සාරධර්ම ඉදිරිපත් කරන්න.

- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සාරධර්ම මාර්ගෝපදේශය** - ජාතික අධ්‍යාපන ආයතනය
- **සාරධර්ම අධ්‍යාපනය** - ඒ. එස්. බාලසූරිය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සාරධර්ම යනු කුමක්දැයි නිර්වචනය කරයි.
- පොතපත ඇසුරෙන් සාරධර්ම ඉදිරිපත් කරයි.
- සමාජ සාරධර්ම අනුව ජීවිත සකස් කර ගත යුතු බව පැහැදිලි කරයි.
- සාරධර්මවල වටිනාකම අවධාරණය කරයි.

**නිපුණතාව** : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.3 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- නිපාත හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී නිපාත වෙන් කොට ලිවිය යුතු බව ප්‍රකාශ කරයි.
- නිපාත වර්ග කරයි.
- නිපාත නිවැරදි ව හා අර්ථවත් ව භාවිත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- **අව්‍යය පද** යනු කුමක් දැයි පැහැදිලි කර ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න. (ඇමුණුම 1 යොදා ගන්න)
- ඒවා නිපාත, උපසර්ග ලෙස කොටස් දෙකකට වෙන් වන බව පෙන්වා දෙන්න.
- නාම හෝ ක්‍රියා හෝ උපසර්ග හෝ නො වන සියලු ම පද නිපාත ලෙස හැඳින්වෙන බව උදාහරණ මගින් පැහැදිලි කරන්න.
- වාක්‍යයක මුල, මැද හා අග යෙදී අර්ථ ප්‍රකාශ කරන පද නිපාත ලෙස සැලකේ.
- භාෂා භාවිතයේ දී නිපාත වෙන් කොට ලිවිය යුතු බව පෙන්වා දෙන්න.
- නිපාත වර නො නැගෙන බව අවධාරණය කරන්න.
- නිපාත විවිධ අර්ථවල යෙදී අරුත් ප්‍රකාශ කරන බව උදාහරණ මගින් සාකච්ඡා කරන්න. (ඇමුණුම 2 යොදා ගන්න)
- පෙළපොතෙහි අභිමත පාඩමක් ඇසුරෙන් නිපාත තෝරා ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිපාත දහයක් ඉදිරිපත් කර වාක්‍ය තැනීමට පැවරුමක් දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**


- **සිංහල භාෂාවේ ව්‍යාකරණ** - ඩබ්. එස්. කරුණාතිලක

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අව්‍යය පද යන්න පැහැදිලි කරයි.
- නිපාත වර්ග කර දක්වයි.
- නිපාත වෙන් කොට ලිවිය යුතු බව පැහැදිලි කරයි.
- නිපාත නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**ඇමුණුම 1**
**අව්‍යය පද**

වෙනසකට ලක් නො වන, වැය (ව්‍යය) නො වන, කිසිවිටක වර නො නැගෙන පද යන අර්ථයෙන් අව්‍යය පද ලෙස නම් කෙරේ. අව්‍යය පද වර්ග දෙකකි.




**ඇමුණුම 2**

**නිපාත**
නාම හෝ ක්‍රියා හෝ උපසර්ග නො වන සියලු ම පද නිපාත ලෙස සැලකේ. නිපාත යනු පතිත වීම හෙවත් වැටීමයි. වාක්‍යයක මුලට, මැදට හා අගට යෙදීම නිපාතවල ස්වභාවයයි.

නිපාත විවිධ අර්ථවල යෙදේ.
මේවා විවිධ ව්‍යාකරණ ග්‍රන්ථවල විවිධ ලෙස පළ කොට ඇතත් මෙහි ඉදිරිපත් කර ඇත්තේ පොදු වර්ගීකරණයකි.

**කාලාර්ථය**
නිතර, අනතුරු ව, වරක්, නිරතුරු, ඉක්බිති

**භාවාර්ථය**
අනේ, අහෝ, අයියෝ, ඌයි, චිඃ

**සමුච්චයාර්ථය**
ද්, ත්, යි, සහ, හා

**ආමන්ත්‍රණාර්ථය**
එම්බා, කොල, ඒයි,

**ප්‍රමාණාර්ථය**
විතර, තරම, සා, වාගේ, තාක්

**සීමාර්ථය**
තෙක්, දක්වා, තුරු, පටන්, සිට

**විකල්පාර්ථය**
හෙවත්, නොහොත්, හොත්, හෝ

**පිණිසාර්ථය**
උදෙසා, නිසා, සඳහා, වස්, අරභයා

**නිපුණතාව** : 4.0 ශිල්පීය ප්‍රයෝග ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.2 වචන වෙන් කිරීමේ රීති අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- වචන වෙන් කිරීමේ සම්මත ක්‍රම හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නාම පදයක් සමග යෙදෙන 'ත්' එක් ව ලිවිය යුතු බව ප්‍රකාශ කරයි.
- විධි ක්‍රියාවේ 'ව' හා 'වු' ද ප්‍රාර්ථනාවාචී ක්‍රියාවේ දී 'වා' ද ප්‍රයෝජ්‍යාර්ථයේ දී 'ව, වී, වු' ද පෙර පදයට එක් කර ලිවිය යුතු බව පැහැදිලි කරයි.
- ලේඛනයේ දී වචන වෙන් කර හා එක් කර ලියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ලේඛනයේ දී **වචන වෙන් කර හා එක් කර ලිවීමේ** වැදගත්කම පිළිබඳ ව පැහැදිලි කරන්න.
- නාම පදයක් සමග 'ත්' එක් ව ලිවිය යුතු බව පැහැදිලි කර දෙන්න.
- විධි ක්‍රියාවේ 'ව' හා 'වු' ද ප්‍රාර්ථනාවාචී ක්‍රියාවේ දී 'වා' ද ප්‍රයෝජ්‍යාර්ථයේ දී 'ව', වී, වු' ද පෙර පදයට එක් කර ලිවිය යුතු බව පෙන්වා දෙන්න.
- ඇමුණුමෙහි සඳහන් තද කළු අකුරින් දක්වා ඇති වචන කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- ඒ අනුව පහත සඳහන් වචන එක් කිරීමේ රීති පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
  - සම්බන්ධවාචී 'ත්' පෙර පදය හා එක් ව ලිවීම
    උදා : සෑයත්, මිරිසවැටියත්
  - විධි ක්‍රියාවේ යෙදෙන 'ව' සහ 'වු' එක් ව යෙදීම.
    උදා : මැනව, බලවු
  - ප්‍රාර්ථනාවාචී 'වා' ප්‍රත්‍ය එක් ව ලිවීම.
    උදා : අත් වේවා!
  - ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ 'ව, වී, වූ' පද එක් ව යෙදීම.
    උදා : ලියවයි, තැනවීම, කරවූහ.
- උදාහරණ වචන හැකිතාක් දී වචන වෙන් කර ලිවීමට ශිෂ්‍යයින් හුරු කරවන්න.
- පෙර දැනුම උපයෝගී කර ගෙන වචන වෙන් කර ලිවීම සඳහා පැවරුමක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සිංහල ලේඛන රීතිය** - (සංස්: 2015) ජාතික අධ්‍යාපන ආයතනය
- **1968 සම්මත සිංහල වාර්තාව** - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- **සිංහල ලේඛන ව්‍යවහාරය** - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- වචන වෙන් කිරීමේ සම්මත ක්‍රම ප්‍රකාශ කරයි.
- පෙර පදය හා එක් කොට ලිවිය යුතු ප්‍රත්‍යය හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිවැරදි ව වචන වෙන් කර ලිවීමේ අවශ්‍යතාව සඳහන් කරයි.
- නිවැරදි ව වචන වෙන් කර ලියයි.

**ඇමුණුම**

1. රුවන්මැලි **සෑයත් මිරිසවැටියත්** දුටුගැමුණු රජතුමා විසින් කර වන ලද දාගැබ් දෙකකි.
2. ස්වාමීන් වහන්ස, හෙට දනට වඩිනු **මැනව.**
3. **බලවු!** පොළොන්නරු අනුරාපුර පෙදෙස.
4. ඔබට නිරෝගි සුව **අත් වේවා!**
5. ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු **ලියවයි.**
6. පියා පුතා ලවා නිවසක් **තැනවී** ය.
7. කාශ්‍යප රජතුමා සීගිරිය **කරවූ** බව ඉතිහාස කතාවල සඳහන් ය.

**නිපුණතාව** : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.3 සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- සාහිත්‍ය නිර්මාණ විචාරය යන්න සරල ව පැහැදිලි කරයි.
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට ලිපියෙහි ඇතුළත් විචාර ලක්ෂණ ඉදිරිපත් කරයි.
- භාෂාව නිර්මාණශීලී ව භාවිත කරමින් සාහිත්‍ය නිර්මාණ විචාරය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- **සාහිත්‍ය විචාරය** පිළිබඳ ව සරල ව පැහැදිලි කර දෙමින් පාඩමට පිවිසෙන්න. ඒ සඳහා පෙළපොතේ පාඩම ද ඇමුණුම 1 ද උපයෝගී කර ගන්න.
- සාහිත්‍ය විචාරයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කර දෙන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කර ගන්න.
- පෙළපොතේ නිර්දිෂ්ට ලිපියෙහි ඇතුළත් විචාර ලක්ෂණ ගොනු කරන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- ගොනු කර ගත් ලක්ෂණ පන්තියට ඉදිරපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව සලසා දෙන්න.
- සාහිත්‍ය රසය අර්ථකථනය කර දක්වන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.
- පෙළපොතේ පාඩමෙහි ඇතුළත් විචාර ලක්ෂණ ගැන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- සාහිත්‍ය නිර්මාණකරණයේ දී භාෂාව නිර්මාණශීලී ව භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- පෙළපොතෙහි පාඩම පිළිබඳ ව කෙටි විචාරයක් ලිවීමට ශිෂ්‍යයන් සියලු දෙනාට ම අවස්ථාව සලසන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **සාහිත්‍යය** - අශෝක කරුණාරත්න
- **සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය** - නිවන්දම ධර්මකීර්ති හිමි (ප්‍රස්තාවනාව)

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාහිත්‍ය නිර්මාණ විචාරයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ප්‍රකාශ කරයි.
- පෙළපොතේ පාඩමෙහි ඇතුළත් විචාර ලක්ෂණ ගොනු ගත කරයි.
- ශබ්ද රසය හා අර්ථ රසය උද්දීපණය වන පරිදි සාහිත්‍ය නිර්මාණකරණයේ යෙදීම වැදගත් බව ප්‍රකාශ කරයි.

ඇමුණුම - 1

ජාතියක හෝ රටක ජනතාවගේ විචාර මාර්ගය හැඳින ගැනීමේ දී සාහිත්‍යය තරම් උපකාර වන කිසිවක් නැත. සාහිත්‍යයක් පෝෂණය වන්නේත් සකස් වන්නේත් ජනතාවකගේ රුචිය, රසය, විචාරය හා පරිසරය අනුව ය. පරිසරය අමුතු වීමට රටේ පිහිටීම හෙවත් භූමි නිර්මාණය, ඍතු ගුණ ආදිය බෙහෙවින් ඉවහල් වේ. රටේ සාමාජික තත්ත්වය - දේශපාලන, ආර්ථික, ශාස්ත්‍රීය, ආගමික අතින් කලින් කල වරින් වර ඇති වන විවිධ විපර්යාස හා නො එක් වෙනස්කම් නිසාත් සාහිත්‍යයක විශේෂතා ඇති වෙයි.

**සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය**
(ප්‍රස්තාවනාව) - නිවන්දම ධර්මකීර්ති හිමි

ඇමුණුම - 2

යම්කිසි ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨයක් කියවා කෙනෙකු ප්‍රීතියට පත් වනුයේ එහි ඇති ශබ්ද රසය හෝ අර්ථ රසය නිසා ය. ශබ්දය හේතු කොට ගෙන ඇති වන ප්‍රියජනක හැඟීම් ශබ්ද රසය නම් වේ. යම් පාඨයක් මදක් ශබ්ද නගා වුව ද කියවන විට අප පළමු ව විඳින්නේ ශබ්ද රසයයි. අර්ථ රස දැනෙන්නේ ඉනික්බිතිව ය. ප්‍රයෝජනය අතින් අර්ථ රසය ප්‍රබලකර වුවත් වයස, තත්ත්වය, උගැනීම, තරාතිරම ආදී කිසිදු භේදයක් නො සලකා සියලු දෙනා කෙරෙහි බලපවත්වනුයේ ශබ්ද රසයයි.

**සිංහල රචනය හා සාහිත්‍යය රසාස්වාදය** - පී. තේනබදු

**ශබ්ද රසය**
ශබ්ද රසය උද්දීපනය කිරීමෙහි සමත් අංග කීපයක් පහත දැක් වේ.

(i) රිද්මය හෙවත් ළයමානය
(ii) ප්‍රාසය
(iii) එළිසමය
(iv) පද සහ අක්ෂර ඖචිත්‍යය

**අර්ථ රසය**
ලොව ඇති නොයෙක් වස්තූන් මිනිස් ඇසට පෙනෙනුයේ ඒ ඒ දෑය ඇති සැටියෙන් ම ය. එහෙත් ඒ ඒ දෑය කවි ඇසට පෙනුණු විට කවියා කුල්මත් වෙයි. ආස්වාදය දරා ගත නො හී එය අනුනට ප්‍රකාශ කරයි. නැතහොත් එසේ කිරීම සඳහා තමාගේ හැඟීම් ලියා තබයි.

මිනිස් සිත තුළ හට ගන්නා මූලික හැඟීම් නවයකැයි කී පැරණි විචාරකයෝ ඒ එකිනෙක භාවය කරණ කොට ගෙන රස නවයක් සිතෙහි හට ගන්නා බව පවසා ඇත.

| භාව | රස |
|---|---|
| රති | ශෘංගාර |
| හාස | හාස්‍ය |
| ශෝක | කරුණ |
| ක්‍රෝධ | රෞද්‍ර |
| උත්සාහ | වීර |
| භය | භයානක |
| ජුගුප්සා | බීභත්ස්‍ය |
| විස්මය | අද්භූත |
| ශම | ශාන්ත |

**නිපුණතාව** : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල :**

- නාට්‍යයක ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය නිර්මාණය කියවා රස විඳියි.
- නාට්‍යයේ අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය නිර්මාණයෙහි චරිත හඳුනා ගෙන සුවිශේෂ ලක්ෂණ මතු කර දක්වයි.
- නාට්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙළපොතෙහි ඇතුළත් **නාට්‍ය (මහාසාර)** පිටපතෙන් කොටසක් කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නාට්‍යයට පදනම් වූ කතාව සාරාංශ කොට ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- නාට්‍යයකින් මතු කර ගත හැකි ජීවන අරුත් පහදා දෙන්න. ඒ යටතේ පෞරුෂ වර්ධනය සඳහා අවශ්‍ය වන බුද්ධි වර්ධනය, මානව දයාව, සංවේදී බව ආදිය ගොඩ නැගීම සඳහා නාට්‍යය මනා පිටිවහලක් වන අයුරු පැහැදිලි කරන්න.
- නාට්‍යයක මූලධර්ම ශිෂ්‍යයන්ට පැහැදිලි කර දෙන්න. (ඇමුණුම යොදා ගන්න)
- ඒ අනුව නිර්දිෂ්ට නාට්‍ය කොටස ඊට අදාළ වන ආකාරය ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- නිර්දිෂ්ට නාට්‍ය කොටස භූමිකා රංගනයක් මගින් ශිෂ්‍යයන් ලවා ඉදිරිපත් කරවන්න.
- එම භූමිකා රංගනය රස වින්දනය සඳහා ශිෂ්‍යයන් යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **මහාසාර ජාතකය** - පන්සිය පනස් ජාතක පොත
- **මහාසාර** (නාට්‍ය පෙළ) - එදිරිවීර සරච්චන්ද්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාට්‍යයක ලක්ෂණ පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය කොටසේ චරිතවල සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂ අවස්ථා නිරූපණය කර දක්වයි.
- නාට්‍ය පෙළ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ඉදිරිපත් කරයි.
- නාට්‍ය පෙළ රස වින්දනයෙහි යෙදෙයි.

**ඇමුණුම**

කථාකරුවාගේ කලාවට ඉඳුරා වෙනස් වූවකි, නාට්‍ය රචකයාගේ කලාව. නාට්‍යකරුවා කථාවක් නො කියයි. ඔහු අවස්ථාවක් ගෙන හැර පායි. කථාවක් අසන්නා බලාගෙන සිටින්නේ සිදු වූයේ කුමක් ද කියා දැන ගැනිමට ය. එහෙත් නාට්‍යයක් නරඹන්නා සිදු වූයේ කුමක් ද යි දනී. ඔහු බලන්ට යන්නේ, ඔහු හොඳින් දන්නා වෙස්සන්තර කථාව නැතහොත් සඳ කිඳුරු කථාව ය. ඔහු නාට්‍ය ශාලාවට යන්නේ එය සිදු වූයේ කෙසේ ද කියා බලා ගැනීමට ය.

නාට්‍යය වූ කලී බැලීමෙන් රස විඳීමට තිබෙන කාව්‍ය විශේෂයකි. ඊට දෘශ්‍ය කාව්‍ය යි කියන්නේ මේ හෙයිනි. නාට්‍යයට රූප හෙවත් රූපක යි ද කියනු ලැබේ. එ ද එම අර්ථයෙනි. නළුවෝ ද නිළියෝ ද වෙස් වළා ගෙන අවුදින්, ප්‍රේක්ෂකයන් ඉදිරියෙහි කිසියම් අවස්ථාවක් දක්වත්. එවිට නාට්‍යයක් පහළ වේ. වෙස් වළා ගැනීමට කියන්නේ ''සමාරෝප'' කියා ය.

ලෝකයෙහි සුඛ දුඃඛ යන දෙකෙන් යුක්ත වූ කිසියම් ස්වභාවයක් තිබේ ද එය අංග ආදී අභිනය සතරට නැංවූ විට, නාට්‍යය වශයෙන් හඳුන් වනු ලැබේ යයි භරත ඇදුරුතුමා පවසයි.

අභිනය සතර වර්ගය නම්, ආංගිකාභිනය ද වාචිකාභිනය ද සාත්විකාභිනය ද අහාර්යාභිනය ද යන මේවා ය. ආංගිකාභිනය යනු ඇඟින් (එනම් යාම් ඊම් ආදි ඉරියව්වලින්) අභිනය පෑම ය. වාචිකාභිනය යනු, සංවාදයෙන් අභිනය දැක්වීම ය. සාත්විකාභිනය යි කියන්නේ, මුහුණෙහි ආරූඪ කර ගන්නා නොයෙකුත් පෙනුම්වල මාර්ගයෙන් හැඟීම් පැවසීමට ය. අහාර්යාභිනය යනු නළුවන් හා නිළියන් අඳින ඇඳුම් පැළඳුම් ආදියට හා වේදිකා සැරසිලි හා වෙනත් උපකරණවලට ය.

'නාට්‍යය' යි කියන්නේ රචකයා විසින් ලියන ලද සංවාදයට නො වේ. ඒ සංවාදය නාට්‍යයේ අවශ්‍ය අංගයක් වුව ද, එයින් පමණක් නාට්‍යය සම්පූර්ණ නො වේ. ඒ සංවාදය නිසි අයුරින් කීමට නළුවන් හා නිළියන් ද සිටිය යුතු ය. එහෙත් සංවාදය කීමෙන් පමණක් ද නාට්‍යය සම්පූර්ණ නො වේ. සංවාදය කියන නළුවන් වෙනත් අභිනය සමග එය කිය යුතු ය. වචනවල සම්පූර්ණ අර්ථය ඔවුන් මුහුණින් හා ඇඟින් දැක්විය යුතු ය.

නාට්‍යයක පෙළ පමණක් කියවීමෙන් එහි සම්පූර්ණ රසය විඳීම දුෂ්කර බව මෙයින් පෙනේ. නාට්‍යයක් කියවීමෙන් රස විඳින්නට නම්, එය කියවන අතර රඟ දැක්වෙන ආකාරය ද කල්පනාවකට නගා ගත යුතු ය. රඟ මඬල කෙබන්දක් ද නළු නිළියෝ කෙබඳු අය ද ඔවුන්ගේ අභිනය කෙසේ ද පසුබිම් සැරසිලි ආදිය කවර ආකාරයකින් කර තිබේ ද යන ආදිය පාඨකයා තම සිතෙහි මවා ගත යුතු ය. මෙසේ කිරීමට පාඨකයා යටත් පිරිසෙයින් නාට්‍යයන් දහයක් දොළහක් වත් දැක පුරුදු කෙනෙකු විය යුතු ය.

එහෙත් නිෂ්පාදිත නාට්‍යයන් දකින්ට ලැබෙන්නේ කලාතුරකින් නිසා, අප මුද්‍රිත නාට්‍යයන්ගේ පෙළ වුව කියවා රස විඳින්නට තැත් කළ යුතු ය. මෙසේ නො කළ හොත් අපට ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ රචනාවලින් වැඩි සංඛ්‍යාවක් කවර ආකාරයකින් වුව ද හඳුනා ගන්ට ඉඩ නො ලැබේ. නාට්‍යයක් කියවන විට, එහි සියුම් තැන් මනැසට ගොදුරු නොවන්ට පුළුවන. එහෙත් නාට්‍ය පෙළේ, රස විඳිය හැකි වෙනත් තැන් තිබෙන්ට පුළුවන. බර්නාඩ් ෂෝගේ නාට්‍ය කියවන විට, සංවාදයෙහි ඇති හාස්‍යය හා උපහාසය අපට විඳිය හැකි ය. ඔස්කාර් වයිල්ඩ්ගේ සංවාදය ද තීක්ෂ්ණ බුද්ධියකින් යුත් ලේඛකයෙකු විසින් නිර්මාණය කරන ලද්දක් බව එකහෙලා පෙනේ. කාලිදාසගේ 'ශකුන්තලා' වැනි නාට්‍යයක් කියවන විට, ඔහුගේ නිර්මල කවිත්වයේ රසය අපට විඳිය හැකි ය.

එහෙත් නාට්‍යයක කවර කාව්‍ය රසයක් තිබුණත්, එහි සංවාදයෙහි කවර හාස්‍ය රසයක් තිබුණත්, අප නිතර ම බැලිය යුත්තේ මුඛ්‍ය වූ නාට්‍ය රසය කුමක් ද කියා ය. හාස්‍යජනක නාට්‍යයකට නියම වශයෙන් අයත් වන්නේ, ඒ නාට්‍යයේ සංවාදයෙන් පැන නගින හාස්‍යය නොව, එහි නිරූපිත අවස්ථාවන්ගෙන් උපදින හාස්‍යය ය. ''**කපුවා කපෝති**'' නමැති නාට්‍යය, නැතහොත් ''**රත්නාවලි**'' නම් සංස්කෘත නාට්‍යය, එසේ නැත්නම් ගොගොල්ගේ ''පරීක්ෂකයා'' ඇසුරු කොට සිංහලයට සකස් කරන ලද ''**රහස් කොමසාරිස්**'' යන නාට්‍යය රඟ දක්වනු දුටුව හොත්, නො එසේ නම් පරෙස්සමින් කියවතොත්, ඒ කෘතිවල නාට්‍ය රසය රඳා පවත්නේ සංවාදයෙහි නොව, අවස්ථාවන්හි බව මනා සේ පෙනෙනු නිසැක ය.

නාට්‍යයක් රචනා කරන ලේඛකයා පළමු කොට කථාවක් සොයා ගනියි. මේ කතාව, ඔහු විසින් කල්පිත වූ වස්තුවක් විය හැකි ය. නැත හොත් ඉතිහාසයෙන් හෝ සාහිත්‍යයෙන් හෝ ජන ප්‍රවාදයෙන් හෝ උපුටා ගත්තක් විය හැකි ය. ඒ කෙසේ වෙතත්, ඔහු ගන්නා කථාවෙහි නාට්‍ය රසයක් තිබිය යුතු ය. එනම්, නාට්‍යයට සුදුසු අවස්ථාවක් එයින් නිර්මාණය කළ හැකි විය යුතු ය. සෑම කථාවක ම මෙවැනි රසයක් නැත. එහෙයින් සෑම කථාවක් ම නාට්‍ය රචනය සඳහා සුදුසු නො වේ. නාට්‍ය රචකයා, ජීවිතයෙහි හෝ සාහිත්‍යයෙහි සෙවිය යුත්තේ නාට්‍යයකට ඇසුරු කොට ගත හැකි අවස්ථාවකි.

නාට්‍යයට සුදුසු අවස්ථාවක් යයි කියන්නේ කෙබන්දකට ද? මෙය විස්තර කිරීම උගහට ය. නිදසුන් මගින් පෙන්වීම වඩා මැනවි. නාට්‍යෝචිත අවස්ථාවක් වූ කලී, කොයි වේලාවේ කොයි අතකට පෙරළේ දැ යි කිව නොහැකි ලෙස කඳු මුදුනක යන්තම් නො වැටී තිබෙන ගලකට සමාන ය. එය නරඹන්නාගේ සිත තුළ දෙතුන් පැත්තකට ඇදීමක් වැනි හැඟීමක් ඇති කරවන්නකි. ආවේගයන්ගේ තියුණු ගැටීමක් එයින් සිදු වේ.

නාට්‍යයක කිසියම් ක්‍රියාවක් ඇරඹී එය අවසන් වන තෙක් ඇති වන අවුල් ජාලාව ය, රචකයා විහිදා පාන්නේ. මේ ක්‍රියාවේ අවස්ථා පහක් තිබෙන බව නාට්‍යවේදීහු කියත්. ක්‍රියාවේ මුල පිරවීමට ආරම්භය යි කියනු ලැබේ. ඊ ළඟට එන්නේ යත්නය, හෙවත් ප්‍රයත්නය නම්, නාට්‍යයේ ඉතා උත්සන්න අවස්ථාව වූ කලී, ප්‍රාප්ත්‍යාශා යන්න ය. ප්‍රාප්ත්‍යාශා යනු, යත්නය සඵල වෙති යි යන බලාපොරොත්තුව ළඟා වූ අවස්ථාව ය. එතන දී, ක්‍රියාව ඉෂ්ට වේ ද නැද්ද යන සැකයක් ද තිබේ. ක්‍රියාව අවසාන වන තැනට කියන්නේ ඵලාගම කියා ය.

**කල්පනා ලෝකය** - එදිරිවීර සරච්චන්ද්‍ර

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි

**නිපුණතා මට්ටම** : 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල :**

- ළමා නාට්‍ය රචනය සඳහා සුදුසු තේමා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නාට්‍යෝචිත අවස්ථා පැහැදිලි කරයි.
- චරිත, අවස්ථා හා සිද්ධි උචිත පරිදි යොදා ගැනීමෙන් නාට්‍යය රසය ජනිත වන බව පැහැදිලි කරයි.
- ළමා නාට්‍ය සඳහා ගැළපෙන තේමා පදනම් කර ගෙන නිර්මාණාත්මක ව නාට්‍ය පෙළ රචනා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශිෂ්‍යයන් උගත් නාට්‍යයක් පිළිබඳ ව සිහිපත් කරමින් නාට්‍යය යන සාහිත්‍යාංගය සාකච්ඡාවට බඳුන් කරන්න.
- නාට්‍යයක් සඳහා පාදක කර ගෙන ඇති අත්දැකීම් හෝ තේමා පිළිබඳ සාකච්ඡා කරන්න.
- ජාතක කතා, ජනකතා, නිර්මාණාත්මක වෙනත් කතා පාදක කර ගෙන නාට්‍ය නිර්මාණය කළ හැකි බව පැහැදිලි කර දෙන්න.
- නාට්‍ය පිටපතක් රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු කෙරෙහි ශිෂ්‍යයන් තුළ අවධි බවක් ජනිත කරවන්න. (ඇමුණුම යොදා ගන්න)
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර තමන් කැමති තේමාවක් හෝ අත්දැකීමක් පදනම් කර ගෙන පිටපත් රචනය සඳහා යොමු කරන්න.
- ශිෂ්‍යයන්ගේ නිර්මාණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- **කල්පනා ලෝකය** - එදිරිවීර සරච්චන්ද්‍ර
- **නරි බෑනා** - දයානන්ද ගුණවර්ධන
- **තොප්පි වෙළෙන්දා** - සෝමලතා සුබසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාට්‍ය පිටපත් රචනා කිරීම සඳහා උචිත තේමා හා කතාන්දර ඉදිරිපත් කරයි.
- නාට්‍යෝචිත අවස්ථා පැහැදිලි කරයි.
- පිටපත් රචනය සඳහා උචිත බස් වහරක් භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- නාට්‍ය පිටපත් රචනයෙහි යෙදෙයි.

ඇමුණුම

**නාට්‍ය පිටපතක් රචනා කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු :**

- කතාවක්/තේමාවක්/අත්දැකීමක් තෝරා ගැනීම
- එහි නාට්‍යෝචිත අවස්ථා පමණක් වෙන් කර ගැනීම
- අවශ්‍ය චරිත නිගමනය කිරීම
- දෙබස් ලිවීම ආරම්භ කිරීම
- රඟ දැක්වීමට උචිත ලෙස ඒවා ගොඩ නැගීම
- දෙබස් ලිවීමේ දී පිටපතෙහි වම් කෙළවරේ චරිතවල නම් ලියා දෙතිත (:) යෙදීම
- කතාවට අනුව වඩාත් දීර්ඝ නො වන සේ දෙබස් ඇතුළත් කිරීම
- වචන උච්චාරණය කිරීම, හඬ උස් පහත් කිරීම, ආත්ම භාෂණ හා විරාමය ආදි රංග විධාන පෙළෙහි ඇතුළත් කිරීම